KPL

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT
# 2023

## බුද්ධිමත් ගොවිතැන
## ஸ்மார்ட் விவசாயம்
## SMART FARMING



සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
வரையறுக்கப்பட்ட குருநாகல் பெருந்தோட்ட கம்பனி
Kurunegala Plantations Limited

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය
அரச பெருந்தோட்ட நிறுவன சீர்திருத்தங்களுக்கான அமைச்சரவை அல்லாத அமைச
Non-Cabinet Ministry of State Plantation Enterprise Reforms

# සුහුරු ගොවිතැන:
# කෘෂිකර්මාන්තයේ අනාගතය

ස්මාර්ට් ගොවිතැන යනු අවශ්‍ය මිනිස් ශ්‍රමය ප්‍රශස්තකරණය කරන අතරම නිෂ්පාදනවල ප්‍රමාණය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ භාවිත කරමින් ගොවිපොළ කළමනාකරණය කිරීමයි.

වර්තමාන ගොවීන් සඳහා පවතින තාක්ෂණයන් අතර;

| | |
|---|---|
| **සංවේදක** | : පස, ජලය, ආලෝකය, ආර්ද්‍රතාවය, උෂ්ණත්ව කළමනාකරණය |
| **මෘදුකාංග** | : විශේෂිත ගොවිපල වර්ග හෝ යෙදුම් වේදිකා ඉලක්ක කරන විශේෂිත මෘදුකාංග විසඳුම් |
| **සම්බන්ධතාවය** | : සෙලියුලර් |
| **ස්ථානය** | : GPS, චන්ද්‍රිකා |
| **රොබෝ තාක්ෂණය** | : ස්වයංක්‍රීය ට්‍රැක්ටර්, සැකසුම් පහසුකම් |
| **දත්ත විශ්ලේෂණ** | : ස්වාධීන විශ්ලේෂණ විසඳුම්, පහළට විසඳුම් සඳහා දත්ත නල මාර්ග |




එවැනි මෙවලම් වලින් සන්නද්ධව, ගොවීන්ට ක්ෂේත්‍ර තත්ත්වයන් නිරීක්ෂණය කළ හැකි අතර, ක්ෂේත්‍රයට පය තැබීමට පවා අවශ්‍ය නොවී මුළු ගොවිපලම හෝ තනි පැලයක් සඳහා උපාය මාර්ගික තීරණ ගත හැකිය.

ස්මාර්ට් ගොවිතැනේ ගාමක බලවේගය වන්නේ  ගොවිතැන් ක්‍රියාවලීන් දත්ත මත පදනම් වූ සහ ස්වයංක්‍රීය කිරීමට ගොවිපලවල සමෝධානය කර ඇති යන්ත්‍ර සහ සංවේදක සම්බන්ධ කිරීමයි.



# අන්තර්ගතය


අප ගැන 03
අපගේ දැක්ම, මෙහෙවර හා මූලික සාරධර්ම 04
ජයග්‍රහණයන් 05
සන්ධිස්ථාන 06
සභාපතිතුමියගේ පණිවුඩය 08
ප්‍රධාන විධායක නිලධාරිගේ පණිවුඩය 11
අධ්‍යක්ෂ මණ්ඩලය 14
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 17
පළාත් වතු අධිකාරිවරු 18

**කළමනාකරණ සංවාදය හා විශ්ලේෂණය**
තිරසාරත්ව වාර්තාව 19
අවදානම් කළමනාකරණය 22
ආයතනික පාලන ප්‍රකාශය 25
විගණන කමිටු වාර්තාව 27

**මූල්‍ය ප්‍රකාශන**
අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව 29
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය 34
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව 35
විස්තීරණ ආදායම් ප්‍රකාශය 39
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 40
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 41
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 42
ගිණුම්කරන ප්‍රතිපත්ති 43
මූල්‍ය ප්‍රකාශන සටහන් 58

**ඇමුණුම්**
වාර්ෂික මහ සභා රැස්වීම් නිවේදනය 82
පෙරකලාසි පත්‍රය 83

ආයතනික තොරතුරු 84

# අප ගැන

1992 පිහිටුවන ලද පූර්ණ රාජ්‍ය හිමිකම යටතේ ඇති සමාගමක් වන සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත. සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව ජනතා වතු සංවර්ධන මණ්ඩලය මගින් එවකට පාලනය වූ වතු සමූහයක කර්තව්‍ය භාර ගෙන ව්‍යාපාර කටයුතු කරගෙනයාම සඳහා පිහිටුවන ලදී. සමාගමේ පූර්ණ කොටස් වල හිමිකාරත්වය ස්වර්ණමය කොටස්කරු වන මහා භාණ්ඩාගාරය විසින් දරනු ලැබේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල යන ස්ථානයේ පිහිටා ඇත.

ආරම්භයේ සිටම පෞද්ගලික කළමනාකරණය යටතේ වසර 13 කට ආසන්න කාලයක් ක්‍රියාත්මක වූ සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පෞද්ගලික කළමනාකරණයේ පැවති දුර්වලතා තුළ 2005 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එහි කළමනාකාරිත්වය රාජ්‍ය අංශයට යටතට පවරා ගෙන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණයට යටත් කෙරිණි. විවිධ අමාත්‍යාංශ යටතේ පැවති සමාගම 2015 සැප්තැම්බර් 01 දින සිට රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අතර එම අමාත්‍යාංශයෙන් පසුව 2015 සැප්තැම්බර් 01 වන දින සිට රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්ව එය පසුකාලීනව රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය බවට පරිවර්තනය විය.

2020 අගෝස්තු 09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් වූ අතර, 2020 ඔක්තෝබර් 06 වන දින සිට පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කර්මාන්ත නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ මූලික ව්‍යාපාරික අරමුණු වන පොල්, රබර් සහ වෙනත් අතුරුභෝග වගා කිරීම, නිෂ්පාදනය කිරීම, සැකසීම හා අලෙවි කිරීම නොවෙනස්ව අඛණ්ඩව ඒ ආකාරයෙන්ම පළාත් වතු 7 ක් පුරා හෙක්ටයාර් 4971.12 ක ක්‍රියාත්මක වේ. කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක තුනෙහි විවිධ කාලගුණික කලාප පුරා විහිදෙමින් පවතී. එක් එක් වත්ත අංශ නමින් හඳුන්වනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 2 ක් හෝ 3 ක් පුරා විහිදෙන කුඩා කොටස් වලට වැඩිදුරටත් බෙදා වෙන් කර ඇත.

සමාගම සේවකයන් 1100 කට වැඩි සංඛ්‍යාවකට සෘජු රැකියා අවස්ථා සළසා ඇති අතර, තවත් බොහෝ පිරිසකගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා වක්‍රව දායක වී ඇත.

## අපගේ දැක්ම

ගිණිකොන දිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි සහ කෘෂි ව්‍යාපාර කළමනාකාරිත්ව සමාගම බවට පත්වීම

## අපගේ මෙහෙවර

ස්වාභාවික, භෞතික සහ මානව සම්පත් සමාජ වගකීමකින් යුතුව උකහා ගෙන වැවිලි සහ අනෙකුත් කෘෂි ව්‍යාපාර ඵලදායි ලෙසත් ලාභදායී තිරසාර ලෙසත් කළමනාකරණය කරමින් සියළු ප්‍රතිලාභීන්ගේ උන්නතිය උදෙසා කටයුතු කිරීම.

## මූලික සාරධර්ම

| | | |
|---|---|---|
| හොඳම සේව්‍යයා | : | ගුණාත්මකබව හා ඵලදායිත්වය වෙනුවෙන් පෙනී සිටින අවංක, සුදුසුකම්ලත් හා කැපවුනු කාර්ය මණ්ඩලයක් බිහි කිරීම. |
| ව්‍යාපාරිකත්වය | : | වටිනාකම් නැංවීම, ලාභදායිත්වය, පරිසර හිතකාමී බව සහ සාමූහික සමාජ වගකීම. |
| ගුණාත්මක ප්‍රතිපාදකයා | : | අප සිදු කරන්නා වූ සියළුම කර්තව්‍යයන්හි දී ඉහළම පාරිභෝගික තෘප්තිය සහ අඛණ්ඩ උන්නතියක් ළඟා කර ගැනීමට කටයුතු කිරීම. |
| ඵලදායීතාවය | : | යොදවන සෑම සම්පත් ඒකකයකින්ම ඉහළම ඵලදායීතාවයක් ලබා ගැනීම, බිම් ඒකකයකින් උපරිම අස්වැන්නක් ලබා ගැනීම, තිරසාර අන්දමින් භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම හා නාස්තිය අවම කිරීම. |
| ව්‍යවසායකත්වය | : | සියළු අවස්ථාවලදී පූර්ව ක්‍රියාකාරිත්වයක් තුළ නව ප්‍රවේශයන්ට යොමුවීම. |
| වටිනාකම් එකතුකිරීම | : | ව්‍යාපාරික ලෝකයේ නිරන්තරයෙන් වෙනස්වන අවශ්‍යතා සඳහා යහපත් ලෙස ප්‍රතිචාර දැක්වීම. |
| ලාභදායීබව | : | ප්‍රාථමික නිෂ්පාදන සහ අගය එකතු කළ නිෂ්පාදන සඳහා ප්‍රශස්ත විකුණුම් මිලක් ලබා ගැනීම සහ නිෂ්පාදන පිරිවැය හැකි මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කිරීම. |
| පරිසර හිතකාමිබව | : | පරිසරයට හානියක් නොවන ලෙස හෝ අවම බලපෑමක් සහිතව සම්පත් උපරිමයෙන් යොදා ගැනීම. |
| සමාජ වගකීම | : | යහපාලනයට ගරු කරමින් මහජනතාව සහ පරිසරය සුරැකීම. |

**2011**

- ජාතික තලයේ කෘෂි ව්‍යාපාරික දෙවන ස්ථානය
- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මාන මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) රන් සම්මානය

**2012**

- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මානය - සමස්ත ලංකා රන් සම්මානය
- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මාන මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) රන් සම්මානය

**2013**

- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මානය
- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මාන මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) රන් සම්මානය

**2014**

- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මානය
- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මාන මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) රන් සම්මානය -2014

**2015**

- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය මගින් පිරිනමන ජාතික ව්‍යාපාරික විශිෂ්ඨතා සම්මාන කෘෂි හා වැවිලි සඳහා වූ 2015 සම්මානය

**2016**

- ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව හොඳම ගම්මිරිස් වගාකරුට පිරිනැමෙන ජාත්‍යන්තර සම්මානය

**2017**

- ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව හොඳම ගම්මිරිස් වගාකරුට පිරිනැමෙන ජාත්‍යන්තර සම්මානය

**2018**

- ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව හොඳම ගම්මිරිස් වගාකරුට පිරිනැමෙන ජාත්‍යන්තර සම්මානය

2019

- ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව හොඳම ගම්මිරිස් වගාකරුට පිරිනැමෙන ජාත්‍යන්තර සම්මානය

2021

- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන උළෙලේ මහා පරිමාණ නිෂ්පාදක (කෘෂිකාර්මික හා වැවිලි) සඳහා ජාතික මට්ටමේ කුසලතා සම්මානය.

2022

- වයඹ පළාතේ කර්මාන්ත සේවා කාර්‍යංශය විසින් සංවිධානය කරන ලද වයඹ විජයාභිමානී සම්මාන උළෙලේදී මහා පරිමාණ කෘෂිකාර්මික අංශයේ හොඳම ව්‍යවසායකයාට පිරිනැමෙන සම්මානය



සන්ධිස්ථාන

## 1992 ජුනි 18 දින

එවකට පැවති රජයේ පුද්ගලීකරණ ප්‍රතිපත්තිය යටතේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ මණ්ඩල අංක (v) යටතේ පාලනය වූ වතු සමූහයක් ඒකාබද්ධ කොට 1987 අංක 24 දරන රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාරික ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව 1982 අංක 17 දරන සමාගම පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස කුරුණෑගල වැවිලි සමාගම ස්ථාපනය කිරීම. 2992 ජුනි 18 වන දින සිට 2004 දෙසැම්බර් 31 දින දක්වා කුරුණෑගල වැවිලි සමාගමේ කළමනාකරීත්වය පුද්ගලික අංශයේ කළමනාකරණ නියෝජිත සමාගමක් විසින් සිදුකරන ලදී.

## 2005 ජනවාරි 01 දින

2005 ජනවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ කළමනාකාරිත්වය රජයට පවරා ගැනීමට රජය තීරණය කළ අතර එය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

## 2006 ජුනි 06 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

## 2007 අප්‍රේල් 18 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය වතු කළමනාකරණ සහ සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

## 2010 ජුනි 18 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

## 2010 නොවැම්බර් 16 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

**2015 පෙබරවාරි 18 දින**

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

**2015 සැප්තැම්බර් 21 දින**

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

**2018 මැයි 01 දින**

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය ව්‍යවසාය සහ මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයට මාරු කරන ලදී.

**2018 නොවැම්බර් 09 දින**

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

**2020 අගෝස්තු 09 දින**

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

**2022 මැයි 27 දින**

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

# සභාපතිතුමියගේ පණිවිඩය



**හිතවත් පාර්ශවකරුවන් වෙත,**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙමි. සමාගමේ කාර්යසාධනය සහ තිරසාර වර්ධනයක් ඇති කිරීමට දරන උත්සාහය සම්බන්ධයෙන් සවිස්තරාත්මක අවබෝධයක් මෙම වාර්තාවෙන් ලබා දෙනු ඇතැයි උපකල්පනය කරමි.

කුරුණෑගල වැවිලි සමාගම අග්නිදිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි සහ කෘෂි ව්‍යාපාර කළමනාකරණ සමාගම බවට පත් වීමට ප්‍රයත්න දරයි. මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීමට උත්සාහ දැරීමේ දී, කුරුණෑගල වැවිලි සමාගම ස්වභාවික, භෞතික හා මානව සම්පත් ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කර ගනිමින්, තම වැවිලි සහ අනෙකුත් කෘෂි ව්‍යාපාර ඵලදායි ලෙස, ලාභදායී ලෙස සහ තිරසාර ලෙස කළමනාකරණය කිරීමට අඛණ්ඩව කටයුතු කරයි. එසේ කටයුතු කරන අතරම, කුරුණෑගල වැවිලි සමාගම එහි සියළුම පාර්ශ්වකරුවන්ට සහ සමස්තයක් වශයෙන් අප දිවයින වෙත ප්‍රතිලාභ ලබා දීම සඳහා පාරිසරික තිරසාරභාවය සහ සමාජ වගකීම පිළිබඳ මූලික මූලධර්මවලට අනුගතව කටයුතු කරයි.

**සමාලෝචිත වර්ෂය**

කුරුණෑගල වැවිලි සමාගම ප්‍රබල කාර්යසාධනයක් වාර්තා කළ අතර, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බදු ගෙවීමට පෙර සමාගමේ ලාභය රු. මිලියන 534.4 ක් විය. මනා කෘෂිකාර්මික පිළිවෙත් වෙනුවෙන් පෙනී සිටින්නන් වශයෙන් මෙම ප්‍රයත්නයන් සියල්ලම ඉලක්ක කර ඇත්තේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වන අතර එමඟින් අවසානයේ දී මෙහෙයුම් විශිෂ්ටත්වය කරා ළඟා විය හැකි වනු ඇත.

2023 වසරේදී කුරුණෑගල වැවිලි සමාගමේ ශුද්ධ විකුණුම් සාමාන්‍ය 16.7% ක් ලෙස වාර්තා වූ අතර ඊට සාපේක්ෂව 2023 වසරේ සමාගමේ පොල් නිෂ්පාදනය ජාතික මට්ටමට අනුව 3.6% ක අඩුවීමකි. (CBSL - 2023) පොල් වගා ප්‍රදේශ වල පැවති අහිතකර කාලගුණික තත්වය සහ පොහොර යෙදීමේ අඩුකම මෙන්ම සුදු මැස්සා නම් වන කෘමි විශේෂයේ බලපෑම ද මෙසේ සමාගමේ පොල් නිෂ්පාදනය අඩුවීමට හේතු ලෙස දැක්විය හැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස මුළු පොල් නිෂ්පාදනයෙන් මිලියන 2.5 ක සහ පොල් නිෂ්පාදන අඩුවී ඇති අතර පෙර වසරට සාපේක්ෂව විකුණුම් රුපියල් මිලියන 63 කින් අඩු විය.

රබර් වගා කරන ප්‍රදේශවල පැවති අයහපත් කාලගුණික තත්ත්වයන්ගේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන් ජාතික රබර් නිෂ්පාදනය අඛණ්ඩව තෙවන වරටත් 2023 වර්ෂයේ දී 7.7% ක් ලෙස පහත වැටී තිබුණි. (CBSL - 2023) අත්තනගල්ල පළාත් වතුයායේ බස්නාගොඩ ජල ව්‍යාපෘතිය ඉදිකිරීමට අපේ හොඳම රබර් වගාව රජයට පවරා ගනු ලැබූ හේතුවෙන්, කුරුණෑගල වැවිලි සමාගමේ රබර් නිෂ්පාදනය පහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර රබර් නිෂ්පාදනය ඉකුත් වර්ෂයට වඩා කිලෝග්‍රෑම් 10,222 කින් පහළ ගොස් තිබුණු අතර එය 10% ක අඩුවීමක් ලෙස පෙන්නුම් කරයි.

2023 වසරේදි සමාගමේ වෙනත් ආදායම් මාර්ග ද ශක්තිමත් මට්ටමක පැවතිනි. එසේම සමාගමේ අතුරු බෝග අංශය ඉතිහාසයේ ඉහළම අගය වාර්තා කළ අතර එය සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 81ක දායකත්වයක් ලබා දෙන ලදී. එසේම පොල් ගස් විකිණීමෙන් රුපියල් මිලියන 14.49ක ආදායමක් ද රබර් ගස් විකිණීමෙන් රුපියල් මිලියන 26.68 ක ආදායමක්ද ලෙස ඵලදරණ ජෛව වත්කම් අලෙවිය තුලින් මිලියන 41 ක මුළු ආදායමක් උපයා ගැනීමට සමාගමට හැකි විය.

2023 දී පාරිභෝජ්‍ය ජෛව වත්කම් මගින් රුපියල් මිලියන 62 කට වඩා අධික තක්සේරු වාසියක් ලබා ගැනීමට හැකි විය. දැව මිල ගණන් වැඩිවීම නිසා මෙය සිදු වූ අතර එමගින් ශ්‍රී ලංකා දැව සංස්ථාවට තම දැව මිලගණන් සංශෝධනය කිරීමට හේතු පාදක විය. 2023 වසරේ දී රුපියල් මිලියන 12 කින් අතුරු බදුදීම් ගාස්තු ආදායම වැඩි කිරීමට සමාගමට හැකි වූ බව සඳහන් කිරීම වැදගත්ය. මෙයට හේතුව වූයේ අතිරේක භූමි ප්‍රමාණයක් බදු පදනම මත බාහිර වගාකරුවන්ට ලබා දීමය. ඒ යටතේ අන්නාසි, ඉඟුරු, කෝමාරිකා සහ බුලත් වැනි කෙටිකාලීන බෝග වගා කෙරිණි. මෙම පියවර දෙපාර්ශ්වයටම සතුටු විය හැකි තත්වයකි. සමාගම බලාපොරොත්තු වන අන්දමට මෙය තවත් ආදායම් ඉපයීමේ මාර්ගයක් ලෙස දැකිය හැකි වන්නේ එමගින් වගාකරු වල් පැළ මර්ධනය සඳහා වූ වගකීම දැරීම මගින් පිරිවැය අවම කරන එක්තරා ක්‍රමවේදයකි.

එසේම, 2023 වසර තුලදී කුරුණෑගල වැවිලි සමාගමට සිය විකුණුම් මධ්‍යස්ථාන ජාලය ව්‍යාප්ත කළ හැකි වූ නිසා මිලියන 20 ක ආදායමක් උපයා ගැනීමටද හැකි විය.

ඊට අමතරව විවිධ වූ භෝග වර්ග අපගේ වතුයායන් තුළ වගා කිරීම හේතු කොටගෙන ඉතාමත්ම හිතකර ක්ෂුද්‍ර ජීවී පරිසරයක් / ජෛව විවිධත්වයක් නිර්මාණය කිරීම සඳහා හේතු වී ඇත. අනෙක් අතට මෙම වැයම තුලින් වගාකරුවන්ට සැලකිය යුතු අතිරේක ආදායමක් ලබා දෙමින් රටේ දල දේශීය නිෂ්පාදනයට දායකත්වයක් ලබා දීමට අවස්ථාවක් උදා වී ඇත.

කාලගුණික වෙනස්කම්වලින් කෘෂිකාර්මික නිෂ්පාදනයන් සඳහා වන අයහපත් බලපෑම් අවම කිරීම සඳහා විවිධ උපායමාර්ගික ක්‍රමවේදයන් රැසක් අප හඳුන්වා දී ඇති අතර ජල සම්පාදන ක්‍රමයන් ඇති කිරීම සහ පාංශු තෙතමනය සංරක්ෂණය කිරීම සඳහා පොල් ලෙලි වලවල් ඇති කිරීම ඒ අතර ප්‍රධාන වේ.

**අපගේ කාර්ය මණ්ඩලය**

ගුණාත්මකභාවය, ඵලදායිතාව, ව්‍යවසායකත්වය, වටිනාකම් එකතු කිරීම, ලාභදායිත්වය, පරිසර හිතකාමීත්වය සහ ආයතනික සමාජ වගකීම් කෙරෙහි අවධානය යොමු කරන අවංක, සුදුසුකම් ලත් සහ කැපවූ ශ්‍රම බලකායක් ගොඩ නැංවිය යුතු බව අපි විශ්වාස කරමු. අපගේ කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීමේ දී, අපි දෙවැදෑරුම් ප්‍රවේශයක් අනුගමනය කර ඇත්තෙමු. පළමුවෙන්ම, අපි අපගේ සේවකයින්ට කාර්යසාධනය පදනම් කරගත් දිරි දීමනා වැනි මූල්‍ය ප්‍රතිලාභ සහ වඩා හොඳ වාසස්ථාන වැනි මූල්‍ය නොවන ප්‍රතිලාභ ද ලබා දී ඇත. වසර මුළුල්ලේ, දුර බැහැර ප්‍රදේශවල සේවයේ නියුතු සේවකයන්ට විදුලිය, ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සපයන ලද අතර ඇතැමුන්ට සූර්ය බලශක්ති පද්ධති ද සපයා ඇති අතර භූමිතෙල් සහ පොල් ද නොමිලේ ලබා දෙන ලදී. දෙවනුව, අඛණ්ඩ පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් තුළින් අපි ඔවුන් සතුව පැවති දැනුම හා කුසලතා පෝෂණය කර ඇත. පසුගිය මූල්‍ය වර්ෂය තුළ ද, අප විසින් සෑම තරාතිරමකම සේවකයන් ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී.

**ආයතනික පාලනය සහ අවදානම කළමනාකරණය කිරීම**

වැවිලි අංශයට සහ රජය සතු ව්‍යවසායන්ට අදාළ වන විශිෂ්ඨතම කර්මාන්ත පිළිවෙත්, රාජ්‍ය ප්‍රතිපත්ති සහ නීති රීති පිළිපැදීම තුළින් ආයතනික පාලනයේ සහ ව්‍යාපාරික හැසිරීම්වල ඉහළ ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අපි කැපවී සිටිමු. කෙසේ වුවද, නියාමන සීමා මගින් අප සතු මූල්‍ය ශක්තියේ සහ ධාරිතාවයේ පූර්ණ විභවය පැවතියදී පවා අපගේ කාර්යයන් ඉටු කිරීමේදී ප්‍රායෝගික දුෂ්කරතා මතු වී ඇත. අප විසින් රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ පැවති අමාත්‍යාංශ රැස්වීම් ඇතුළු අවස්ථා කිහිපයකදී මේ සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ගේ අවධානය යොමු කළ ද, මෙතෙක් මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබා දී නොමැත.

කුරුණෑගල වැවිලි සමාගම සතුව ශක්තිමත් අවදානම් කළමනාකරණ ව්‍යුහයක් ඇති අතර ඒ වෙනුවෙන් අපගේ බාහිර විගණකවරුන් වන විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ පුළුල් සම්බන්ධයක් පවත්වා ගනු ලැබේ. විගණකාධිපති විසින් වාර්ෂිකව සිදු කරනු ලබන විගණනයට අමතරව, ස්වාධීන තක්සේරුවක් සහ නිර්දේශ ලබා ගැනීම සඳහා මනාව ව්‍යුහගත වූ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් අප සතුව ඇත. අභ්‍යන්තර පාලන පද්ධති අපගේ ආයතනික පාලන සහ අනුකූලතා මාර්ගෝපදේශවලට අනුකූල බව කැපවීමෙන් කටයුතු කරන අපගේ අභ්‍යන්තර විගණන කණ්ඩායම මගින් සහතික කරයි.

මෙහෙයුම් මට්ටමේදී, අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී නිරීක්ෂකයින් ලෙස කටයුතු කරන විගණන සහ කළමනාකරණ කමිටුවක් අප සතුව ඇත. සමාලෝචිත වර්ෂයේ අපගේ කාර්යසාධනය ඇගයීමට ලක් කර විවිධ මෙහෙයුම් හරහා අවදානම අවම කර ඇත.

**සමාජ හා ජාතික දායකත්වය**

සමාජයට සහ සමස්තයක් වශයෙන් ජාතියට තම ආයතනය මගින් ලබා දෙන දායකත්වය උපරිම කිරීමට උත්සාහ කිරීමේදී, කුරුණෑගල වැවිලි සමාගම විසින් අවට ගම්වාසී ගොවීන්ට සහ කෙටිකාලීන බෝග වගා කිරීමට කැමත්තක් දක්වන වෙනත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට / පිටස්තර වගාකරුවන්ට ඉඩම් බදු දීමට ප්‍රායෝගිකව කටයුතු කර ඇත. මෙමඟින්, එක් අතකින්

වල් පැළ උදුරා දැමීම සඳහා අපට වැය වන පිරිවැය අඩු කරන අතරම, අනෙක් අතට, පිටස්තර වගාකරුවන්ට දළ දේශීය නිෂ්පාදිතයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන අතරතුර, තම නිෂ්පාදනවලින් මනා ලාභයක් ලබා ගැනීමට හැකියාව ලැබීම හේතුවෙන් අන්‍යෝන්‍යව වාසිදායක තත්ත්වයක් නිර්මාණය වී තිබේ. තවද, මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමේදී, කුරුණෑගල වැවිලි සමාගම උසස් තත්ත්ව කළමනාකරණ පිළිවෙත්වලට අනුගතව කටයුතු කළ අතර, ඉකුත් වර්ෂ කිහිපය තුළ ලැබුණු සම්මාන සහ ඇගයීම් තුළින් ඒ බව ජාතික හා ජාත්‍යන්තර මට්ටම්වලින් පිළිගැනීමට ලක්ව ඇති බව තහවුරු වේ. සමාගමේ කෘෂිකාර්මික සහ මූල්‍ය කාර්යසාධනය අපගේ මනා කළමනාකරණ පරිච සම්බන්ධයෙන් ලැබුණු වැඩිදුර සාක්ෂි වන අතර දිවයින තුළ වෘත්තීයමය වශයෙන් මනාව කළමනාකරණය කරන ලද කෘෂි ව්‍යාපාර ආයතනයක් ලෙස අපව ස්ථානගත වි ඇත. මෙමගින්, දකුණු ආසියානු සහ අග්නිදිග ආසියානු කලාපයේ ''ආදර්ශමත් වැවිලි සමාගමක්'' බවට පත්වීමේ අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීමේ අභිමතාර්ථය වෙත අපව සාර්ථකව යොමු කරවයි.

**සුබවාදී අනාගතයක් පිළිබඳ අපේක්ෂාව**

විපත්වලට ඵලදායි ලෙස මුහුණ දීමේ ස්වකීය හැකියාව පිළිබඳව අවබෝධයෙන් යුත් කුරුණෑගල වැවිලි සමාගම එහි අනාගතය දෙස විශ්වාසයෙන් සහ ශුභවාදීව බලයි. සමාගමේ ලාභදායිත්වය තවදුරටත් ඉහළ නැංවීමට ප්‍රයත්න දැරීමේ දී, කුරුණෑගල වැවිලි සමාගම සිය නිෂ්පාදන නිර්මාණය කිරීමේ සහ අලෙවි කිරීමේ අපේක්ෂාව සමඟ වටිනාකම එකතු කිරීමට හැකි සෑම මාර්ගයක්ම සොයා බලයි. මීට අමතරව, තවත් ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස පාරිසරික සංචාරක ව්‍යාපෘති ආරම්භ කිරීමට කුරුණෑගල වැවිලි සමාගම සැලසුම් කර ඇත. දීර්ඝ කාලීනව, විවිධාංගීකරණ වැඩසටහන විශාල භූමි ප්‍රදේශයක් ආවරණය වන පරිදි ව්‍යාප්ත කරමින්, තවදුරටත් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් එම මාවතේම ඉදිරියට ගමන් කිරීමට කුරුණෑගල වැවිලි සමාගම තීරණය කර ඇත. එසේ කරන අතරතුර, ඉහත සාකච්ඡා කර ඇති බාධක මැඩ පැවැත්වීමේ මාර්ගයක් වශයෙන් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආරම්භ කිරීමේ හැකියාව සොයා බැලීමට කුරුණෑගල වැවිලි සමාගම අපේක්ෂා කරයි.

**ඇගයීම**

රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා වෙත මාගේ හෘදයාංගම කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

අප වෙත ලබා දුන් පූර්ණ සහයෝගය සහ සහයෝගීතාව වෙනුවෙන් රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය එම්.එම්.එස්.එස්.බී. යාලේගම මහතාටත්, රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඒ.යූ.කේ. දොඩංවල මහත්මියටත්, අනෙකුත් නිලධාරීන්ටත් මාගේ කෘතඥතාව පළ කරමි.

අධ්‍යක්ෂ මණ්ඩලයට සම්බන්ධ සියළුම කටයුතු සඳහා උද්‍යෝගයෙන් සහභාගී වීම වෙනුවෙන් සහ ඔවුන් සෑම විටම මා වෙත ලබා දුන් නොමසුරු සහයෝගය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත මගේ අවංක ස්තුතිය පිරිනමමි.

එසේම කළමනාකරණ කණ්ඩායම සහ සියළුම සේවකයින්ගේ සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම ඉදිරි වර්ෂවලදී ද මා අපේක්ෂා කරන සුවිශේෂී කැපවීම වෙනුවෙන් ඔවුන්ට ස්තුති කිරීමට මම කැමැත්තෙමි. අවසාන වශයෙන්, අප සමාගම කෙරෙහි විශ්වාසය තැබූ, සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සියළු පාර්ශවකරුවන්ට ස්තුති කරමි. ඉදිරි වසරවලදී ද, ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය සහ අනුග්‍රහය මම අපේක්ෂා කරමි.



**කේ.ජී.ජී.එෆ්. ජෙනට් ජයවර්ධන (නීතිඥ)**

සභාපතිනිය

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය



සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන්, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව සතුටට පත් වෙමි. තවත් ඵලදායී වසරක් අවසන් කර ඇති බව වාර්තා කිරීමට ලැබීම පිළිබඳව ද මම සතුටු වෙමි. අපගේ නිරවද්‍ය කෘෂිකාර්මික ක්‍රමෝපාය තුළින් සහ අපගේ වැවිලි නිසි පරිදි කළමනාකරණය කිරීම තුළින් අතිවිශිෂ්ට සාර්ථකත්වයක් ළඟා කර ගැනීමට සමාගම සමත් විය. එහෙත්, අවාසනාවකට මෙන්, ආර්ථිකමය වශයෙන් ඇති වූ අර්බුදකාරී තත්වයන්, ස්වාභාවික විපත්, දේශපාලනික ආතතීන් සහ ගැඹුරු දේශපාලන අවිනිශ්චිතභාවය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දුෂ්කරතාවලට මුහුණ දීමට අපට සිදු විය.

මෙම වසර කුරුණෑගල වැවිලි සමාගමට, පොහොර, පළිබෝධනාශක, ඉන්ධන යනාදී වැදගත් යෙදවුම් සීමිත වූ සහ පෙර නොවූ විරූ උද්ධමනයක් සමඟ ඉහළ නිෂ්පාදන පිරිවැයක් සහිතව ගෙවුණු, වාර්තාගත වූ වඩාත්ම අභියෝගාත්මක වසරවලින් එකක් විය.

ඉහත සඳහන් කළ බාධක මධ්‍යයේ වුවද, 2023 වර්ෂය කුරුණෑගල වැවිලි සමාගමට බොහෝ සන්ධිස්ථානවලට ළඟා වීමට හැකියාව ලබුණු සාර්ථක වර්ෂයක් විය. මෙමඟින් සේවකයින්ගේ සදාචාරාත්මක මූලධර්ම සහ සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ තත්ත්වය පහත වැටීමකින් තොරව ආරක්ෂා කිරීමට අපගේ කැමැත්ත සහ ධෛර්යය තවදුරටත් ඉහළ නංවා ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විවිධාංගීකරණය වූ පොල් නිෂ්පාදන වගාව බවට පත්වීමේ අපගේ අරමුණ කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. මෙම අවස්ථාවේදී සැලකිය යුතු සන්ධිස්ථාන කරා ළඟා වීමට අපට හැකි විය. ශ්‍රී ලංකා රුපියල් මිලියන 500 ක බදු පෙර ලාභයක් (PBT) පසුකරමින්, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ ඉතිහාසයේ පළමු වතාවට ශ්‍රී ලංකා රුපියල් මිලියන 1000 ක පිරිවැටුම ඉක්මවා යාමට අපට හැකි විය.

### පොල් අංශය

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළදී පොල් ගෙඩි මිලියන 12.9 ක් අස්වැන්න වශයෙන් නෙළා ගෙන ඇති අතර එය සියයට 16 ක අඩුවීමක් වේ. පොල් අස්වැන්න අඩුවීමට සමාගම මුහුණ පෑ ප්‍රධානතම බාධකය වූයේ පොහොර, කෘෂි රසායන සහ මූලික පහසුකම් නොමැතිකමයි.

එසේම පොල් අස්වැන්න උච්චාවචනය වීමට ප්‍රධාන හේතුව වන තෙත්, වියළි සහ අතරමැදි කෘෂි දේශගුණික කලාපයේ පිහිටි සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ වතුවලට දේශගුණික විපර්යාස වඩාත් වැදගත් බලපෑමක් ඇති කර තිබුණි. කෙසේ වුවද බිංදු ජල සම්පාදනය, පොල් ලෙළි වැළලීම, පොකුණු නිර්මාණය කිරීම, අතුරු භෝග සහ ආවරණ භෝග වගා කිරීම වැනි යෝග්‍ය ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් අනුගමනය කිරීම මගින් නියඟය මගින් ඇති වූ අහිතකර බලපෑම් සමනය කළ හැකි විය. මීට අමතරව, කුරුණෑගල වැවිලි සමාගම විසින් යහපත් කෘෂිකාර්මික සහ ක්ෂේත්‍ර කළමනාකරණ පිළිවෙත් පවත්වා ගෙන තිබූ අතර, පසුගිය වර්ෂ කිහිපය තුළ එමඟින් අනර්ඝ ප්‍රතිලාභ ලැබී ඇත. යටි වගාව මගින් සහ පාළු පිරවීම මගින් ද කැපී පෙනෙන ප්‍රතිඵල ලැබී ඇත.

### රබර් අංශය

2023 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ජාතික රබර් නිෂ්පාදනය සියයට 7.7 කින් අඛණ්ඩව අඩු විය. කුරුණෑගල වැවිලි සමාගමේ රබර් වගා ප්‍රදේශවල දිලීර රෝග ව්‍යාප්තියත්

සමඟ රබර් ක්ෂීර අස්වනු නෙලා ගන්නා දිනවලදී නිරන්තරයෙන් ඇති වූ වර්ෂාපතනය හේතුවෙන් නිෂ්පාදනය කරන ලද මුළු රබර් ප්‍රමාණය පසුගිය වසරට සාපේක්ෂව 11% දක්වා අඩු වී ඇත.

**වෙනත් බෝග**

2005 වර්ෂයේ සිට, කුරුණෑගල වැවිලි සමාගම විසින් අතුරු බෝග වගා කිරීම මගින් බෝග විවිධාංගීකරණය සාර්ථකව සිදු කර ඇති අතර 2005 වර්ෂයේ දී, හෙක්ටයාර 59.28 ක අතුරු බෝග වගා කර ඇති අතර 2023 වර්ෂය වන විට අතුරු බෝග වගාව හෙක්ටයාර 920 දක්වා ඉහළ නංවා ඇත. කුරුණෑගල වියළි කලාපීය වතුවල කජු, කුරුඳු, ඩ්‍රැගන් ෆෘට්, අඹ සහ පේර වගා කර ඇති අතර ගම්පහ තෙත් කලාපයේ රඹුටන් සහ දූරියන් සාර්ථකව වගා කර ඇත. කුරුණෑගල වැවිලි සමාගම අතුරු බෝග වගා කිරීම මගින් රු. මිලියන 81 ක ආදායමක් උපයා ගන්නා ලදී.

**කෘෂිකාර්මික නොවන සංවර්ධන ව්‍යාපෘති**

2023 වසර තුලදී කුරුණෑගල වැවිලි සමාගමට සිය විකුණුම් මධ්‍යස්ථාන දහයක් ස්ථාපිත කළ හැකි වූ අතර එමගින් සමාගමේ අගය එකතු කළ නිෂ්පාදිතයන් අලෙවි කිරීමට මෙන්ම බලයලත් වෙළඳ ආයතන 45 ක පමණ ප්‍රමාණයක් සමඟ සමීපව කටයුතු කිරීමටද හැකියාවක් ඇති විය. එසේම, දේශීය මෙන්ම විදේශීය සංචාරකයන්ගේ ආකර්ශනය දිනා ගැනීමට සමත් වන පරිදි පොල් ආශ්‍රිත පාරිසරික සංචාරක ව්‍යාපෘතියක් ලෙස ජාතික පොල් තාක්ෂණ උද්‍යානයක් නාරම්මල පළාත් වතු කාර්යාලයට අයත් ඔලියදෙණිය වත්තේ ස්ථාපිත කර ඇත.

**ක්‍රමෝපාය සහ සම්පත් වෙන් කිරීම**

අපගේ ඉදිරි ගමනේදී, පොල් වගා කර ඇති ඉඩම් ප්‍රමාණයට සාපේක්ෂව, අස්වැන්න උපරිම කර ගනිමින් පොල් වගා සම ව්‍යාපාරය පවත්වා ගෙන යාම ද, ද්විතියික වර්ධන උපාය මාර්ගයක් වශයෙන්, උපරිම භූමි ඵලදායිතාව ලබා ගැනීම සඳහා විභව අතුරු බෝග වගාව තවදුරටත් සංවර්ධනය කිරීම ද, තෙවනුව පොල් සඳහා ද, කිතුල්, කොස් වැනි අඩුවෙන් උපයෝජනය කරනු ලබන අතුරු බෝග සඳහා ද වටිනාකමක් එක් කිරීම සහ අවසාන සහ සිව් වන ඉදිරි වර්ධන උපායමාර්ගය වශයෙන් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වෙළෙඳපොළ ජාලය දියුණු කිරීම යන ප්‍රධාන ක්‍රමෝපායන් සතර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අපගේ අරමුණ වේ.

2023 වර්ෂයේ දී සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අගය එකතු කළ නිෂ්පාදන එකතුව සඳහා පොල් අයිස්ක්‍රීම් හඳුන්වා දෙන ලදී. ඒ සඳහා පාරිභෝගික ආකර්ෂණය මැනවින් සනාථ වී ඇත. නුදුරු අනාගතයේ දී, දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළට සරිලන පරිදි නවීන පොල් අයිස්ක්‍රීම් කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කිරීමට සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අභිප්‍රාය වේ. දිගු කාලීනව වර්ධන වේගය පවත්වා ගැනීම සඳහා විවිධ විකල්ප සලකා බලන අතරම, අප විසින් අපගේ අගය දාමය ඇගයීමට ලක් කරන ලද අතර එක් එක් ව්‍යාපාර කාණ්ඩය තුළ අපගේ තරඟකාරී තත්ත්වය විශ්ලේෂණය කරන ලදී.

අපි අපගේ උපායමාර්ගික අරමුණු සමඟ සමපාත වන මූල්‍ය හා මානව සම්පත් කෙටි කාලීනව සහ මධ්‍ය කාලීනව වෙන් කරන්නෙමු. අපගේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සහ නව කුසලතා අත්පත් කර ගැනීම අපගේ වර්ධන සැලසුම්වලට සහාය වීම සඳහා ප්‍රමුඛ අවශ්‍යතාවක් වනු ඇත. අපගේ කණ්ඩායමේ තාක්ෂණික හුවමාරුව සහ පුහුණුව සඳහා අපි බොහෝ දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරන්නෙමු. නිෂ්පාදන වත්කම් වැඩිදියුණු කිරීම සඳහා අපගේ ප්‍රාග්ධන වියදම් අයවැය සැකසීම සහ අපගේ වතුවල ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අඛණ්ඩව සිදු කෙරේ.

**පාලනය සහ භාරකාරත්වය**

සියළුම පාර්ශවකරුවන් සඳහා අපගේ කැපවීමේ කොටසක් ලෙස, උත්කර්ෂවත් ආයතනික පාලනය තිරසාර සංවිධානයක් සංවර්ධනය කිරීමේ මූලික අවශ්‍යතාව බව අපි විශ්වාස කරමු. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාලන ක්‍රියාවලිවල උසස් ප්‍රමිති පවත්වා ගැනීමට අපි ස්ථිරව කැපවී සිටිමු. කර්මාන්තය නිරන්තරයෙන් මුහුණ දෙන අසංඛ්‍යාත ගැටළු මඟහරවා ගැනීමට සමාගමට ඉඩ සලසමින් අවදානම් තක්සේරු කිරීමට සහ කළමනාකරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකාරීත්වය සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කරන බව අවධාරණය කරමි.

**අනාගත දැක්ම**

තිරසාර වැවිලි සංවර්ධනය පිළිබඳ අපගේ දීර්ඝකාලීන අරමුණ සමඟ අපි අපගේ සංවර්ධන හා විවිධාංගීකරණ වැඩසටහන තුළින් ඉදිරියට ගමන් කරන්නෙමු. ක්‍රමෝපායික මට්ටමින්, අපගේ දිගුකාලීන අවධානය යොමු වී ඇත්තේ අපගේ ප්‍රධාන වැවිලි ව්‍යාපාරය දියුණු කිරීම සහ ඒකාබද්ධ කිරීම කෙරෙහි වන අතරම විවිධාංගීකරණය මත පදනම් වූ වර්ධනයක් ද අපි අපේක්ෂා කරමු. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගම සිය දිගුකාලීන ශක්‍යතාව සහතික කරමින්, හුදෙක් ප්‍රාථමික නිෂ්පාදකයෙකුගේ සිට අගය එකතු කළ නිෂ්පාදන සමාගමක් දක්වා සංක්‍රමණය වීමට අදාළව විවිධ බෝග වටිනාකම් නිර්මාණය කිරීම සඳහා ප්‍රයත්න දරනු ඇත.

යහපත් කාලයක් අනාගතයේ උදා වනු ඇතැයි මම සුබවාදීව සිතමි. ආර්ථික අර්බුදය මධ්‍යයේ ප්‍රකෘතිමත්

වීම මන්දගාමීව පවතින බවක් පැවතියද, අගය එකතු කළ නිෂ්පාදනවල උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වෙළඳපල ප්‍රසාරණය පිළිබඳව අප අවධානයෙන් සිටිය යුතුය. පසුගිය වසර හත තුළ අප මුහුණ දුන් දුෂ්කරතාවල නිමාවක් සනිටුහන් කරමින්, රබර් කර්මාන්තය ද 2024 වර්ෂයේ දී නැවතත් සාමාන්‍ය තත්ත්වයට පත් වන බව මම විශ්වාස කරමි.

ව්‍යාපාරයේ සියළුම පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම් උත්පාදනය කිරීම සඳහා නැගී එන අවස්ථා ප්‍රශස්තකරණය කරමින් දීර්ඝකාලීන සාර්ථකත්වයක් ලබා ගැනීම සඳහා අපගේ ව්‍යාපාරික අංශ දෙකම නිත්‍ය වශයෙන්ම විශිෂ්ට මට්ටමින් ස්ථානගත කර ඇති බව සහතික කිරීමට අපි සම්පූර්ණයෙන්ම කැපවී සිටින්නේ එබැවිනි. යහපත් කාලයක් අනාගතයේ උදා වනු ඇතැයි මම විශ්වාස කරමි. Covd-19 වසංගතයේ ප්‍රතිඵලයක් වශයෙන් යථා තත්ත්වයට පත්වීමට අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත වන බවක් නිරීක්ෂණය වුවද, අපගේ පොල් වගාවෙන් දීර්ඝකාලීන ප්‍රතිලාභ ලබා ගැනීම සදහා අප තිරසාරව කටයුතු කළ යුතුය. 2024 වසරේ රබර් ක්ෂේත්‍රය ද පසුගිය වසර අට තුළ මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා නිමාවට පත් කරමින් යථා තත්ත්වයට පත් වනු ඇතැයි මම සුබවාදීව අපේක්ෂා කරමි. පොල් වගාව යටතේ අතුරු භෝග වගාව සිදු කිරීම මගින් සෑම විටම සැලකිය යුතු ලාභයක් ලැබිය හැකිය. සමාගමේ සියළුම පාර්ශවකරුවන් සඳහා වටිනාකම් උත්පාදනය කිරීමට නැගී එන අවස්ථා උපයෝගී කර ගනිමින් දිගුකාලීන සාර්ථකත්වයක් ලබා ගැනීමට හැකි වන පරිදි අපගේ ව්‍යාපාරික අංශ ත්‍රිත්වය සැමවිටම මනාව ස්ථානගත කර ඇති බව සහතික කිරීමට අනාගතයේදී අපි සම්පූර්ණයෙන්ම කැපවී සිටින්නේ එබැවිනි. ඊට සමගාමීව, වසර ගණනාවක් පුරා අපගේ සාර්ථකත්වයට හේතු වූ මූලික පරමාදර්ශ ඉහළ නැංවීමට අපි කටයුතු කරන්නෙමු. පහත දක්වා ඇති පරිදි, වටිනාකම් උත්පාදනයේ දී පෙරටුගාමීව කටයුතු කිරීම යනු කාර්යක්ෂමතාව සහ අඛණ්ඩ නවෝත්පාදනය කෙරෙහි ස්ථාවර අවධානයක් පවත්වා ගැනීමයි.

"විශ්වයේ ඇති සියළුම ශක්තිය එකම වේලාවක දී සෑම ස්ථානයකම ඒකාකාරව පවතී. අපට ශක්තිය ලැබෙන්නේ නැත, අපි ශක්තිය මුදා හරිමු. ශක්තිය මුදා හැරීමේ ප්‍රේරක යාන්ත්‍රණය වන්නේ යමක් කිරීමට ඇති ආශාවයි, ඔබට එය කිරීමට ශක්තිය ලැබෙනු ඇත" - බොප් ප්‍රොක්ටර්.

**තුති පිදීම**

වසර තුළ සුවිශේෂී ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අප වෙත දිරිගැන්වීම් ලබා දෙමින් උපකාර කරන ලද රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා වෙත මාගේ හෘදයාංගම කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

අප වෙත ලබා දුන් පූර්ණ සහයෝගය සහ සහයෝගීතාව වෙනුවෙන් රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය එම්.එම්.එස්.එස්.බී. යාලේගම මහතාටත්, රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඒ.යූ.කේ. දොඩංවල මහත්මිය ඇතුළු අනෙකුත් අමාත්‍යාංශ නිලධාරීන් වෙත මාගේ කෘතඥතාවය පුද කිරීමට කැමැත්තෙමි.

තවද, මෙම සමාගමේ සාර්ථකත්වය වෙනුවෙන් වැදගත් අදහස්, උපදෙස් සහ තොරතුරු ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සෙසු සාමාජිකයින් සහ අපව නිරන්තරයෙන් මෙහෙයවමින්, දිරිගැන්වීම් සහ සහයෝගය ලබා දුන් අපගේ සභාපතිතුමිය වන කේ.ජී.ජී.එෆ්. ජෙනට් ජයවර්ධන මහත්මියට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

අවසාන වශයෙන්, වසර පුරා සමාගමේ සාර්ථකත්වය වෙනුවෙන් ලබා දුන් දායකත්වය වෙනුවෙන් මම කුරුණෑගල වැවිලි සමාගමේ ලේකම්වරුන් වන සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට සහ අපගේ අනෙකුත් සියළුම පාර්ශවකරුවන්ට ස්තුතිවන්ත වෙමි.

මීට අමතරව, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමට මෙම විශිෂ්ට ජයග්‍රහණ අත්කර ගැනීමට හැකියාව ලබා දුන් සහ කාර්යක්ෂම කටයුතු කළ අපගේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම, පළාත් භාර වතු අධිකාරීවරුන් සහ සියළුම කාර්ය මණ්ඩලය අප ආයතනය වෙත දැක් වූ ඉමහත් ළැදියාව, කැපවීම සහ පක්ෂපාතිත්වය වෙනුවෙන් මගේ කෘතඥතාව පළ කරමි.

**ආචාර්ය එස්.එම්.එම්. සමරකෝන්**
ප්‍රධාන විධායක නිලධාරි



**කේ.ජී.ජී.එෆ්. ජෙනට් ජයවර්ධන මහත්මිය**
සභාපතිනිය



**ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර මහතා**
අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත

කේ.ජී.ජී.එෆ්. ජෙනට් ජයවර්ධන මහත්මිය 2022 ඔක්තෝබර් 06 වැනි දින කුරුණෑගල වැවිලි සමාගමේ සභාපතිනිය වශයෙන් පත් කරන ලදී. ඇය 1998 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධිය සම්පූර්ණ කර කුරුණෑගල දිසා අධිකරණයේ නීතිඥවරියක වශයෙන් සේවය කළාය.

ඇය 2019 වර්ෂයේ සිට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වශයෙන් කටයුතු කළ අතර පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සභාපතිනිය ලෙස ද කටයුතු කරන ලදී.

ජයවර්ධන මහත්මිය වයඹ පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති උපදේශක (2004-2013) වශයෙන් ද, ඒෂියන් ෆිනෑන්ස් හි නීති උපදේශක වශයෙන් ද කටයුතු කළාය.

ජෙනට් ජයවර්ධන මහත්මිය හිටපු අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මහතාගේ සම්බන්ධීකරණ ලේකම් වශයෙන් ද කටයුතු කළාය.

ජෙනට් ජයවර්ධන මහත්මිය 2003 වසරේ ජපාන නීතිඥ සංගමය - ලෝ ඒෂියා සම්මේලනය සහ 2005 වර්ෂයේ දී මුදල් විශුද්ධිකරණ පනත සඳහා වූ ජාත්‍යන්තර නීතිඥ සංගමය වැනි ජාත්‍යන්තර සංසද රැසකදී රට නියෝජනය කළාය.

2022 මාර්තු 02 දින සිට බලපැවැත්වෙන පරිදි සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ / භාණ්ඩාගාර නියෝජිතයෙකු ලෙස පත් කර ඇති විජේබණ්ඩාර මහතා මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු ද වේ.

ඒ මහතා 2005 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණ (ගණකාධිකාරී) විශේෂ උපාධියක් ලබා ඇති අතර 2020 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ දී වාණිජ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද සම්පූර්ණ කර ඇත. තවද, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA) අතරමැදි මට්ටම සම්පූර්ණ කර ඇත.

විජේබණ්ඩාර මහතා 2008 සිට 2015 දක්වා මැදිරිගිරිය, හිඟුරක්ගොඩ සහ ඇළහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගණකාධිකාරීවරයෙකු ලෙස තම වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලදී. 2016 වසරේ සිට ඔහු මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (විශේෂ විගණන සහ විමර්ශන) ලෙස කටයුතු කළ අතර 2019 වර්ෂයේ සිට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පද්ධති විගණන) ලෙස කටයුතු කරයි.

විජේබණ්ඩාර මහතා 2012 - 2013 වර්ෂවල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව (DIPPCA) හදාරා ඇති අතර ඔහු 2017 වර්ෂයේ දී රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන (CPPP) සහ 2018 වසරේ දී, මූල්‍ය අධ්‍යයනය පිළිබඳ මයිලෝඩා ඇකඩමියේ වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව සම්පූර්ණ කරන ලදී. තවද, ඔහු 2019 වර්ෂයේ සිට තොරතුරු තාක්ෂණ විගණනය පිළිබඳ විවිධ දේශීය හා විදේශීය පාඨමාලා සම්පූර්ණ කර ඇත.



**අමිතා දොඩන්වල මහත්මිය**
අධ්‍යක්ෂ

අමිතා දොඩන්වල මහත්මිය රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය නියෝජනය කරමින් 2024 අප්‍රේල් මාසයේ සිට සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස කටයුතු කරයි.



**ඩබ්ලිව්.ජේ.ජී.ඩී. විජේසිංහ මහතා**
අධ්‍යක්ෂ

විජේසිංහ මහතා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස 2020 ජනවාරි 15 දින සිට කටයුතු කර ඇත. තොරතුරු තාක්ෂණ කර්මාන්තය පිළිබඳ හසල දැනුමක් ඇති ඒ මහතා ව්‍යවසායකයෙකු වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පුළුල් අත්දැකීම් ලබා ඇත.

කුරුණෑගල මලියදේව විදුහලේ සිප්සතර ලබමින් උසස් පෙළ විභාගය සඳහා 2002 වසරේ දී පෙනී සිට ඇත. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ දී තොරතුරු තාක්ෂණ උපාධිය සාර්ථකව සම්පූර්ණ කර ඇති ඒ මහතා කුරුණෑගල දේශප්‍රිය සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස දැනට කටයුතු කරයි.



**කෝසල රංගල මහතා**
අධ්‍යක්ෂ

කෝසල රංගල මහතා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස 2024 සැප්තැම්බර් මස 21 වන දින සිට කටයුතු කරයි.

මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වන කෝසල රංගල මහතා 1982 උසස් පෙළ අවසන් කළ පසු සිය වෘත්තීමය ගමන ආරම්භ කර ඇත. එහිදී ඔහුගේ නවෝත්පාදන දැක්ම සහිත නායකත්වය නිසාම ව්‍යාපාර ක්ෂේත්‍රය තුල ඔහුගේම ව්‍යාපාරයක් මල්ටි ට්‍රේඩින් (පෞද්ගලික) සමාගම නමින් ආරම්භ කළ අතර එහි කළමනාකරණ අධ්‍යක්ෂ වශයෙන්ද කටයුතු කර ඇත. රංගල මහතා මල්ටි ට්‍රේඩින් (පෞද්ගලික) සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ ලෙස උපාය මාර්ගිකව කටයුතු කරමින් ව්‍යාපාර කළමනාකරණය සහ එහි නිපුනත්වය පැහැදිලිව ඔප්පු කරමින් සහ නායකත්වය මනාව හසුරවමින් සිය ව්‍යාපාරය උසස් මට්ටමකට ගෙන ඒමට සාර්ථකව කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ක්ෂේත්‍රයේ අවුරුදු 30 කට වඩා වැඩි කලක පටන් අත්දැකීම් බහුල පුද්ගලයෙකු වන රංගල මහතා ව්‍යාපාර ලෝකයට බලපාන උච්ඡාවචනයන් හමුවේ එකසේ නොසැලී ඔහුගේ බහුශ්‍රැතභාවය සහ ප්‍රවීණතාවය උපයෝගී කර ගනිමින් කටයුතු කළ අතර ඔහු Euro Studyverse (Pvt) Ltd. ආයතනයේ මෙහෙයුම් කළමනාකරු වශයෙන්ද සේවය කර ඇත.



**ඩී.එම්.පී. බණ්ඩාර මහතා**

අධ්‍යක්ෂ

ටී.ඩී.එම්.පී. බණ්ඩාර මහතා 2024 වර්ෂයේ මාර්තු මස 01 වන දින සිට සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.



**ඩී.සී.ජේ. ප්‍රේමතිලක මහතා**

අධ්‍යක්ෂ

ඩී.සී.ජේ. ප්‍රේමතිලක මහතා 2024 වර්ෂයේ මාර්තු මස 01 වන දින සිට සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. එතුමා තෝලන්ගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වන අතර අවුරුදු හතක් පමණ කාලසීමාවක් එම විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වශයෙන්ද කටයුතු කර ඇත.

උසස් පෙළ සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එතුමා ජාතික තරුණ සේවා කවුන්සිලයේ කෑගල්ල දිස්ත්‍රික් තරුණ සංගමයේ ප්‍රධාන ලේකම්, ප්‍රධාන සංවිධායක, ප්‍රධාන භාණ්ඩාගාරික සහ සහකාර ලේකම් යන තනතුරු හොබවා ඇත. එමෙන්ම ප්‍රේමතිලක මහතා ජාතික සම්මේලනයේ විගණන කමිටුවද නියෝජනය කල අයෙකි.

පසුව මෙතුමා රජයේ නොවන සංවිධාන (එන්.ජී.ඕ) අංශයට අවතීර්ණ වූ අතර එම රජයේ නොවන සංවිධාන (එන්.ජී.ඕ) අංශයන්හි විධායක කමිටු මෙන්ම සමගි සන්ධාන නියෝජනය කළ ලාබාලතම සාමාජිකයාද විය. එලෙසම ඔහු එම පදනම් වල මාධ්‍ය කමිටුද නියෝජනය කරමින් කටයුතු කර ඇත.

ඩී.සී.ජේ. ප්‍රේමතිලක මහතා 1996 දී කැනඩාවේ ටොරොන්ටෝ හි පැවැත්වූ ශ්‍රී ලංකා කැනඩා සංවර්ධන පදනම සහ ලෝක කැනඩා තරුණ සංවිධානය අතර පැවති තරුණ හුවමාරු වැඩසටහනට සහභාගි වූ අතර එහිදී ඔහු පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳව වූ පුහුණු වැඩමුළුවටද සහභාගි විය. අනතුරුව ප්‍රේමතිලක මහතා 1998 සිට අවුරුදු අටක පමණ කාලසීමාවක් කැනඩාවේ සේවයේ යෙදී සිට ඇත. එම කාලසීමාවේදී චින්තක ජයවිලාල් මහතා අන්තර්ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමාව සහ එසිල්ස් (Escils) ආයතනයෙන් ඩිජිටල් අලෙවිකරණ ඩිප්ලෝමාව ද හදාරා සම්පූර්ණ කර ඇත.

ප්‍රේමතිලක මහතා 2023 වර්ෂයේ ජනවාරි මස තෝලන්ගමුව සිංහ සමාජයේ සභාපති වශයෙන් කෙටිකලක් කටයුතු කළ අතර 2024 වර්ෂයේදී ඔහු තෝලන්ගමුව සිංහ සමාජයේ ප්‍රාදේශීය සභාපති වශයෙන් පත්විය.



ප්‍රධාන විධායක නිලධාරි
**ආචාර්ය එස්.එම්.එම්. සමරකෝන් මහතා**
PHD, M. Sc. (Agric.Econ.)
B. Sc. (Agriculture) Hons.



නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
**ඒ.එම්.එස්.බී. අත්තනායක මහතා**
M.Sc. Agriculture
B.Sc. Agriculture



කළමනාකරු - මූල්‍ය
**ඩී.අයි.කේ. දිසානායක මහතා**
B.B. Mgt. (Human Resource)
(Special),
CBA,



කළමනාකරු - මානව සම්පත් හා පරිපාලන
**අයි.ඒ. ගුණවර්ධන මහතා**
B.B. Mgt. (Human Resource) Hons.
PG Dip M (SL)



කළමනාකරු - වතු අධීක්ෂණ
සහ සම්බන්ධීකරණ
**එස්.එම්.ආර්.පී. සත්කුමාර මහතා**
B. Sc. (Agricultural Sciences)
Specializing Plantation Management



කළමනාකරු - අලෙවි
**ජේ.කේ.ජේ.පී. ජයවර්ධන මහතා**
M.Sc. (Agricultural Extension)
B. Sc. (Agriculture)



කළමනාකරු - විගණන
**එම්.කේ.එන්. අබේදීර මහතා**
Bachelor of Commerce (Special)
CBA



**ජී.කේ.ඒ. ජයවර්ධන මහතා**



**ආර්.එම්.පී.යූ. ප්‍රසාන්ත මහතා**
B.V.Sc. Registered Veterinary
Surgeon & Practitioner



**එම්.ටී.ජේ. පෙරේරා මහතා**
B.Sc. (Agriculture) (Special) Hons



**ඩබ්.එම්.ජී.කේ.බී. වීරසිංහ මහතා**
B.Sc. Plantation Management
MBA



**එස්.එල්.පී. විතානගේ මහතා**
B.Sc. Plantation Management



**කේ.ඒ.ජී. චන්දන මහතා**
B.Sc. (Agriculture) (Special) Hons



**එස්.පී.පී.අයි. වීරකෝන් මහතා**
M.AETM, B.Sc. (Plantation Management),
Dip. in Agriculture

කුරුණෑගල වැවිලි සමාගම, වැවිලි සමාගමක් වශයෙන් ආර්ථික, පාරිසරික සහ සමාජ ස්ථාවරත්වය ඇති කිරීම තුළින් වර්ධනය ඉහළ මට්ටමකට පත් කර තිරසාරබව සහතික කිරීමට කැපවී සිටියි. සමාගමේ මූල්‍ය තිරසාරභාවය බවට පරිවර්තනය වන ආර්ථික තිරසාරභාවය, පාර්ශවකරුවන්ට ආර්ථික ප්‍රතිලාභ ගෙන දෙන අතරම ප්‍රජාවන්ට ආර්ථික අවස්ථා නිර්මාණය කරයි. කෘෂිකාර්මික පදනමක් සහිත සමාගමක් වශයෙන් එහි මූල්‍ය තිරසාරභාවය පාරිසරික තිරසාරභාවය සමග වෙන් කළ නොහැකි ලෙස බද්ධ වී ඇති අතර, එබැවින් සමාගම මගින් ස්වභාවික පරිසරය සහ පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම සහ ආරක්ෂා කිරීම අවශ්‍ය වේ. මේ සඳහා සත්‍ය වශයෙන්ම ඉඩම් සහ ජලය තිරසාර ලෙස භාවිත කිරීම සහ සමාගමේ ව්‍යාපාරික කටයුතු සඳහා සහාය වීම සඳහා ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම ඇතුළු තිරසාර කෘෂිකාර්මික පිළිවෙත් භාවිතය අවශ්‍ය වේ. සමාගම විසින් වතු ආශ්‍රිතව සහ වතු අවට ප්‍රජා අන්තර්ක්‍රියා තුළින් සමාජ තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම දිරිමත් කරනු ලබයි. අවට ගම්මානවල වාසය කරන ජනතාව අපගේ ව්‍යාපාරයේ අනිවාර්ය අංගයක් ලෙස පවතින බැවින්, මෙම ප්‍රජා සමග අන්තර්ක්‍රියාකාරීත්වය තුළින් නිසැකවම සමාජ සමගිය පෝෂණය කරන බව අපි විශ්වාස කරමු. ඊට අමතරව, රජයට අයත් සමාගමක් වශයෙන් මහජන වගවීමට යටත් වන බැවින්, අප යහපාලනය වෙනුවෙන් කැපවී සිටිමු. මේ සම්බන්ධයෙන්, දූෂණ හා විෂමාචාර වැළැක්වීම සඳහා විනිවිද පෙනෙන ක්‍රියාවලි, නිරන්තර අධීක්ෂණය, ඇගයීම සහ වාර්තා කිරීම තුළින් යහපාලනය ඇති කිරීමට අපි වැයම් කරමු.

### තිරසාර කෘෂිකාර්මික පිළිවෙත්

උපරිම ඵලදායිතාව සහතික කිරීම සඳහා අපි තිරසාර කෘෂිකාර්මික කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීම නිරන්තරයෙන් දිරිමත් කර ඇත. එබැවින්, කාර්යක්ෂමතාව, බෝග විවිධාංගීකරණය, අතුරු බෝග වගාව සහ යටි වගාව සඳහා වැඩි ඉඩම් ප්‍රමාණයක් පරිහරණය කිරීම තුළින් අපගේ වතු හතේම මෙම පිළිවෙත් භාවිත කර ඇත. වැඩි ඵලදායිතාවක් සඳහා ඉඩම් භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා, ''අක්කරයකට වගා කළ හැකි උපරිම පොල් ගස් සංඛ්‍යාව'' ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට අප විශාල වශයෙන් වැයම් කර ඇත. දැනට පවතින සෑම බිම් වර්ගයකම යටි වගාව ක්‍රියාත්මක වේ. 2023 වර්ෂය අවසානයේ යටි වගා කරන ලද භූමි ප්‍රමාණය මුළු පොල් වගා කළ භූමි ප්‍රමාණයෙන් 16% (හෙක්ටයාර 589.18) ලෙස වාර්තා වී ඇති අතර වර්ෂය තුළ නොමේරූ පොල් වගා සඳහා රුපියල් මිලියන 162 ක් ආයෝජනය කරන ලදී. අක්කරයක වගා කරන ලද පොල් ගස් ප්‍රමාණය වැඩිවීම නිසා අනාගතයේ දී අපගේ සියළු වතුවලින් ලැබෙන පොල් අස්වැන්න නිසැකවම වැඩි දියුණු වන අතර එමගින් සමාගමේ තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීමට හැකි වනු ඇත. සීසෑම, අකාබනික පොහොර භාවිතය සීමා කරමින් කාබනික පොහොර භාවිතය වැඩි කිරීම, සමෝච්ච කාණු, වසුන් යෙදීම වැනි අපගේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් භාවිතය මගින් අපගේ ඉඩම්වල තිරසාර ඵලදායිතාව වැඩිදියුණු කිරීමට දායක වී ඇත. මීට අමතරව, කාබනික පොහොර භාවිතය මගින් පසෙහි සාරවත් බව, තෙතමනය රඳවා ගැනීමේ හැකියාව, පාංශු වාතනය, සවිවර වයනය සහ පසේ හිතකර ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීමට දායක වී ඇත. පසේ වැඩි දියුණු වී ඇති මෙම හිතකර ගුණාංග යහපත් කෘෂිකාර්මික පිළිවෙත් භාවිත කිරීම සහ අපගේ ඉඩම්වල තිරසාරභාවය සම්බන්ධ අපගේ කැපවීම පිළිබඳ මනා සාක්ෂියකි.

### වැවිලි සඳහා කෘත්‍රිම රසායනික ද්‍රව්‍ය භාවිතය අඩු කිරීම

පරිසර ආරක්ෂණය යනු සමාගම තීරණාත්මක අවධානයක් දක්වන ක්ෂේත්‍රයක් වන බැවින්, කාබනික පොහොර භාවිතය වැඩි කරමින් සහ ජීව විද්‍යාත්මක හා යාන්ත්‍රික පාලන භාවිත කිරීම ඉහළ නංවමින්, පළිබෝධනාශක, කෘමිනාශක සහ දිලීර නාශක වැනි කෘත්‍රිම රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට හැකි සෑම පියවරක්ම ගෙන ඇත.

### ජීව විද්‍යාත්මක පළිබෝධ පාලනය

- පොල් වතුවල සාමාන්‍ය මයිටාවන් (*Aceria guerreronis*) මර්දනය කිරීම සඳහා විලෝපික මයිටාවන් (*Neoseiulus baraki*) භාවිතා කිරීම - විලෝපික මයිටාවන් නිෂ්පාදනය කිරීම කටුගම්පොල පිහිටි අංගසම්පූර්ණ අභිජනන රසායනාගාරයක් තුළ සිදු කෙරේ. මෙම පරිසර හිතකාමී තාක්ෂණය මගින් වඩාත් විශිෂ්ට ප්‍රතිඵල පෙන්නුම් කර ඇත.
- ෆෙරමෝන් උගුල් - පළතුරු වතුවල පළතුරු මැස්සන් (*Drosophila* විශේෂ) සහ පොල් වගාවන්හි රතු කුරුමිණි (*Rhynchophorus* ෆෙරුජීනියස්) නියාමනය කිරීම.

- කජු වගාවන්හි හෙලෝපෙල්ටිස් මදුරුවා මර්දනය සඳහා රතු කුහුඹුවන් (*Solenopisis* විශේෂ) හඳුන්වා දීම.

**යාන්ත්‍රික පාලනය**

ග්ලයිෆොසේට් පළිබෝධනාශයක් ලෙස භාවිත කිරීම විවිධ සංසදවල පුළුල් ලෙස විවාදයට ලක්ව ඇති කරුණක් වන අතර මේ වන විට රජය මෙම රසායනිකය භාවිත කිරීම තහනම් කර ඇත. විකල්ප වල්පැළ මර්දන යාන්ත්‍රණයක් ලෙස අපි පහත ක්‍රම පරීක්ෂා කිරීම සහ තක්සේරු කිරීම සිදු කරමු.

- සීසෑම, දැති පෝරුගෑම සහ කැපීම සඳහා යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම
- ගවයින් තෘණ මගින් පෝෂණය කිරීම
- ආවරණ බෝග ස්ථාපනය කිරීම
- පොහොර කව ආවරණය වන පරිදි වසුන් යෙදීම

**කාබනික පොහොර යෙදීම**

සමාගම විසින් රසායනික පොහොර භාවිතය අවම කිරීම සඳහා ගත් වැදගත් පියවරක් වන්නේ රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතයට යොමු වීමයි. මීට අමතරව, අපගේ වතුවල රසායනික ද්‍රව්‍ය භාවිතය සහ හැසිරවීම සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කරනු ලබයි. ආරක්ෂිත උපකරණ සහ ක්‍රම භාවිතා කිරීම සම්බන්ධයෙන් සහ පවතින අන්තරායන් හේතුවෙන් රසායනික ද්‍රව්‍ය පාලනය කර භාවිත කිරීම සම්බන්ධයෙන් ක්ෂේත්‍ර මට්ටමින් මෙම රසායනික ද්‍රව්‍ය ඉසින සහ හසුරුවන සේවකයින් පුහුණු කිරීම සහ දැනුවත් කිරීම සිදු කරයි.

**ජෛව විවිධත්වය**

ජෛව විවිධත්වය වැඩි දියුණු කිරීම සඳහා අපි අපගේ සියළුම වතුවල සක්‍රියව වැඩ කරන්නෙමු. වර්තමාන වැවිලි ප්‍රදේශය සහ සුදුසු අතුරු බෝග සහ දැව වර්ග වගා කළ හැකි ප්‍රදේශය අනාගතයේ ව්‍යාප්ත කිරීම සඳහා පවතින හැකියාව යන ද්විත්වය හඳුනා ගැනීම සඳහා අප විසින් සාර්ථකව ඇගයීම් කටයුතු සිදු කර ඇත.

පරිභෝජ්‍ය ජෛව විද්‍යාත්මක සම්පතක් ලෙස තම වගා බිම්වල ඇති ගස්වලින් නෙළාගත හැකි වටිනා දැව පිළිබඳව කුරුණෑගල වැවිලි සමාගමට අවබෝධයක් ඇත. පළාත් පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවශ්‍ය අනුමැතිය ලබාගෙන ක්‍රමානුකූලව මේරූ දැව අස්වනු නෙලනු ලැබේ. අපගේ සමාගම විසින් තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා අස්වනු නෙළන ගස් වෙනුවට නැවත වගා කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රමානුකූලව ස්ථාපිත කර ඇති බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු.

**සේවක ප්‍රතිලාභ සහ දිරිගැන්වීම**

කුරුණෑගල වැවිලි සමාගම එහි සේවකයින් සඳහා සුරක්ෂිත, ප්‍රසන්න සහ ප්‍රතිලාභදායක සේවා පරිසරයක් සැපයීම සඳහා කැපවී සිටියි. සුදුසුකම් ලත්, පළපුරුද්ද සහිත විශ්වසනීය වෘත්තිකයන් වශයෙන් තරඟකාරී වාසියක් සහිත අප සේවකයින් අපගේ වටිනාම වත්කම වශයෙන් සැලකිය හැකි වේ. අපගේ වතුයායේ ලාභදායී කළමනාකරණය සඳහා ඉහළ මට්ටමේ වෘත්තීයභාවයක් සහ විශේෂඥතාවක් පැවතීමේ අවශ්‍යතාව අගයමින්, කුරුණෑගල වැවිලි සමාගම විසින් අදාළ කුසලතා සහ දැනුමෙන් සන්නද්ධ මානව ප්‍රාග්ධන පදනමක් අත්පත් කර ගැනීමට සහ පෝෂණය කිරීමට නිරන්තරයෙන් වෑයම් කරයි. 2023 අවසානය වන විට, කුරුණෑගල වැවිලි සමාගමේ මුළු ශ්‍රම බලකාය පුද්ගලයන් 1,150 කින් සමන්විත විය.

**කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා ගෙවීම**

සමාගම විසින් 2005 වර්ෂයේ දී කාර්යසාධනය මත පදනම් වූ දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් ආරම්භ කළ අතර වඩාත් යහපත් කාර්යසාධනයක් පවත්වාගෙන යෑම සඳහා මෙම සමාගමේ සේවකයන් දිරිමත් කරමින් එම යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. 2023 වර්ෂයේදී කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා ගෙවීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 90 ක් වෙන් කරන ලදී. 2022 වර්ෂය සඳහාද එම අගය රුපියල් මිලියන 90 කි. මාසික වැටුප් ලබන සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ වැටුපෙන් මාස දෙකකට සරිලන වටිනාකමක් ගෙවීම සහ දෛනික වැටුප් ලබන සේවකයින්ට දිරි දීමනා ලෙස රු. 50,000 ක් ගෙවීමට මෙම ප්‍රතිපාදනය සළසන ලදී.

**අපගේ සේවකයින් භුක්ති විඳින අනෙකුත් ප්‍රතිලාභ:**

- අඩු පොළී අනුපාත යටතේ ආපදා ණය පහසුකම් ලබා දීම.
- පාසල් පොත්පත් සහ රෙදිපිළි සඳහා පොළී රහිත ණය ලබා දීම.
- සියළුම සේවකයන්ගේ ගෘහස්ත පරිභෝජනය සඳහා සීමිත පොල් ප්‍රමාණයක් පොල් ගෙඩියක් රු. 1 ක් වැනි ඉතා අඩු නාමික මිලකට සැපයීම.
- මුරකරුවන්ට වැටුණු ගෙඩි එකතු කිරීම සඳහා මෙන්ම විධිමත් මාසික පැමිණීම සඳහා දිරි දීමනා ගෙවීම.
- විදුලි සැපයුම නොමැති මුරකරුවන් සඳහා භූමිතෙල් දීමනාව ගෙවීම.
- සියළුම සේවකයින් සඳහා කම්කරු වන්දි රක්ෂණයක් ලබා දීම.
- විධායකයින් සඳහා රු. මිලියන 1ක පුද්ගලික අනතුරු රක්ෂණාවරණයක් ලබා දීම.

- විධායක නිලධාරීන් සඳහා පවුල් ඒකකයකට රු. 450,000 ක් බැගින් සෞඛ්‍ය රක්ෂණාවරණයක් ලබා දීම.
- කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් මූල්‍ය සහන ලබා දීම.
- සේවකයින්ගේ දරුවන්ගේ උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දීම.
- ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මාසයක වැටුප ගෙවීම.

**නේවාසික පහසුකම්**

පසුගිය වසර කිහිපය තුළ, අපගේ වතුවල නිවාස තත්ත්වය වැඩිදියුණු කිරීමට අපි දැඩි උත්සාහයක් දැරුවෙමු. සමාගම සෑම විටම නේවාසික සේවකයින් ගැන සැලකිලිමත් වන අතර එම නිසා, එවැනි සේවකයන් සඳහා විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම් සහිත වඩා යහපත් නිවාස ලබා දී තිබේ. වර්ෂය තුළදී, නිල නිවාස කිහිපයක් ප්‍රතිසංස්කරණය කිරීමට අමතරව, අප විසින් විදුලිය, ජල සම්පාදනය සහ සනීපාරක්ෂක පහසුකම් වැනි මූලික පහසුකම් සහිත කාර්ය මණ්ඩල නිල නිවාස 01ක් සහ මුර කුටි 05 ක් ඉදිකරන ලද අතර ඒ සඳහා රුපියල් මිලියන 15.09 ක මුළු මුදලක් වැය කරන ලදී.

**සේවක පුහුණුව සහ සංවර්ධනය**

කුරුණෑගල වැවිලි සමාගම මගින් කාර්ය මණ්ඩලයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කුසලතා, දැනුම සහ ආකල්ප ලබා දෙමින් ඔවුන්ව පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අඛණ්ඩව ආයෝජනය කරයි. සේවකයින්ගේ අඛණ්ඩ ඉගෙනීම මෙන්ම පුද්ගල සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ආයතනය තුළ සහ බාහිරව පුළුල් පරාසයක පුහුණු වැඩසටහන් පිරිනමා ඇත. සමාලෝචිත වර්ෂය තුළ, ඊට අමතරව, සමාගම මගින් සේවකයින් වෙනුවෙන් ඩිප්ලෝමා, උපාධි සහ ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධි වැඩසටහන් ගණනාවකට සහය දක්වයි. ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් පවත්වනු ලබන විශේෂ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට අමතරව සේවාස්ථ පුහුණුවීම් ද ලබා දෙයි.

**සේවකයින් සමඟ යාවජීව සබඳතා ගොඩනඟා ගැනීම**

සමාගම විසින් යාවජීව සබඳතා ගොඩනඟා ගැනීම සඳහා විවිධ සේවක ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදී.

- වාර්ෂික සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය අඛණ්ඩව 13 වැනි වරටත් පවත්වන ලදී.
- වාර්ෂික පොසොන් උත්සවය නිමිත්තෙන් ''කිරිබත් දන්සල'' අඛණ්ඩව 11 වැනි වරටත් කුරුණෑගල ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණි.
- මානව සම්පත් කළමනාකරණ ක්‍රමෝපායක් වශයෙන් කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික විනෝද චාරිකාව සංවිධානය කරන ලදී. එහි පරමාර්ථය වූයේ සේවකයින් අභිප්‍රේරණය කිරීම වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සේවකයින් සමාගම කෙරෙහි දක්වන පක්ෂපාතිත්වය සහ කැපවීම වැඩි වූ අතර එමඟින්, ඉහළ ඵලදායිතාවක් ද ඇති විය.

**කුරුණෑගල වැවිලි සමාගම සහ සමාජය**

කුරුණෑගල වැවිලි සමාගම් ඉඩම ස්වකීය ගවයන්ට තෘණ ආහාරයට දීමට සහ ගවයන්ව රඳවා තබා ගැනීම සඳහා භාවිත කිරීමට කැමත්තක් දැක් වූ අසල්වැසි ගොවීන්ට කුරුණෑගල වැවිලි සමාගම විසින් අඛණ්ඩව උපකාර කර ඇත. මෙමගින් කුරුණෑගල වැවිලි සමාගමට ගව ගොම ආකාරයෙන් කාබනික පොහොර ලබා ගැනීමේ ප්‍රතිලාභය සහ ගවයින් තෘණ ආහාරයට ගැනීම මගින් වල් පැළෑටි පාලනය කිරීමේ ප්‍රතිලාභය ද හිමි විය.

මෙම වැඩපිළිවෙළ මගින් ජාතික කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ ගව ගහනය සමස්තයක් වශයෙන් ඉහළ නැංවීමට ද දායක වේ. මෙම සමාගම මගින් එයට අයත් වතුවල මුදල් බෝග සහ අර්ධ බහු වාර්ෂික බෝග වගා කිරීමට අසල්වැසි ගම්වාසීන්ට පහසුකම් සලසා දී ඇති අතර, මෙය ඔවුන්ට ආර්ථික වශයෙන් විශාල වැදගත්කමක් සහිත පහසුකමක් බව සනාථ වී ඇත. මෙම සහයෝගීතාවය ඔවුන්ගේ පවුලේ ආදායම සහ ජාතික කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කරන අතරම, වතුකරයේ පාංශු ව්‍යුහයේ වඩා හොඳ ජීව විද්‍යාත්මක හා පාරිසරික සමතුලිතතාවයක් ඇති කිරීමට ද එය දායක වේ. සාම්ප්‍රදායික ගොවිතැන් දැනුම හා පළපුරුද්ද ඇති පුහුණු ශ්‍රමිකයන් හඳුනා ගැනීමට සහ අපතේ ශ්‍රම බලකාය සඳහා එක් කර ගැනීමට ද මෙම වැඩසටහන මගින් අපට හැකියාව ලැබේ. මහනුවර ශ්‍රී දළදා පෙරහැර, ප්‍රදේශයේ විහාරස්ථාන හා දේවාලවල පෙරහැර වැනි සංස්කෘතික උත්සව සඳහා කොප්පරා සැපයීමට ද කුරුණෑගල වැවිලි සමාගම කටයුතු කරයි. ආගමික සිද්ධස්ථාන සහ පාසල් ඉදිකිරීම / ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දැව සඳහා වන ඉල්ලීම් ද සමාගම හිතකර ලෙස සලකා බලයි. අපගේ සියළු ව්‍යාපාරික ක්‍රියාකාරකම් සමඟ අප විසින් පවත්වාගෙන යන තිරසාරභාවයේ වටිනාකම් අපගේ මෙහෙයුම් තුළ අන්තර්ගත වන අතර ආර්ථික, සමාජීය සහ පාරිසරික ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගෙන අපි කටයුතු කරන්නෙමු. වැවිලි සමාගමක් වන කුරුණෑගල වැවිලි සමාගම පරිසරය සුරැකීම, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සහ සේවකයින්ගේ සහ අපගේ ජාතියේ යහපැවැත්ම සහතික කරන අතරම ආර්ථික වශයෙන් ශක්‍ය ගොවිතැනක් කිරීමට ද කැපවී සිටියි.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම අවදානම් කළමනාකරණය සමස්තයක් වශයෙන් යහපත් කළමනාකරණයේ සහ පාලනයේ අනිවාර්ය අංගයක් ලෙස පිළිගනී. එබැවින් වතු අංශයට සුවිශේෂී වූ පොදු අවදානම් මෙන්ම අතිරේක අවදානම් කිහිපයක් හඳුනා ගැනීමට කුරුණෑගල වැවිලි සමාගම උත්සාහ දරා ඇත. සුවිශේෂී අවදානම් ප්‍රධාන වශයෙන් රබර්, පොල් සහ අනෙකුත් අතුරු බෝග වගා කිරීම සහ සැකසීම සහ සමාගම ක්‍රියාත්මක වන මූල්‍ය පරිසරයට අදාළ වේ. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කමිටුව සමඟ එක්ව, ව්‍යාපාරික අවදානම් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර යහපත් මූල්‍ය සහ මෙහෙයුම් පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කරයි. කලින් කලට අභ්‍යන්තර විගණකවරු සහ කළමනාකරණ කණ්ඩායම පවතින අවදානම් සඳහා විසඳුම් සෙවීමේදී සහ කොටස් හිමියන්ගේ ආයෝජන සහ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අවාසි අවදානම ඉවත් කිරීමට සහ වාසි අවදානම භාවිත කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පද්ධතිවල ඵලදායිතාවය සමාලෝචනය කරති.

### අවදානම් ස්වභාවය

අධ්‍යක්ෂ මණ්ඩලය සිය ස්ථාවරය පැහැදිලිව ප්‍රකාශ කර ඇති අතර එවැනි පද්ධතියක මූලික අවශ්‍යතා සපුරාලන විස්තීරණ අවදානම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා මනාව නිර්වචනය කරන ලද ඒකාකාරී ප්‍රවේශයක් අනුගමනය කර ඇත. කළමනාකාරීත්වය විසින් තීරණ ගැනීමේදී, සදාචාරාත්මක මූලධර්ම කෙරෙහි ඇති කැපවීම පිළිබිඹු කරමින් සාමාන්‍යයෙන් පොදු පාර්ශ්වකරුගේ ස්ථාවරය සැලකිල්ලට ගනියි. නායකත්වයේ ප්‍රතිපත්ති සමඟ සම්පූර්ණයෙන්ම එකඟ වෙමින්, කාර්ය මණ්ඩලය ද මෙම සදාචාරාත්මක මූලධර්මවල වැදගත්කම හඳුනාගෙන ඇති අතර කාර්ය මණ්ඩලය එම මාවතේම අඛණ්ඩව ඉදිරියට ගමන් කරයි.

### අවදානම හඳුනා ගැනීම

සමාගමේ ඉහළ කළමනාකාරීත්වය මගින් සේවකයින් අතර අවදානම් දැනුවත්භාවය පිළිබඳ ප්‍රමාණවත් හැඟීමක් ඇති කිරීම මගින් සමාගම තුළ අවදානම් සංස්කෘතියක් නිර්මාණය කිරීමට කැපවී සිටියි. සමාගම විසින් අභ්‍යන්තර අවදානම් හඳුනා ගැනීමට පහළ-ඉහළ ප්‍රවේශයක් අනුගමනය කරයි. එහිදී මෙහෙයුම් මට්ටමේ සේවකයින් පවා ඔවුන්ගේ වෘත්තීය ක්ෂේත්‍රවල ඇති වන අවදානම් හඳුනා ගැනීමට දිරිමත් කරනු ලැබේ. ඉහළ කළමනාකාරීත්වය ද බාහිර අවදානම් හඳුනා ගන්නා අතර බාහිර වර්ධනයන් පිළිබඳව දැනුවත්ව සිටියි. සඵලදායී පාලනයක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සමාගම මෙම හඳුනාගත් අවදානම් තවදුරටත් වර්ගීකරණය කරයි, ඒවායින් සමහරක් සෑම ආයතනයකටම පොදු වන අතර සමහරක් වැවිලි අංශයට සුවිශේෂී වේ.

### මෙහෙයුම් අවදානම්

අපගේ ප්‍රධාන බෝගය වන පොල් සමාගමේ ප්‍රමුඛතම ආදායම් මාර්ගය වේ. නිෂ්පාදනය කරන ලද පොල්වලින් 70% කට වැඩි ප්‍රමාණයක් ආහාර පිසීමේ කටයුතු සඳහා දේශීයව පරිභෝජනය කරන අතර කර්මාන්ත අංශය සඳහා 30% කට වඩා අඩු ප්‍රමාණයක් ඉතිරි වේ. මෙය වෙළඳපල අස්ථාවරත්වයක් ඇති කර ඇති අතර එමගින් ඉහළ බෝග නිෂ්පාදනයක් පවතින විට පවා වාර්ෂික පිරිවැටුම කණස්සල්ලට හේතු වන පරිදි අඩු වේ. කෙසේ වුවද, උසස් තත්ත්වයේ පොල් ගෙඩි නිෂ්පාදනය කිරීම හේතුවෙන් එහි අස්වැන්න ප්‍රතික්ෂේප කිරීමේ අනුපාතය අවම අගයක පැවතීම හේතුවෙන් කුරුණෑගල වැවිලි සමාගමට පොල් සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලබන වෙන්දේසිවලදී ඉහළ ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් ලබා ගැනීමට හැකි වී ඇත. එමගින්, කුරුණෑගල වැවිලි සමාගමට ගැණුම්කරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමට හැකි වී ඇත. වෙළඳපොළ තුළ ඉහළ තරගකාරීත්වයක් ඇති කරමින්, ශක්තිමත් දේශීය ගැණුම්කරු පදනමක් ඇති කිරීමට සමාගම තවදුරටත් වෑයම් කළ අතර, එම තත්ත්වය ඉහළ අස්වැන්නක් ලැබෙන කාලවලදී නිමැවුම් බෙදා හැරීමට ද ප්‍රයෝජනවත් වන බව සනාථ වී ඇත. එකතු කිරීමේ ස්ථාන වෙත පහසුවෙන් ප්‍රවේශ වීම, පොල් ලෙලි ගසන පුද්ගලයින් සඳහා නේවාසික පහසුකම් සැපයීම, අහිතකර තත්ත්ව තුළ නිෂ්පාදන ආරක්ෂිත ස්ථාන වෙත ක්ෂේත්‍ර ප්‍රවාහණය සහ පැටවීමේ කාලය නියම කිරීමේ දී දක්වන නම්‍යශීලී බව හේතුවෙන් කුරුණෑගල වැවිලි සමාගම පාරිභෝගික හිතකාමී සැපයුම්කරුවෙකු ලෙස ගැණුම්කරුවන් අතර ඉහළ පිළිගැනීමක් ලබා ගැනීමට සමත් වී ඇත. අහිතකර කාලගුණික තත්ත්වවලට අදාළව ආරක්ෂාකාරී පියවරක් වශයෙන්, සමාගම විසින් පසෙහි තෙතමනය ආරක්ෂා කර පස සංරක්ෂණය කිරීම සඳහා වසුන් යෙදීම, ලෙලි වැළලීම, ආවරණ භෝග භාවිතය, ඇති පෝරුගෑම, සමෝච්ච කානු ඉදි කිරීම, කාබනික පොහොර භාවිත කිරීම වැනි කෘෂිකාර්මික පිළිවෙත් කිහිපයක් අනුගමනය කර ඇත. මෙම

පිළිවෙත් මගින් හිතකර ප්‍රතිඵල ලබාදී ඇති බැවින්, දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම්වලින් රබර් වගා ද ආරක්ෂා කර ගැනීම සඳහා සමාගම මගින් ඒ හා සමාන පිළිවෙත් අනුගමනය කර ඇත. අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් නිමැවුම් පාඩුව අවම කර ගැනීම සඳහා රබර පර්යේෂණායතනය මගින් නිර්දේශ කළ ක්ලෝන භාවිතය සහ රබර් ගස් සඳහා වැසි ආවරණ යෙදීම මේවාට ඇතුළත් වේ.

### පළිබෝධ සහ රෝග

"*Aceria guerreronis*" සහ "*Plessispa*" යන පොල් මයිටාවන් සහ "*Weligama Wilt*" වැලිගම පොල් පැල මැලවීමේ රෝගය මේ වන විට වතුකරයේ බහුලව දක්නට ලැබෙන පළිබෝධ සහ රෝග අතරට එකතු වී ඇති අතර එය උසස් තත්ත්වයේ පොල් ගස්වලට විශාල හානියක් හා විනාශයක් සිදු කර ඇත. පරිසර හිතකාමී විලෝපික මයිටාවකු හඳුන්වා දීම මගින් ජීව විද්‍යාත්මක ක්‍රම භාවිතයෙන් පොල් මයිටා උවදුර සාර්ථකව මැඩපැවැත්වීමට හැකි වී ඇත. පොල් පර්යේෂණායතනයේ මඟපෙන්වීම යටතේ, කුරුණෑගල වැවිලි සමාගම මගින් සමාගමේ පර්යේෂණාගාරයේ දී විලෝපික මයිටාවන් අභිජනනය කරනු ලබන අතර සමාගමට අයත් පොල් වතුවල මෙම මයිටාවන් භාවිත කරනු ලබන අතර සාධාරණ මිලකට මෙම මයිටාවන් අසල්වැසි පොල් වතුවල භාවිතය සඳහා අලෙවි කරනු ලබයි. පළපුරුදු ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයක් මගින් ආසාදිත ගස් කලින් හඳුනා ගැනීම මගින් අපගේ වගාවල පවතින සියලුම පළිබෝධ සහ රෝග පාලනය කිරීමට සහ තුරන් කිරීමට අපට හැකියාව ලැබී ඇත. සමාගම පොල් පර්යේෂණ ආයතනය සමඟ එක්ව ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ සේවකයින් නිරන්තර පුහුණුව සඳහා යවමින් ඔවුන්ගේ දැනුම නිරන්තරයෙන් යාවත්කාලීන කරමින් ඔවුන්ට පුහුණුව ලබා දෙයි.

### බෝග ආරක්ෂාව

විශාල ඉල්ලුමක් ඇති ආහාර පිළියෙළ කිරීම සඳහා භාවිත කරනු ලබන නිෂ්පාදනයක් වන පොල් සොරකම් කිරීම බොහෝ අවස්ථාවලදී සිදු වේ. බොහෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පුරා විසිරී පවතින, ප්‍රමාණයෙන් කුඩා හුදෙකලාව පවතින ඉඩම් වීම හේතුවෙන් පොල් ගෙඩි ආරරක්ෂා කිරීම නිරන්තරයෙන් මුහුණ පෑමට සිදු වන ගැටළුවක් බවට පත් වී ඇත. මේ අනුව, සුළු සොරකම් සිදු කිරීම අවම කිරීම සඳහා පොල්වතු සඳහා ඉහළ ආරක්ෂාවක් සහතික කිරීම සඳහා විශේෂ පියවර ගැනීම අවශ්‍ය වේ. සොරකම් අවම කිරීමේ පියවරක් ලෙස, සමාගම විසින් දෙමාසයකට වරක් අස්වැන්න නෙළීමේ සාමාන්‍ය ක්‍රමය අනුගමනය කිරීමෙන් තොරව මාසිකව- අස්වැන්න නෙළීමේ ප්‍රමාණය 90% දක්වා පුළුල් කරන ලද අතර, එමඟින් ගස්වලින් වැටෙන ගෙඩි සංඛ්‍යාව අවම කර ඇත. මුළු මායිම වටා ඉදි කර ඇති වැටවල් ශක්තිමත් කිරීම මගින් මෙම ක්‍රමය තවදුරටත් ඵලදායක වී ඇත. මීට අමතරව, අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන්, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ සමීප සෝදිසිය සහ අධීක්ෂණය සුළු සොරකම් අවම කිරීම සඳහා ඵලදායී පියවරක් බව සනාථ වී ඇත. වැටුණු ගෙඩි එකතු කරන සහ පොල් සඳහා ආරක්ෂාව සපයන මුරකරුවන් ද දිරි දීමනා ලබා දීම මගින් දිරිමත් කරනු ලැබේ. මාර්ගස්ථ බෝග සඳහා මෙන්ම ස්වභාවික විපත්, ගිනි ගැනීම්, සොරකම් සහ අනතුරු හේතුවෙන් සිදු වන අවදානම් සඳහා ද සමාගමට රක්ෂණාවරණයක් පවතියි.

### ශ්‍රම බලකායේ හිඟය

අස්වනු නෙළීම, පොල් ලෙලි ගැසීම සහ රබර් කිරි අස්වැන්න නෙළීම සඳහා දක්ෂ ශ්‍රම බලකායක් කර්මාන්තය සඳහා අත්‍යවශ්‍ය අවශ්‍යතාවයකි. කෙසේ වුවද, පසුගිය වර්ෂ කිහිපය තුළ, සමාගමේ කළමනාකාරිත්වය මුහුණ දුන් ගැටළුවක් වූයේ දක්ෂ පොල් වතු කම්කරුවන්ගේ හිඟකමයි. මේ නිසා, පොල් වතුවල දෛනික කළමනාකරණ කටයුතුවලට බොහෝ බාධක එල්ල වී ඇත. තේ සහ රබර් වතුවල සිදු කරන ආකාරයෙන් පොල් වතුවල නේවාසික ශ්‍රම බලකායක් රඳවා නොගන්නා බැවින්, අසල්වැසි ගම්මානවල කම්කරුවන්ගෙන් අදාළ කටයුතු ඉටු කර ගැනීමට සමාගමට සිදු වී තිබේ. එබැවින්, කම්කරුවන් මත විශ්වාසය තැබීම අවම කිරීම සහ වතු කාර්යක්ෂමව නඩත්තු කිරීම සඳහා විකල්ප විසඳුමක් ලෙස සමාගම මගින් විචක්ෂණශීලී ලෙස රසායනික වල් නෙළීම ඇතුළු වල් නෙළීම, ජලය බැසීම සහ පොහොර යෙදීම සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතය අනුගමනය කරන ලදී. අපගේ ශ්‍රම බලකායෙන් ප්‍රශස්ත නිමැවුමක් ලබා ගැනීම සම්බන්ධයෙන් අප සැමවිටම සැලකිලිමත් වන අතරම, සුදුසු යාන්ත්‍රිකකරණය මගින් ඉතා ඉහළ නිමැවුමක් ලබා ගැනීමට ද සමාගම සමත්ව ඇත. නොමිලයේ නේවාසික පහසුකම් සැපයීම සහ සහන මිලට විදුලිය, ජලය සහ පොල් සැපයීම මගින් කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමට ද සමාගම පියවර ගෙන ඇත. මීට අමතරව, කාර්යසාධනය මත දිරි දීමනා ගෙවීම් සිදු කරන ලද අතර, ප්‍රසාද දීමනා ගෙවීම, දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබා දීම, අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ ණය යෝජනා ක්‍රම, කාර්ය මණ්ඩලයට ආපදා ණය ගෙවීම, ව්‍යවස්ථාපිත හිඟ මුදල් නියමිත වේලාවට ගෙවීම, වෘත්තීය පුහුණුව ලබා දීම වැනි වෙනත් ප්‍රතිලාභ ද ලබා දෙන ලද අතර මිත්‍රශීලී සහ ආරක්ෂිත සේවා පරිසරයක් ස්ථාපනය කර තිබේ.

**ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ අවදානම**

ජාතික අවශ්‍යතා, පොදු අරමුණු සහ ව්‍යවස්ථාපිත ඉල්ලීම් සපුරාලීම සඳහා එළදායි ඉඩම් අත්පත් කර ගැනීමේ අවදානමට සමාගම බොහෝ අවස්ථාවල ගොදුරු වේ. සමාගම ස්ථාපනය කිරීම සඳහා 1992 වර්ෂයේ දී මුලින් පවරා ගත් ඉඩමෙන් 26% ක් කුරුණෑගල වැවිලි සමාගමට අහිමි වී ඇති බව සඳහන් කළ යුතුය.

**වෘත්තීය සමිති, සමාජ හා පාරිසරික වෙනස්කම්**

කාර්මික සංහිඳියාවේ වැදගත්කම හඳුනා ගැනීමෙන් පසුව, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වෘත්තීය සමිති සහ කුරුණෑගල වැවිලි සමාගම සාමාජිකයෙකු වන ලංකා සේව්‍ය සම්මේලනය සමඟ සාමූහික ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙමගින් නියමිත වේලාවට වැටුප් ගෙවීම, ව්‍යවස්ථාපිත ගෙවීම්, සේවක වන්දි රක්‍ෂණ හා කම්කරු ගැටළුවලට අදාළ ක්ෂේත්‍ර කෙරෙහි කඩිනම් අවධානය යොමු වී ඇත. මෙම පියවර ගැනීම මගින් සමාගමේ කාර්මික සමගිය ශක්තිමත් කර ඇත.

**අවදානම් අධීක්ෂණය සහ සමාලෝචනය**

අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර වෙනස්කම් සිදු කළ හැකි වන පරිදි පාලන දුර්වලතා හඳුනාගැනීමේ අරමුණින් සමාගමේ අවදානම් කළමනාකරණ සංරචකවල පැවැත්ම සහ ක්‍රියාකාරිත්වය කාලයත් සමඟ තක්සේරු කරනු ලැබේ. ඉහළ කළමනාකාරිත්වය සහ විගණන කමිටුව වෙන වෙනම ඇගයීම් සිදු කිරීම තුළින් අඛණ්ඩව සිදුවෙමින් පවතින ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමේ අවසාන වගකීම දරන අතර, අපගේ අභ්‍යන්තර විගණන කණ්ඩායම සෑම වත්තකටම ගොස් නිතරම පද්ධති පාදක විගණන සිදු කරන අතර ක්‍ෂණික ප්‍රතිචාරයක් අවශ්‍ය කරුණු සම්බන්ධයෙන් අවදානම් වාර්තා කරයි. අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ සඵලතාවය වාර්ෂිකව සමාලෝචනය කරනු ලබන අතර, පවතින ක්‍රියාවලිය සඳහා ගැළපීම් සිදු කරයි. මෙම අවස්ථාවෙහිදී, සමාගම තුළ අවදානම් කළමනාකරණය සඳහා වගකිව යුතු පුද්ගලයින්ට සහාය වීම සඳහා මෙන්ම මඟ පෙන්වීම සඳහා අදාළ ගැටළු හඳුනාගෙන සන්නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකභාවය, ආයතනික මධ්‍යස්ථබව, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්ම මත ක්‍රියාත්මක වේ. එම පාලන මූලධර්ම මගින් සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ සියළුම පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් සබඳතාවක් ගොඩනගා ගැනීමට සහ සමාගම ක්‍රියාත්මක වන ව්‍යාපාරික පරිසරය පෝෂණය කිරීමට ප්‍රයත්න දරන පදනම සකස් කරයි. සමාගමේ ක්‍රියාකාරකම් සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූලව සහ එහි සියළුම පාර්ශ්වකරුවන්ගේ සුභසිද්ධිය උපරිම වන ආකාරයෙන් සිදු කරනු ලබයි. ව්‍යාපාරයේ නියාමන අනුකූලතාව සහ තිරසාර බව සහතික කිරීම සඳහා පමණක් නොව ව්‍යාපාරික වටිනාකම ඉහළ නැංවීම සඳහා ද සැලසුම් කර ඇති ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ක්‍රියා පිළිවෙත් තුළ අන්තර්ගත වන නිවැරදි භූමිකා, ව්‍යුහ සහ තොරතුරු මගින් ද මෙම කැපවීම සඳහා මනා සහායක් ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යසාධනය සඳහා අවසාන වශයෙන් වගකිව යුතු අතර ආයතනික පාලන ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානය වශයෙන් ක්‍රියා කරයි.

**වගකීම**

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායික අරමුණු සකස් කර ඒවා ක්‍රියාත්මක කිරීම සහතික කරයි. සමාගමේ මූල්‍ය තොරතුරුවල විශ්වසනීයත්වය සහ සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිතාව පිළිබඳ අවසානාත්මක වගකීම ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරයි.

**සංයුතිය**

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකුගෙන් (07) සමන්විත වේ.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව සැලසුම් කර ඇත. මෙම රැස්වීම්වලදී මණ්ඩලය විසින් සමාගමේ ක්‍රමෝපායික දිශානතිය සකස් කරන අතර වාර්ෂික අයවැය, සියළු ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සහ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වැඩසටහන් පිළිබඳව සමාලෝචනය කරයි. සෑම රැස්වීමකටම පෙර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සුදුසු ලේඛන ලබා දෙනු ලැබේ. 2023 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දොළහක් (12) පහත දක්වා ඇති පරිදි පවත්වන ලදී.

| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අංකය | දිනය |
|---|---|
| 394 | 2023 ජන. 26 දින පවත්වන ලදී. |
| 395 | 2023 පෙබ. 27 දින පවත්වන ලදී. |
| 396 | 2023 මාර්තු 28 දින පවත්වන ලදී. |
| 397 | 2023 අප්‍රේල් 27 දින පවත්වන ලදී. |
| 398 | 2023 මැයි 26 දින පවත්වන ලදී. |
| 399 | 2023 ජූනි 28 දින පවත්වන ලදී. |
| 400 | 2023 ජූලි 24 දින පවත්වන ලදී. |
| 401 | 2023 අගෝ. 14 දින පවත්වන ලදී. |
| 402 | 2023 සැප්. 15 දින පවත්වන ලදී. |
| 403 | 2023 ඔක්. 30 දින පවත්වන ලදී. |
| 404 | 2023 නොවැ.30 දින පවත්වන ලදී. |
| 405 | 2023 දෙසැ. 15 දින පවත්වන ලදී. |

**වර්තමාන අධ්‍යක්‍ෂ මණ්ඩලය**

| නම | තනතුර | පත්කළ දිනය |
|---|---|---|
| කේ.ජී.ජී.එෆ්. ජෙනට් ජයවර්ධන මහත්මිය | සභාපතිනිය | 2022/10/06 |
| අමිතා දොඩන්වල මහත්මිය | අධ්‍යක්ෂ | 2024/03/01 |
| ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර මහතා | අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත | 2022/03/02 |
| ඩබ්ලිව්.ජේ.ජී.ඩී. විජේසිංහ මහතා | අධ්‍යක්ෂ | 2020/01/15 |
| කේ.ජී.එන්. රංගල මහතා | අධ්‍යක්ෂ | 2023/09/21 |
| ටී.ඩී.එම්.පී. බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ | 2024/03/01 |
| ඩී.සී.ජේ. ප්‍රේමතිලක මහතා | අධ්‍යක්ෂ | 2024/03/01 |

2023 වර්ෂය තුළ මෙම රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ පැමිණීම පහත පරිදි වේ.

| | 26.01.2023 (394) | 27.02.2023 (395) | 28.03.2023 (396) | 27.04.2023 (397) | 26.05.2023 (398) | 28.06.2023 (399) | 24.07.2023 (400) | 14.08.2023 (401) | 15.09.2023 (402) | 30.10.2023 (403) | 30..11.2023 (404) | 15.12.2023 (405) | පැමිණීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **කේ.ජී. ජෙනට් ජයවර්ධන මහත්මිය** (සභාපතිනිය 2022.10.05 දින පත් විය) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12/12 |
| **අරුණි එස් රණසිංහ මහත්මිය** (2023.02.24 දින සිට 2024.04.09 දින දක්වා) | N/A | N/A | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 10/10 |
| **ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර මහතා** 2022.03.02 දින පත් විය) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12/12 |
| **ඩබ්ලිව්.ජේ.ජී.ඩී. විජේසිංහ මහතා** (2020.01.15 දින පත් විය) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12/12 |
| **එච්.සී.එම්.එම්. කුලසේකර මහතා** (2020.02.05 දින සිට 2024.03.01 දින දක්වා) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12/12 |
| **ටී. එදිරිවික්‍රමසූරිය මහතා** (2021.08.16 දින සිට 2024.03.01 දින දක්වා) | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | 12/12 |
| **කෝසල රංගල මහතා** (2023.09.21 දින පත් විය) | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | N/A | √ | 1/1 |

## නෛතික අවශ්‍යතාවලට අනුකූල වීම

සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය සහ රට තුළ රජය සතු ව්‍යාපාර සඳහා අදාළ වන අනෙකුත් නීති රීතිවලට සමාගම අනුකූල වන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සෑම උත්සාහයක්ම දරයි. සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වන බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

## විගණන කමිටු වාර්තාව

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවේ සාමාජිකයින් පත් කරනු ලබන අතර කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ සභාපතිත්වය යටතේ විගණන කමිටු රැස්වීම් අවශ්‍ය පරිදි සැලසුම් කර ඇත. සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ තවත් විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විගණන කමිටු රැස්වීම්වලට නිතිපතා සහභාගී වේ. තවද, ජ්‍යෂ්ඨ විධායකයින් සහ කළමනාකරුවන්, පළාත් වතු අධිකාරීවරුන් සහ ජාතික විගණන කාර්යාලයේ ආරාධිත නියෝජිතයකු කලින් කල මෙම රැස්වීම්වලට සහභාගී වන අතර රැස්වීම් සම්බන්ධීකරණය කරනු ලබන්නේ සමාගමේ කළමනාකරු-විගණන විසිනි. 2023 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇති අතර ඉහත සඳහන් රැස්වීම්වලට සහභාගී වීම පහත වගුවල දක්වා වේ.

**වත්මන් විගණන කමිටු - වර්ෂය - 2023/2024**

| නම | විගණන කමිටුවට පත් කළ දිනය |
|---|---|
| **ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර මහතා**<br>සභාපති විගණන කමිටුව<br>අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත. | 2022.03.31 |
| **අමිතා දොඩන්වල මහත්මිය** - අධ්‍යක්ෂ<br>(අතිරේක ලේකම් - රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය) | 2024.04.25 |
| **කේ.ජී.එන්. රංගල මහතා** - අධ්‍යක්ෂ | 2024.03.25 |

**විගණන කමිටු රැස්වීම් - වර්ෂය - 2023 වර්ෂය**

| නම | 10/02/2023 | 29/05/2023 | 25/10/2023 | 15/12/2023 | පැමිණීම |
|---|---|---|---|---|---|
| **ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර**<br>සභාපති විගණන කමිටුව -<br>අධ්‍යක්ෂ, භාණ්ඩාගාර නියෝජිත | √ | √ | √ | √ | 4/4 |
| **අරුණි එස් රණසිංහ මහත්මිය** - අධ්‍යක්ෂ | N/A | √ | √ | √ | 3/3 |
| **එච්.සී.එම්.එම්. කුලසේකර මහතා** - අධ්‍යක්ෂ | √ | √ | √ | √ | 4/4 |

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය සහ වගකීම වන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ අනෙකුත් නියාමන අවශ්‍යතාවලට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ ප්‍රමිතිය හා පූර්ණත්වය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා කළමනාකාරීත්වය පුහුණු කිරීම සහ රාජකාරි කටයුතු අධීක්ෂණය කිරීමයි. තවද, සමාගමේ අභ්‍යන්තර පාලන සහ අවදානම අවම කිරීමේ විධිවිධාන සම්බන්ධයෙන් සෑහීමකට පත් විය හැකි බව සහ මහා භාණ්ඩාගාරය විසින් කලින් කල නිකුත් කරනු ලබන චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ ඇතුළු නෛතික සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වන බව විගණන කමිටුව සහතික කළ යුතුය.

**මූල්‍ය වර්ෂයේ ප්‍රගතිය**

කළමනාකරු - විගණන විසින් විගණන කමිටුවේ අවධානයට යොමු කරන ලද කරුණු දීර්ඝව සාකච්ඡා කරන ලද අතර සමාලෝචිත කාල සීමාව තුළ පැවති රැස්වීම්වලදී සුදුසු විසඳුම් නිර්දේශ කරන ලදී. විගණන කමිටුවේ කටයුතු අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විධිමත්ව වාර්තා කරන ලදී. කලින් කල විගණනය කළ යුතු ගැටළු මතු වූ අවස්ථාවල දී, විගණන කමිටුව විසින් විගණනයේ විෂය පථය, එහි වාස්තවිකත්වය සහ ඵලදායිතාව විධිමත්ව සමාලෝචනය කර අධීක්ෂණය කරන ලදී. කමිටුව විසින් අනාගත අපේක්ෂා සමඟ සමාගමේ මෙහෙයුම් කටයුතු ද සමාලෝචනය කරන ලදී. මතු වූ ගැටළු වලට ප්‍රතිචාර වශයෙන් කළමනාකාරීත්වය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග මෙන්ම අභ්‍යන්තර පාලනවල සඵලදායිතාව අංශ ප්‍රධානීන් / අධිකාරීවරුන් සමග සාකච්ඡා කර ඇගයීමට ලක් කරන ලද අතර රැස්වීම් අතරතුරම අවශ්‍ය නිවැරදි කිරීමේ පියවර නිර්දේශ කරන ලදී.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව, ඊට අදාළ කරුණු සඳහා කළමනාකාරිත්වයේ පිළිතුරු සමඟ කළමනාකාරීත්වය සහ විගණකවරුන් සමඟ සාකච්ඡා කර තවදුරටත් සමාලෝචනය කර විගණකවරුන් විසින් අවධාරණය කරන ලද ගැටළු විසඳීමට කඩිනමින් කටයුතු සම්පාදනය කරන ලදී. අභ්‍යන්තර පාලන දුර්වලතා සහ අභ්‍යන්තර විගණන අංශය මගින් හඳුනාගෙන තිබුණු පොල් වතුවල පැවති අක්‍රමිකතා පිළිබඳව ප්‍රධාන විධායක නිලධාරී සහ අධිකාරීවරුන් සමඟ සාකච්ඡා කර වැඩි අවධානයක් යොමු කළ යුතු වැදගත් ක්ෂේත්‍ර පෙන්වා දී, ඒ සම්බන්ධයෙන් ලබා දිය හැකි හැකි නිර්දේශ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කිරීම සඳහා ඉදිරිපත් කරන ලදී.

අභ්‍යන්තර විගණන අංශය විසින් සපයනු ලබන සේවාවන් සහ සමාගමේ අවශ්‍යතා සහ අපේක්ෂා සපුරාලීමට ඔවුන් දරන වෑයම ස්තුති පූර්වකව පිළිගැනීමට විගණන කමිටුව අපේක්ෂා කරයි. විගණන කමිටු සාමාජිකයින් මෙන්ම අනෙකුත් ආරාධිතයින් / නිරීක්ෂකයින් විසින් ලබා දුන් වටිනා දායකත්වය කෘතඥතාපූර්වකව අගය කරන අතර ඔවුන්ගේ නිපුණතාවය සහ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද සමාගමේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා සැබවින්ම උපකාරී වී ඇත.

**ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර මහතා**
සභාපති, විගණන කමිටුව

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂවරු 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික වාර්තාව සතුටින් ඉදිරිපත් කරති.

**සමාගමේ නෛතික තත්ත්වය**

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාරික ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී. එය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති අතර නව ලියාපදිංචි අංකය පීබී 1319 වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑගල දඹුල්ල පාරේ අංක 80 දරන ස්ථානයේ පිහිටා ඇත. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම තනි කොටස්කරුවෙකුගෙන් යුත් සමාගමක් වන අතර ශ්‍රී ලංකා ජනරජයේ භාණ්ඩාගාර ලේකම් එහි එකම කොටස්කරු වේ.

**ප්‍රධාන කටයුතු සහ ව්‍යාපාරයේ ස්වභාවය**

සමාගමේ ප්‍රධාන වගා කටයුතු ලෙස පොල්, රබර්, අනෙකුත් බෝග සහ අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන වගා කිරීම, නිෂ්පාදනය සහ අලෙවිය 2023 වර්ෂය තුළ අඛණ්ඩව සිදු කරන ලදී. සමාගමේ ඉඩම් කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර දිස්ත්‍රික්ක තුළ අත්තනගල්ල, දඹදෙණිය, දොඩංගස්ලන්ද, හිරියාල, කුරුණෑගල, කටුගම්පොල සහ නාරම්මල යන ප්‍රදේශවල වතු 07 ක ව්‍යාප්තව ඇත.

**ඉඩම් ප්‍රමාණය**

ජාතික අවශ්‍යතා සහ ව්‍යවස්ථායීය ප්‍රකාශ සඳහා ඉඩම් නිදහස් කිරීම හේතුවෙන් සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමට ඵලදායී ඉඩම් විශාල ප්‍රමාණයක් අහිමි වී ඇත. 1992 වර්ෂයේ දී සමාගම පිහිටුවීමත් සමඟ සමාගමට මුලින් පවරා දුන් හෙක්ටයාර 6,722 ක ඉඩමෙන් 26% (හෙක්ටයාර 1,750.88) කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල වැවිලි සමාගමට අහිමි වී ඇත. 2023 මූල්‍ය වර්ෂය අවසානයේ, සන්තකයේ ඇති මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 4,971.12 කි.

| පළාත් වතුවල ඉඩම් ප්‍රමාණ | ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|
| අත්තනගල්ල | 1,114.53 |
| දඹදෙනිය | 462.18 |
| දොඩන්ගස්ලන්ද | 690.73 |
| හිරියාල | 980.21 |
| කටුගම්පල | 617.12 |
| කුරුණෑගල | 555.80 |
| නාරම්මල | 550.55 |
| | **4,971.12** |

**නිෂ්පාදන සමූහය**

වතුයාය හතෙහිම ප්‍රධාන බෝගය පොල් වන අතර රබර් වගාව අත්තනගල්ල සහ දොඩන්ගස්ලන්ද ප්‍රදේශවල වතුවලට පමණක් සීමා වී තිබුණි. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම විසින් භූමිය සහ දේශගුණික යෝග්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පොල් යටතේ අතුරු බෝග ලෙස තවත් බෝග වර්ග රාශියක් නඩත්තු කරයි.

**අඛණ්ඩ පැවැත්ම**

දුරදක්නා අනාගත කාලයක් පුරා සමාගමේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි සමාගම සතුව පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වේ. ඒ අනුව, ගිණුම් වාර්තා අඛණ්ඩ පැවැත්ම සංකල්පය යටතේ පිළියෙළ කර ඇත.

**මූල්‍ය ප්‍රකාශන සහ විගණක වාර්තාව**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද, අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් තැබූ මූල්‍ය ප්‍රකාශන සහ එම කාලයට අදාළ විගණක වාර්තාව පිටු අංක 35 සිට 38 දක්වා ඇතුළත් කර ඇත.

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්තාවේ පිටු අංක 43 සිට 57 දක්වා වැඩිදුරටත් විස්තාරනය කර ඇත. ඉකුත් වර්ෂයේ අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති කිසිදු වෙනසක් නොමැතිව මේ වර්ෂයේ දී ද උපයෝගී කර ගෙන ඇත.

**ආදායම**

සමාගමේ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව 5% ක පහත වැටීමක් පෙන්නුම් කරන ලදී. ආදායමේ සංයුතිය පහත පරිදි වේ;

| | 2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන | වැඩිවීම/(අඩුවීම)<br>% |
|---|---|---|---|
| පොල් | 812 | 875 | (7) |
| රබර් | 43 | 54 | (21) |
| වෙනත් මූලාශ්‍ර | 156 | 135 | (15) |
| **එකතුව** | **1,011** | **1065** | **(5)** |

**බදු පෙර ලාභය සහ බදු පසු ලාභය**

2023 වර්ෂයේ සමාගමේ මුළු ආදායම රුපියල් මිලියන 1,011 ක් විය (2022 වර්ෂයේ දී මුළු ආදායම රුපියල් මිලියන 1,065 ක් විය). වර්ෂයේ වෙනත් මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 86 ක් විය (2022 වර්ෂයේ දී වෙනත් මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 65 ක් විය). 2023 වර්ෂයේ සමාගමේ බදු පෙර ලාභය රුපියල් මිලියන 534.4 ක් විය (2022 වර්ෂයේ දී බදු පෙර ලාභය රුපියල් මිලියන 511.5 ක් විය). සමාගමේ මූල්‍ය ප්‍රතිඵල විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

| | 2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන |
|---|---|---|
| පොල්වලින් උපයන ලද ලාභය | 375 | 421 |
| රබර්වලින් ලැබූ ලාභය / (පාඩුව) | (0.1) | 14 |
| වෙනත් මූලාශ්‍රවලින් උපයන ලද ලාභය | 72 | 80 |
| **දළ ලාභය** | **447** | **515** |
| ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ වටිනාකම මත ලැබූ ලාභය | 62 | 35 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 86 | 65 |
| පරිපාලන වියදම් | (226) | (223) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබූ ලාභය | 369 | 393 |
| මූල්‍ය ආදායම | 212 | 154 |
| මූල්‍ය වියදම | (47) | (36) |
| බදු පෙර ලාභය | 534 | 511 |
| ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු වියදම | - | - |
| ආදායම් බදු වියදම | (57) | (39) |
| **වර්ෂය සඳහා ලාභය** | **476** | **472** |

**පොල් අංශය**

2023 වර්ෂය අවසානය වන විට, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සතුව ඇති ඵල දරන පොල් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 3,048.03 ක් වන අතර වර්තමානයේ පොල් යටි වගා ප්‍රමාණය හෙක්ටයාර් 589.18 ක් හෙවත් ඵල දරන පොල් ඉඩම් ප්‍රමාණයෙන් 16% ක ප්‍රමාණයකි. යහපත් කාෂිකාර්මික පිළිවෙත් අනුව, අක්කරයක පැවතිය යුතු පොල් ගස් සංඛ්‍යාව 60 ක් වන අතර ඒ සමඟ සැසඳීමේ දී, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ පොල් වතු අක්කරයක ඇති පොල් ගස් සංඛ්‍යාව 60 කි. 2005 ජනවාරි 01 දින සමාගමේ කළමනාකාරිත්වය රජයට පවරා ගන්නා විට අක්කරයක පැවති පොල් ගස් ප්‍රමාණය වූ 50 සිට අක්කරයක පැවති පොල් ගස් ප්‍රමාණය වැඩි වී ඇති බව සඳහන් කළ යුතුය. 2005 වසරේ සිට පොල් අස්වැන්න ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් 2012 වසරේදී ගෙඩි මිලියන 18.1 ක උපරිම මට්ටම වාර්තා කරන ලදී. කෙසේ වුවද, 2013 වර්ෂයේ දී, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සහ අනෙකුත් වගාකරුවන්ට පොල් අස්වැන්නේ සැලකිය යුතු පසුබෑමකට මුහුණ දීමට සිදු වුණු අතර කුරුණෑගල වැවිලි සමාගමේ පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 13.0 දක්වා පහත වැටුණි. තවද, 2014 වර්ෂයේ දී සමාගම ගෙඩි මිලියන 16.7 ක නිෂ්පාදනයක් වාර්තා කරන ලද අතර, 2015 වර්ෂයේ දී ගෙඩි මිලියන 14.1 ක නිෂ්පාදනයක් ද, 2016 වර්ෂයේ දී ගෙඩි මිලියන 16.7 ක නිෂ්පාදනයක් ලෙසින් පොල් නිෂ්පාදනය ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, 2017 වසරේදී නිෂ්පාදනයේ කැපී පෙනෙන පහත වැටීමක් වාර්තා කරමින් ගෙඩි මිලියන 10.6 ක් දක්වා පහළ බැස තිබුණු අතර එය කුරුණෑගල වැවිලි සමාගම් ඉතිහාසයේ වාර්තා වූ අඩුම නිෂ්පාදනය විය. 2023 වසරේ පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 12.9 ක් වාර්තා කරන ලදී.

එසේ වුවත් 2022 වසරට සාපේක්ෂව නිෂ්පාදනයේ 16% ක පහත වැටීමක් වාර්තා වන අතර 2023 වසර සඳහා ගෙඩියක ශුද්ධ විකුණුම් සාමාන්‍යය රුපියල් 63.68 ක් විය. මෙම තත්ත්වය පැවතීම මගින් පොල් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 63 කින් අඩු වී තිබුණි.

**රබර් අංශය**

2023 වසර අවසානය වන විට, සමාගම සතුව පරිණත රබර් වගා හෙක්ටයාර 156.92 ක් සහ නොමේරූ රබර් වගා හෙක්ටයාර 4.34ක් පැවතුණි. අඩු ශුද්ධ විකිණුම් සාමාන්‍යයක් පැවතීම හේතුවෙන් රබර් වගාව දීර්ඝ කාලයක් මුළුල්ලේ ආකර්ෂණීය නොවන අංශයක් විය. රබර් අංශය රුපියල් මිලියන 0.19 ක පාඩුවක් ලබා තිබුණු අතර එය 2022 වර්ෂයේ දී රුපියල් මිලියන 14 ක ලාභයක් ලබා ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී ශුද්ධ විකිණුම් සාමාන්‍යය කිලෝග්‍රෑමයකට රු. 497 දක්වා වැඩි වී තිබේ. (2022 වර්ෂයේ දී ශුද්ධ විකිණුම් සාමාන්‍යය රු. 567 ක් විය).

මීට අමතරව, පැරණි හෝ අඩු අස්වැන්න සහිත රබර් වගා උදුරා දැමීම සහ අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් රබර් ක්ෂීර අස්වනු නෙලා ගන්නා දින ගණන අඩු කිරීම හේතුවෙන් සමාගමේ රබර් නිෂ්පාදනය ක්‍රමයෙන් පහත වැටී ඇත. 2022 වර්ෂයේ නිෂ්පාදනය වූ කිලෝග්‍රෑම් 95,572 ට සාපේක්ෂව 2023 වර්ෂයේ දී නිෂ්පාදනය කිලෝග්‍රෑම් 85,350 ක් විය. ඵලදායිත්වය අඩු රබර් වගා ඉහළ අස්වැන්නක් සහිත සුළු අපනයන බෝග සමඟ විවිධාංගීකරණය කිරීමට යොදා ගනු ලබයි. කුරුඳු සහ ගම්මිරිස් වැනි බෝගවල වර්ධන හැකියාව සහ වෙළඳපොළ ලාභදායිත්වය පිළිබඳව සැලකිල්ලට ගෙන එම බෝග සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී. ඇතැම් භූමි ප්‍රදේශ තනි බෝගයක් නිපදවන හෝ වගා කරන තනි බෝග වගාව සඳහා ද යොදවාගෙන ඇත.

**වෙනත් බෝග**

සමාලෝචිත වර්ෂය තුළ අතුරු බෝග වගාව සහ වෙනත් ආදායම් වගාවලින් අපගේ ආදායම සඳහා රුපියල් මිලියන 86.6 ක දායකත්වයක් ලැබී තිබුණි. සමාගම විසින් අනුගමනය කළ දූරදර්ශී ක්‍රමෝපාය මෙම අංශයේ ඉහළ සාර්ථකත්වයට හා ලාභදායිත්වයට හේතු වී ඇත. මේ සම්බන්ධයෙන් මෑත අතීතයේ දී ගනු ලැබූ එක් තීරණාත්මක ක්‍රමෝපායික පියවරක් වූයේ සමාගමේ ආදායමෙන් දළ වශයෙන් 80% ක පමණ දායකත්වයක් ලබා දෙන ප්‍රධාන බෝගය වන පොල් වගාව මත යැපීම අවම කිරීම සඳහා අතුරු බෝග වගා කිරීම සඳහා බෝග විවිධාංගීකරණය කිරීම මහා පරිමාණයෙන් ආරම්භ කිරීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අතුරු බෝගවලින් අමතර ආදායමක් උපයා ගන්නා අතරම ඉඩම් ඒකකයකින් ලැබෙන ආදායම උපරිම කර ගැනීමට අපට හැකි වී තිබේ.

කළු ගම්මිරිස්, අඹ, රඹුටන් වැනි අතුරු බෝග මෙම ආදායමට විශාල දායකත්වයක් ලබා දී ඇත. අතුරු බෝග වගාවෙන් ලබා ගත හැකි වෙනත් ප්‍රතිලාභ ද වේ. අතුරු බෝග වගාව ජෛව විවිධත්වය ඇති කිරීම සම්බන්ධයෙන් සාධනීය බලපෑමක් සිදු කර තිබුණි. පවතින වගා ක්‍රම එහි අඩු වියදම් අලෙවිකරණ ප්‍රවේශයට සමගාමීව වැඩිදියුණු කිරීමේදී, කුරුණෑගල වැවිලි සමාගම මගින් තක්සේරු කිරීම මගින් ආර්ථිකමය වශයෙන් වාසිදායක බව තහවුරු වන අතුරු බෝග අස්වැන්න බදු දීමේ ක්‍රමය හඳුන්වා දෙන ලදී. එමඟින්, අස්වනු නෙලීමේ සහ විකිණීමේ වගකීම ගැණුම්කරු වෙත පවරනු ලබන අතර පසු අස්වනු හානි සිදු වීමේ අවදානම අවම කිරීමට ද මෙමඟින් සමාගමට හැකියාව ලැබී ඇත.

**ප්‍රාග්ධන වියදම් සහ ආයෝජන**

සමාගම මගින් වසර ගණනාවක් තුළ ප්‍රාග්ධන සංවර්ධනය සඳහා සැලකිය යුතු මුදලක් ආයෝජනය කර ඇති අතර එයට පොල් සහ අතුරු බෝග ව්‍යාප්ත කිරීම සහ නොමේරූ අවධියේ පවතින වැවිලි නඩත්තු කිරීම ද ඇතුළත් වේ. සමාලෝචිත මුදල් වර්ෂය තුළ රුපියල් මිලියන 407.92 ක් සමාගමේ ස්ථාවර වත්කම්වල ආයෝජනය කර ඇති අතර එයින් ආසන්න වශයෙන් රුපියල් මිලියන 201.41 ක් නොමේරූ වැවිලි සඳහා ආයෝජනය කරන ලදී.

**මූල්‍ය තත්ත්ව ව්‍යූහය**

මූල්‍ය තත්ත්ව ව්‍යූහය ශක්තිමත් කරමින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු වත්කම් ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර, සමාලෝචිත මුදල් වර්ෂය තුළදී මුළු වත්කම් ප්‍රමාණය රු. මිලියන 170 කින් වැඩි වී ඇත. දේපළ, පිරියත සහ උපකරණ සඳහා රුපියල් මිලියන 275 ක ආයෝජනයක්, පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්වල ශුද්ධ වැඩිදියුණු කිරීම රුපියල් මිලියන 57 කින් වැඩි වී ඇති අතර සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 3,862 ක මුළු වත්කම් ප්‍රමාණයක් පවතී.

**ද්‍රවශීලතා කළමනාකරණය**

කෙටි කාලීන ආයෝජන වැඩිවීම හේතුවෙන් සමාගමේ ශුද්ධ කාරක ප්‍රාග්ධනය රුපියල් මිලියන 967 (2022 වර්ෂයේ දී රු. මිලියන 1,041) ක් බවට පත් වී ඇත. 2023 වර්ෂයේදී මුදල් සහ කෙටි කාලීන ආයෝජනය රුපියල් මිලියන 890.2 ක් වූ අතර 2022 වර්ෂයේ දී එය රු. මිලියන 1,066 ක් බවට පත් වී ඇත. 2022 වර්ෂයේ රු. මිලියන 875 ක් වූ සමාගමේ කෙටි කාලීන ආයෝජන ප්‍රමාණය 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,000 කට අධික ප්‍රමාණයක් වශයෙන් වාර්තා විය. රාජ්‍ය බැංකුවල කාලීන තැන්පතුවලින් සමන්විත මෙම ආයෝජන පහත දක්වා ඇති පරිදි වේ.

| | 2023.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|
| මාස 03 ක් තුළ කල් පිරෙන | | |
| කාලීන තැන්පතු - ලංකා බැංකුව | - | - |
| මාස 03 කට පසුව කල් පිරෙන | | |
| කාලීන තැන්පතු - ලංකා බැංකුව | 250,200,000 | 200,000 |
| කාලීන තැන්පතු - මහජන බැංකුව | 400,000,000 | 600,000,000 |
| කාලීන තැන්පතු - ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 225,000,000 | 400,000,000 |
| **එකතුව** | **875,200,000** | **1,000,200,000** |

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

මෙයින් අදහස් වන්නේ කොටස් නිකුත් කිරීමට අදාළව සමාගමට ලැබුණු මුළු මුදලයි. 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 200,000,010 කි. සාමාන්‍ය කොටස් 20,000,000 ක් සහ ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාර ලේකම්වරයා සතු ස්වර්ණමය කොටස් 01 කින් මෙය සමන්විත වේ. වර්ෂය තුළ කිසිදු කොටස් වෙන් කිරීමක් සිදු කර නොමැත.

**සංචිත**

2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ සංචිත පහත දක්වා ඇති පරිදි වේ.

| | 2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන |
|---|---|---|
| රඳවාගත් ඉපයීම් | 2,503 | 2,314 |
| ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු සංචිත | 517 | 455 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 122 | 115 |
| වෙනත් සංචිත | 70 | 99 |
| | **3,413** | **3,185** |

**ලාභාංශ ගෙවීම**

බොහෝ රාජ්‍ය ආයතන මහා භාණ්ඩාගාරයට වැය බරක් වී ඇති අවධියක, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ස්වයං මූල්‍ය ආයතනයක් බවට සාර්ථකව පරිවර්තනය වීමට අමතරව, ස්වර්ණමය කොටස්කරු වන මහා භාණ්ඩාගාරයට ලාභාංශ ගෙවීම මගින් එහි වගකීම ද මනාව ඉටු කර ඇත. ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ ද, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය කළමනාකරණය යටතේ ස්වයං මූල්‍ය රාජ්‍ය ව්‍යවසායක් වශයෙන් අඛණ්ඩව කටයුතු කර ඇති බව අපි සාඩම්බරයෙන් ප්‍රකාශ කරමු. 2005 වර්ෂයේ දී සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ කළමනාකාරීත්වය රජයට පවරා ගැනීමෙන් පසුව, සමාගම් ඉතිහාසයේ පළමු වතාවට සමාගම විසින් ලාභාංශ ගෙවන ලද්දේ 2007 වර්ෂයේ දීය. 2007 වර්ෂයේ සිට මේ දක්වා ලාභාංශ වශයෙන් මහා භාණ්ඩාගාරය වෙත ගෙවා ඇති මුළු මුදල රු. මිලියන 807.5 කි. 2023 මූල්‍ය වර්ෂය සඳහා රු. මිලියන 115 ක් ගෙවීමට අපේක්ෂා කෙරේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය පහත දක්වා ඇත.

| නම | තනතුර | පත් කරන ලද දිනය |
|---|---|---|
| කේ.ජී.ජී.එෆ්. ජෙනට් ජයවර්ධන මහත්මිය | සභාපතිනිය | 2022/10/06 |
| අමිතා දොඩන්වල මහත්මිය | අධ්‍යක්ෂ | 2024/03/01 |
| ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර මහතා | අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත | 2022/03/02 |
| ඩබ්ලිව්.ජේ.ජී.ඩී. විජේසිංහ මහතා | අධ්‍යක්ෂ | 2020/01/15 |
| කේ.ජී.එන්. රංගල මහතා | අධ්‍යක්ෂ | 2023/09/21 |
| ටී.ඩී.එම්.පී. බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ | 2024/03/01 |
| ඩී.සී.ජේ. ප්‍රේමතිලක මහතා | අධ්‍යක්ෂ | 2024/03/01 |

**කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධය**

අධ්‍යක්ෂවරුන් සෘජුව හෝ වක්‍රව හෝ සමාගමේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කිසිඳු ආකාරයක සම්බන්ධයක් ඇති කරගෙන නොමැත.

**අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම**

සමාගමේ කිසිදු අධ්‍යක්ෂවරයෙකු හෝ ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ සමාගමේ කිසිඳු කොටසක් සඳහා හිමිකම් නොදරයි.

**විගණන කමිටු**
**වත්මන් විගණන කමිටු - වර්ෂය - 2023/2024**

| නම | මණ්ඩලය පත්කල දිනය |
|---|---|
| **ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර මහතා**<br>සභාපති විගණන කමිටුව<br>අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත. | 31.03.2022 |
| **අමිතා දොඩන්වල මහත්මිය** - අධ්‍යක්ෂ<br>(අතිරේක ලේකම් - රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය) | 25.04.2024 |
| **කේ.ජී.එන්. රංගල මහතා** - අධ්‍යක්ෂ | 25.03.2024 |

**සේවා නියුක්තිය**

සේකයන්ට සැලකීමේ දී, සමාගම සමානාත්මතා සංකල්පය මත ක්‍රියා කිරීමට සැම විටම ක්‍රියා කරයි. මෙම මූලධර්ම විශේෂිත තේරීම්, පුහුණුව, සංවර්ධනය සහ ප්‍රවර්ධන ප්‍රතිපත්තිවල අන්තර්ගත කර ඇති අතර, එමඟින් සියළු තීරණ කුසලතා මත පදනම් වන බව සහතික කරයි. සමාගම මගින් වාර්ගික සම්භවය, ආගම, දේශපාලන මතය, ස්ත්‍රී පුරුෂ භාවය, විවාහක අවිවාහක තත්ත්වය හෝ ශාරීරික ආබාධිතභාවය පිළිබඳව නොසලකා සියළුම සේවකයින් සඳහා සමාන අවස්ථා ලබා දීමට කටයුතු කරයි.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය උපරිම දැනුම අනුව සමාගම විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත සියළුම බදු, තීරුබදු සහ අයබදු සහ සමාගමේ සේවකයින් වෙනුවෙන් සහ සේවකයන්ට අදාළව ගෙවිය යුතු සියළුම දායක මුදල්, අයබදු සහ බදු සහ අනෙකුත් පිළිගත් ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කර අවසන් කර ඇති බවට සමාගම සහතික කරයි.

**මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්**

මෙම වාර්තාවේ අනාවරණය කර ඇති සිදුවීම් හැර, මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනයේ සිට මෙම වාර්තාව ඉදිරිපත් කරන දිනය දක්වා ගිණුම් ප්‍රකාශන කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කෙරෙන වෙනත් කිසිදු සිදුවීමක් පිළිබඳව වාර්තා වී නොමැත.

**විගණකවරු**

2023 වර්ෂය සඳහා ගිණුම් විගණනය විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

**මූල්‍ය ප්‍රකාශන**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 පෙබරවාරි 29 දින අනුමත කර ඇත. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීම සඳහා කේ.ජී.ජී.එෆ්. ජෙනට් ජයවර්ධන මහත්මිය (සභාපතිනිය) සහ ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර මහතා (අධ්‍යක්ෂ / භාණ්ඩාගාර නියෝජිත) වෙත බලය පවරා ඇත.

**වාර්ෂික මහා සභා රැස්වීම**

කුරුණෑගල - 09 දඹුල්ල පාරේ අංක 80 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන කාර්යාලයේ දී 2024 අගෝස්තු 29 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව. 11.30 ට වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වේ. වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම මෙහි අමුණා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

**කේ.ජී.ජී.එෆ්. ජෙනට් ජයවර්ධන මහත්මිය**
සභාපතිනිය

**ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර මහතා**
අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත

**කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්**
සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ ලේකම්වරු

2024 ජූලි 20

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පහත ප්‍රකාශයේ දක්වා ඇත. 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානවලට අනුව පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකවරුන්ට අදාළ වන සියළුම වගකීම් විගණකවරුන්ගේ වාර්තාවේ දක්වා ඇත.

**මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරුණු:**

මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ ලාභ හා අලාභ පිළිබඳව සත්‍ය සහ සාධාරණ ලෙස පිළිබිඹු වන අයුරින් පිළියෙළ කළ විස්තීරණ ආදායම් ප්‍රකාශය සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයට අනුකූලව, මූල්‍ය වර්ෂය අවසානයේ දී සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ ලෙස පිළිබිඹු වන අයුරින් පිළියෙළ කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය. අධ්‍යක්ෂවරුන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී පහත දැක්වෙන කරුණු සහතික කළ යුතුව ඇත.

- යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන ඒවා ස්ථාවර ආකාරයෙන් භාවිතා කර ඇති අතර වැදගත් අපගමන සිදු වී ඇත්නම්, ඒවා සවිස්තරාත්මකව අනාවරණය කිරීමට කටයුතු කිරීම;
- අදාළ වන පරිදි සියළුම අදාළ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර ඇත;
- සාධාරණ සහ විචක්ෂණශීලී විනිශ්චයන් සහ ඇස්තමේන්තු සිදු කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සමාගමේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව ඇති බව සහතික කිරීම සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගැනීම සාධාරණීකරණය කිරීමට ද අධ්‍යක්ෂවරුන් කටයුතු කළ යුතුය. තවද, සමාගම ප්‍රමාණවත් ගිණුම් වාර්තා සාධාරණ නිරවද්‍යතාවයකින් පවත්වාගෙන යන බව සහ සමාගමේ මූල්‍ය තත්ත්වය සහතික කිරීමේ වගකීම ද අධ්‍යක්ෂවරුන් වෙත පැවරී ඇති අතර, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වන බව සහතික කිරීමේ වගකීම ද අධ්‍යක්ෂවරුන් වෙත පැවරී ඇත. සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට පියවර ගැනීම සහ මේ සම්බන්ධයෙන් වංචා සහ අනෙකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කිරීම පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්වීම ද අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු අතර සහ විගණකවරුන්ට අවශ්‍ය පියවර ගැනීමට සහ ඔවුන්ගේ විගණන මතය ප්‍රකාශ කිරීමට හැකි වන පරිදි සුදුසු යැයි සලකනු ලබන ඕනෑම තක්සේරුවක් පිළිගැනීමට සෑම අවස්ථාවක්ම විගණකවරුන්ට ලබා දීම අවශ්‍ය වේ. සමාගම් පනතට අනුව, වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීම සඳහා නියම කර ඇති දිනට වැඩකරන දින 15 කට නොඅඩු කාලයකට පෙර වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව සමාගමේ සෑම කොටස් හිමියෙකු වෙතම යැවීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය. මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි, ඔවුන් තම වගකීම් ඉටු කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

**අනුකූලතා වාර්තාව**

අධ්‍යක්ෂවරුන් විසින් ස්වකීය උපරිම දැනුම අනුව, ගිණුම් වාර්තා ඉදිරිපත් කරන දිනය වන විට සමාගම විසින් ගෙවිය යුතු සියළුම බදු, තීරුබදු සහ අයබදු සහ සමාගමේ සේවකයන් වෙනුවෙන්, ඔවුන්ට අදාළව ගෙවිය යුතු සියළුම දායක මුදල්, අයබදු සහ බදු සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් සියලු ම ව්‍යවස්ථාපිත ගෙවීම් ලබා දී ඇති බව හෝ ගෙවීම සඳහා ගිණුම් තුළ අවශ්‍ය වෙන් කිරීම් සිදු කර ඇති බව තහවුරු කරයි.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි**



සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්.)සමාගම

ලේකම්වරු - සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම, කුරුණෑගල

2024 ජූලි 20 වන දින

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්/සී/කේපීඑල්/01/2023/02

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 ජූලි 23 දින

සභාපති
කුරුණෑගල වැව්ලි සමාගම

**කුරුණෑගල වැව්ලි සමාගමෙහි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කුරුණෑගල වැව්ලි සමාගමෙහි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

කහ වගාව සඳහා 2020 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ සඳහා ගෙවන ලද එකතුව රු.8,432,049 ක් ගිණුම්ගත කර තිබුණ ද මෙම වියදම ගැලපුම් සංකල්පයට අනුව දරන ලද වර්ෂයන්වල උපයන ලද ආදායමට එරෙහිව කපාහැරීම නොකර ජංගම වත්කම් වල සටහන් කර තිබීම නිසා ජංගම වත්කම් හා සමුච්චිත ඉපයීම් එම අගයෙන් අධිගණනයවී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2.අ,ආ හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| 2010 දෙසැම්බර් 01 දිනැති අංක KP/2010/22 දරන අභ්‍යන්තර චක්‍රලේඛය | පළාත් වතු කාර්යාලවල මුදල් ලැබීම් වටිනාකම රු.50,000 ඉක්මවන අවස්ථාවලදී එම මුදල් කඩිනමින් බැංකු ගත කල යුතු වුවද නාරම්මල හා දඹදෙනිය පළාත් වතු කාර්යාල භෞතික පරීක්ෂාවේදී අතැති මුදල් ශේෂය පිළිවෙළින් රු.278,923ක් හා රු.265,330ක් වී තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**2.3 වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) 2023 දෙසැම්බර් 31 දිනට පොල් නිෂ්පාදන ණයගැති ශේෂය වූ රු.63,510,576 ක් තුළ අවුරුදු 03 හා 08 ඉක්මවූ පිළිවෙළින් රු. 1,688,527 ක සහ රු. 4,677,838 ක ණයගැති ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගෙන නොතිබුණි

(ආ) හිරියාල පළාත් වතු කාර්යාලයට අයත් වතු 07 ක සවිකිරීමට 2023 දෙසැම්බර් මාසයේ මිලදීගෙන තිබුණු රු.974,500 ක් වටිනා CCTV කැමරා උපකරණ, අරමුණුගත කාර්යය සඳහා යොදා නොගෙන හා ස්ථාවර වත්කම් ලේඛනයට ද ඇතුළත් නොකර ගනේවත්ත ගබඩාව තුළ පැවැති බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| ආදායම | 4 | 1,010,951,819 | 1,065,494,048 |
| විකුණුම් පිරිවැය | 5 | (563,224,713) | (549,558,623) |
| දළ ලාභය | | 447,727,106 | 515,935,425 |
| ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ වටිනාකම මත ලාභය / (අලාභය) | 16.2 | 62,300,502 | 35,448,638 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 6 | 86,139,304 | 65,261,823 |
| පරිපාලන සහ සාමාන්‍ය වියදම් | 7 | (226,833,617) | (223,251,034) |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද ලාභය** | | **369,333,295** | **393,394,852** |
| ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම්) | 8 | 165,097,450 | 118,144,550 |
| **බදු ගෙවීමට පෙර ලාභය** | | **534,430,745** | **511,539,402** |
| ආදායම් බදු වියදම් | 9 | (57,820,389) | (39,164,963) |
| **වර්ෂය සඳහා ලාභය** | | **476,610,356** | **472,374,439** |
| | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම ආයුගණක ලාභ / (අලාභ) | | (29,036,813) | 18,654,998 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 6,210,036 | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **453,783,579** | **491,029,437** |
| **කොටසක් සඳහා ඉපැයීම්** | **10** | **23.83** | **23.62** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයකි.

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| භාවිත කිරීමේ අයිතිය ඇති ඉඩම | 11 | 56,152,820 | 58,767,078 |
| නිශ්චල බදු වත්කම් (හිස් ඉඩම් හැර) | 12 | 7,937,067 | 10,560,635 |
| දේපළ, පිරියත සහ උපකරණ | 13 | 2,235,123,905 | 1,960,092,523 |
| පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් | 14 | 345,641,117 | 288,723,832 |
| වෙනත් මූල්‍ය වත්කම් | 15 | 20,212,000 | 19,449,229 |
| | | **2,665,066,909** | **2,337,593,297** |
| **ජංගම වත්කම්** | | | |
| ධාරක ජීව විද්‍යාත්මක වත්කම් මත නිෂ්පාදනය | 16.1 | 24,528,771 | 18,932,784 |
| ඉන්වෙන්ටරි | 16.3 | 117,376,162 | 76,068,029 |
| තැන්පතු | 17 | 4,691,770 | 4,122,470 |
| කලින් ගෙවීම් | 18 | 2,753,537 | 2,688,692 |
| කෙටි කාලීන ව්‍යාපෘති සඳහා කලින් ගෙවූ වියදම් | 19 | 12,182,275 | 10,245,115 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් | 20 | 133,771,319 | 164,772,917 |
| වෙනත් මූල්‍ය වත්කම් | 15 | 12,075,211 | 11,179,534 |
| කෙටි කාලීන ආයෝජන | 21 | 875,200,000 | 1,000,200,000 |
| මුදල් සහ බැංකු ශේෂය | 22 | 15,051,304 | 66,682,758 |
| | | 1,197,630,349 | 1,354,892,300 |
| **මුළු වත්කම්** | | **3,862,697,258** | **3,692,485,597** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 23 | 200,000,010 | 200,000,010 |
| රඳවාගත් ඉපැයුම් | | 2,503,650,509 | 2,314,340,656 |
| ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු සංචිතය | | 517,452,741 | 455,152,239 |
| ප්‍රත්‍යාගණන සංචිතය වාහනය | | 122,089,610 | 115,879,574 |
| වෙනත් සංචිත | | 70,647,014 | 99,683,827 |
| | | **3,413,839,884** | **3,185,056,305** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 24 | 145,755,645 | 117,802,881 |
| බදු දීමනාකරුට ශුද්ධ වගකීම | 25 | 72,954,822 | 76,520,026 |
| විලම්භිත බදු වගකීම | 26 | - | - |
| | | **218,710,467** | **194,322,907** |
| **ජංගම වගකීම්** | | | |
| බදු දීමනාකරුට ශුද්ධ වගකීම | 25 | 3,565,204 | 3,565,204 |
| ලැබුණු අත්තිකාරම් | 27 | 5,877,704 | 10,738,353 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 31,672,908 | 18,388,943 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 28 | 189,031,092 | 280,413,885 |
| | | 230,146,908 | 313,106,385 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **3,862,697,258** | **3,692,485,597** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයක් වේ.
2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවට සහතික කර ඇත.

**ඩී.අයි.කේ. දිසානායක**
කළමනාකරු - මූල්‍ය

**එස්.එම්.එම්. සමරකෝන්**
ප්‍රධාන විධායක නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.
සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

**කේ.ජී.ජී.එෆ්.ජේ. ජයවර්ධන**
සභාපති
2024 පෙබරවාරි 29 කුරුණෑගල

**ඩබ්ලිව්.එම්.ඩී. විජේබණ්ඩාර**
අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. | දැව සංචිතය රු. | වෙනත් සංචිත රු. | ප්‍රත්‍යාගණන සංචිතය රු. | රඳවාගත් ඉපැයුම් රු. | මුළු හිමිකම් රු. |
|---|---|---|---|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට ශේෂය | **200,000,010** | 419,703,601 | 81,028,828 | 115,879,574 | 2,002,414,854 | 2,819,026,867 |
| 2022 වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | | | | 472,374,439 | 472,374,439 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | 18,654,998 | | - | 18,654,998 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | | - | | - |
| ජීව විද්‍යාත්මක වත්කම් සංචිතයට මාරු කරන ලදී. | | 35,448,638 | | | (35,448,638) | - |
| ලාභාංශ | | | | | (125,000,000) | (125,000,000) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | 455,152,239 | 99,683,826 | 115,879,574 | 2,314,340,655 | 3,185,056,304 |
| 2023 වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | | | | 476,610,356 | 476,610,356 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | (29,036,813) | | - | (29,036,813) |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | | 6,210,036 | | 6,210,036 |
| ජීව විද්‍යාත්මක වත්කම් සංචිතයට මාරු කරන ලදී. | | 62,300,502 | | | (62,300,502) | |
| ලාභාංශ | | | | | (225,000,000) | (225,000,000) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | 517,452,741 | 70,647,013 | 122,089,610 | 2,503,650,509 | 3,413,839,883 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| ආදායම් බදු වියදමට පෙර ලාභය | 534,430,745 | 511,539,402 |
| ගැළපීම් | | |
| ක්ෂය කිරීම් සහ ක්‍රමක්ෂය කිරීම් | 92,614,886 | 84,162,950 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන | 30,297,366 | 20,326,144 |
| බොල් සහ අඩමාන ණය හානිකරණය | - | 5,076,634 |
| දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ලද ලාභය | (14,883) | (3,494) |
| පැළ විකිණීමෙන් ලද ලාභය (ඵල දරණ පැළ අලෙවියෙන් ලද ලාභය) | (41,173,432) | (29,839,522) |
| දැව ගස් විකිණීමෙන් ලද ලාභය | (7,688,488) | (2,775,095) |
| සාධාරණ වටිනාකම විකිණීම සඳහා දරන ලද පිරිවැයෙන් අඩු කිරීමෙන් ඇති වන වෙනස්වීම්වලින් ඇති වූ ලාභය - පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් | (62,300,502) | (35,448,638) |
| ශුද්ධ මූල්‍ය ආදායම | (165,097,450) | (118,144,550) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර ලාභය** | **381,068,242** | **434,893,833** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | |
| ඉන්වෙන්ටරි | (41,308,133) | 7,444,026 |
| තැන්පතු | (569,300) | (3,167,770) |
| කලින් ගෙවීම් | (64,845) | (898,869) |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | (5,400,297) | (37,546,231) |
| කෙටි කාලීන ව්‍යාපෘති සඳහා කලින් ගෙවූ වියදම් | (1,937,159) | 1,474,829 |
| ලැබුණු අත්තිකාරම් | (4,860,649) | 5,749,279 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | (91,382,793) | 39,452,347 |
| **මෙහෙයුම්වලින් ජනිත වූ මුදල්** | **235,545,066** | **447,401,443** |
| විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය ගෙවීම | (31,381,414) | (15,547,038) |
| ගෙවන ලද ආදායම් බදු | (32,931,920) | (26,369,023) |
| රඳවා ගැනීමේ බදු ගෙවීම | (11,604,504) | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්** | **159,627,228** | **405,485,382** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල්** | | |
| දේපළ, පිරියත සහ උපකරණවලට එකතු කිරීම | (356,513,005) | (211,006,620) |
| පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්වලට එකතු කිරීම් | (538,969) | (1,643,921) |
| දේපළ, පිරියත සහ උපකරණ අපහරණය කිරීමෙන් ලද ආදායම | 34,850 | 17,200 |
| පොල් සහ රබර් ගස් ඉවත් කිරීමෙන් ලද ආදායම | 41,709,091 | 30,642,008 |
| පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් විකිණීමෙන් ලද ආදායම | 8,014,687 | 5,564,780 |
| කාලීන තැන්පතු වල ශුද්ධ ආයෝජනය | 125,000,000 | (225,000,000) |
| ලැබුණු පොළී | 244,713,945 | 88,593,884 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල භාවිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **62,420,598** | **(312,832,669)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| ගෙවන ලද බදුකුලී | (47,020,833) | (37,161,500) |
| කෙටි කාලීන ණය ගැනීම් සඳහා පොළිය | - | - |
| කාර්ය මණ්ඩලය සඳහා ලබා දුන් ණය | (19,468,250) | (15,392,460) |
| කාර්ය මණ්ඩල ණය අයකර ගැනීම | 17,809,802 | 13,726,798 |
| ගෙවන ලද ලාභාංශ | (225,000,000) | (50,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල භාවිත කළ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(273,679,281)** | **(88,827,162)** |
| **මුදල් සහ මුදල් සමානතා වැඩි වීම / (අඩුවීම)** | **(51,631,454)** | **3,584,523** |
| | | |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමානතා | 66,682,758 | 63,098,236 |
| කාලසීමාව අවසානයේ මුදල් සහ මුදල් සමානතා (සටහන - ඒ) | 15,051,304 | 66,682,758 |

| **සටහන - ඒ** | **31.12.2023** | **31.12.2022** |
|---|---|---|
| මුදල් සහ මුදල් සමානතා | රු. | රු. |
| | | |
| මාස 03ක් ඇතුළත කල් පිරුණු කාලීන තැන්පතු | | |
| ලංකා බැංකුව | - | - |
| මහජන බැංකුව | - | - |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | - | - |
| ප්‍රති මිලදී ගැනීම් | 234,000,000 | 83,000,000 |
| බැංකුවේ ඇති මුදල් | (223,618,296) | (20,689,449) |
| අතැති මුදල් | 4,650,240 | 4,357,467 |
| තැපැල් ගාස්තු / මුද්දර | 19,360 | 14,740 |
| | **15,051,304** | **66,682,758** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයකි.

## 01. පොදු ප්‍රතිපත්ති

### 1.1 සමාගමේ නෛතික ස්වභාවය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම (KPL) 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හා රජයට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ස්ථාපනය කළ සීමිත පොදු සමාගමක් වන අතර, එය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑගල දඹුළු පාරේ, අංක 80 දරන ස්ථානයේ පිහිටා ඇත.

තනි කොටස්කාර සමාගමක් වන මෙම සමාගමේ තනි කොටස්කරු ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයයි.

### 1.2 ප්‍රධාන කටයුතු සහ ව්‍යාපාරයේ ස්වභාවය

අදාළ වර්ෂයේ දී සමාගමේ ප්‍රධාන කටයුතු ලෙස පොල්, රබර් සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන වගාකිරීම, නිෂ්පාදනය සහ විකිණීම සිදු කරන ලදී. කුරුණෑගල වැවිලි සමාගම වතුයාය 08 කින් සමන්විත වන අතර ඒවා කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ව්‍යාප්තව පවතී. එම වතුයාය වන්නේ,

- අත්තනගල්ල
- දඹදෙණිය
- දොඩම්ගස්ලන්ද
- කුරුණෑගල
- කටුගම්පල
- නාරම්මල
- හිරියාල

## 02. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 2007 අංක 07 දරන සමාගම් පනතෙහි නියමවලට අනුකූලව ඉදිරිපත් කර ඇත.

### 2.2 අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂවරුන් විසින් සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තක්සේරුවක් සිදුකරන ලද අතර ව්‍යාපාර කටයුතු අත්හිටුවීමේ හෝ ඇවර කිරීමේ හෝ අභිලාෂයක් නොමැති බවට තහවුරු වේ.

### 2.3 ඉදිරිපත් කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල දැක්වෙන පහත අයිතම හැර සියළුම ප්‍රමාණාත්මක අයිතම ඓතිහාසික පිරිවැයට දක්වා ඇති අතර මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙළ කර ඇත.

- ජනවසම / ශ්‍රී.ලං.රා.වැ.සං. හිස් බදු ඉඩම් හිමිකම ප්‍රත්‍යාගණනය කළ අගයට දක්වා ඇත. - සටහන් අංක 11
- පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් විකිණුම් පිරිවැය අඩු කර සාධාරණ අගය මත තක්සේරු කර ඇත. - සටහන් අංක 14
- විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ආයුගණක තක්සේරුවක් මත හඳුනාගෙන ඇත. (ශ්‍රී ලංකා ප්‍රමිත අංක 19) - සටහන් අංක 24
- ජීව විද්‍යාත්මක වත්කම්වලින් නෙළා ගත් කෘෂි බෝග අස්වැන්න ශුද්ධ උපලබ්ධිත වටිනාකම මත තක්සේරු කොට ඇත. ශුද්ධ උපලබ්ධිත අගය, ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් ඇස්තමේන්තුගත විකුණුම් වියදම් අඩු කිරීමෙන් ගණනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා කිසිදු ගැළපීමක් සිදු කර නොමැත.

### 2.4 ව්‍යවහාරික සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන සමාගමෙහි ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත. සියළු මූල්‍ය අයිතම ආසන්නතම රුපියලට වටිනාකම් කර ඇත.

### 2.5 ඇස්තමේන්තු සහ විනිශ්චය භාවිත කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS / LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වලට අදාළව විනිශ්චය, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගැනීම අවශ්‍ය වේ.

අදාළ විනිශ්චය සහ ඇස්තමේන්තු තත්ත්ව තුළ සාධාරණ යැයි හැඟෙන පූර්ව පළපුරුද්ද, ප්‍රවණතා සහ වෙනත් සාධක මත පදනම් වේ. ඒ අනුව, සැබෑ ප්‍රතිඵල, අදාළ විනිශ්චය සහ ඇස්තමේන්තුවලින් වෙනස් විය හැක.

වලංගුභාවය තහවුරු කර ගැනීම උදෙසා අදාළ ඇස්තමේන්තු සහ උපකල්පන නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්විම අදාළ සංශෝධනය සිදුකරන කාලපරිච්ඡේදයට හා ඉදිරියට බලපාන පරිදි හඳුනා ගැනේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදාගත්, මූල්‍ය ප්‍රකාශන සඳහා

ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරන වටිනාකම් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආශ්‍රිත විනිශ්චය පහත දැක්වෙන සටහන්වල ඇතුළත් වේ.

සටහන 12 - නිශ්චල කල්බදු වත්කම් (හිස් ඉඩම්වල බදු හිමිකම හැර)

සටහන 14 - පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්

සටහන 24 - නිර්ණය කළ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

සටහන 26 - විලම්භිත බදුකරණය

### 2.6 සංසන්දනාත්මක තොරතුරු

වඩාත් සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම් සහ වර්ගීකරණ සමඟ සැසඳෙන පරිදි, ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම් සහ වර්ගීකරණ සංශෝධනය කර ඉදිරිපත් කර ඇත.

## 03. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී යොදා ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශ කර දක්වා නොමැති වුවද, සියළුම වර්ෂවලදී නිරන්තරයෙන්ම අනුගමනය කර ඇත.

### 3.1 වත්කම් සහ ඒවායේ තක්සේරුකරණ පදනම

මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් වශයෙන් වර්ග කොට ඇත්තේ සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි වන හෝ වාර්තා කරන දින සිට වසරක් තුළ උපලබ්ධි වන වත්කම් ය. ජංගම වත්කම් හැර වෙනත් වත්කම් වනුයේ සමාගම විසින් වාර්තා කරන දින සිට වසරකට වඩා වැඩි කාලයක් පවත්වා ගෙන යාමට අදහස් කරන වත්කම් වේ.

#### 3.1.1 දේපළ, පිරියත සහ උපකරණ

#### 3.1.1.1 හඳුනා ගැනීම සහ ගණනය

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය කිරීම් සහ සමුච්චිත හානිකරණ පාඩුවලින් අඩු කර දක්වා ඇත.

මෙම කාර්යය සඳහා වන පිරිවැයට අත්පත් කර ගැනීමේ පිරිවැය සහ වත්කම එහි ක්‍රියාකාරී තත්ත්වයට හෝ අපේක්ෂිත භාවිතයට ගෙන ඒම සඳහා සෘජුවම දරන ලද වියදම් ඇතුළත් වේ. ස්වයංව ඉදි කරන ලද වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය සහ වත්කම් වැඩ කරන තත්ත්වයට හෝ එහි අපේක්ෂිත භාවිතයට ගෙන ඒම සඳහා සෘජුවම දරන ලද වෙනත් වියදම් ඇතුළත් වේ. දැනට පවතින වත්කම් විසුරුවා හැරීමේ සහ ඉවත් කිරීමේ පිරිවැය ද මෙයට ඇතුළත්ය.

කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම් ගිණුම් වෙත ප්‍රථම භාවිතයේ දී හෝ වත්කම පැවරූ අවස්ථාවේ දී මාරු කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවලට විවිධ ප්‍රයෝජනවත් ජීව කාල ඇති අවස්ථාවල, ඒවා දේපළ, පිරියත හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

ස්ථිර ඉඩම් සංවර්ධන පිරිවැය යනු ඉඩම්වල බාහිර හැඩයට ප්‍රධාන වෙනස්කම් සිදු කිරීමට, නව ප්‍රවේශ මාර්ග ඉදිකිරීමට සහ අනෙකුත් ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දරන පිරිවැයයි.

දේපළ, පිරියත සහ උපකරණ අයිතම අපහරණය කිරීමේ ලාභ සහ අලාභ, බැහැර කිරීමෙන් ලැබෙන ආදායම සහ දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ ප්‍රමාණය අතර වෙනස ලෙස තීරණය කරනු ලබන අතර, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ ඒවා හඳුනා ගනු ලැබේ.

යම් ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙනත් විස්තීර්ණ ආදායමක් තුළ හඳුනා ගන්නා අතර ආදායම් ප්‍රකාශයේ වැඩි වීම හඳුනා ගන්නා අවස්ථාවේ ආදායම් ප්‍රකාශනයේ කලින් හඳුනාගෙන ඇති එම වත්කමේ ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට හැර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ හිමිකම් වශයෙන් රැස් කෙරේ. වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ හඳුනාගත් එකම වත්කමේ පවතින අතිරික්තය පියවා ගන්නා ප්‍රමාණයට හැර, ආදායම් ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන හිඟයක් හඳුනා ගැනේ.

වත්කම්වල දළ ධාරණ ප්‍රමාණයට එරෙහිව ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනට සමුච්චිත ක්ෂයවීම් ඉවත් කරනු ලබන අතර ශුද්ධ මුදල වත්කමේ ප්‍රත්‍යාගණන ප්‍රමාණයට නැවත දක්වයි. අපහරණය කිරීමෙන් පසු, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාළ ඕනෑම ප්‍රත්‍යාගණන සංචිතයක් රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ. මෝටර් වාහන බාහිර තක්සේරුකරුවෙකු මගින් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිපත්තියක් සමාගම විසින් අනුගමනය කර ඇති අතර අවම වශයෙන් සෑම වසර 5 කට වරක්වත් මෝටර් වාහන සඳහා අභ්‍යන්තර තක්සේරුවක් සිදු කළ යුතුය.

#### 3.1.1.2 පසුකාලීන වියදම්

පවත්නා දේපළ, පිරියත සහ උපකරණ මත සිදුකරන ලද වියදමක ප්‍රතිඵලයක් ලෙස ආරම්භයේ දී එම වත්කම්වලින් තක්සේරු කරන ලද අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය ඉක්මවා ප්‍රතිලාභ ලබා දෙනු ඇතැයි අපේක්ෂිත කල්හි හා එම වියදම සාධාරණව හඳුනා ගත හැකි විටක එම වියදම ප්‍රාග්ධනිත කෙරේ. වත්කමෙහි පවත්නා වර්තමාන වටිනාකම ඉවත් කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ එදිනෙදා නඩත්තු කිරීමේ පිරිවැය විස්තීර්ණ මූල්‍ය ප්‍රකාශනයේ වියදම්

වශයෙන් හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණනය කළ වත්කමක් ඉවත් කරන අවස්ථාවක ප්‍රත්‍යාගණන සංචිතයේ ඇතුළත් වන මුදල රැඳවූ ඉපයීම්වලට මාරු කෙරේ.

### 3.1.1.3 වත්කමක වටිනාකම ඉවත් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ ඉවත් කිරීමේ දී හෝ එමගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ තවදුරටත් නොලැබෙන අවස්ථාවක, එහි පවතින වටිනාකම ඉවත් කෙරේ. අදාළ ඉවත් කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ හඳුනා ගැනේ.

### 3.1.1.4 ණය පිරිවැය

කිසියම් වත්කමක් අත්පත් කර ගැනීමේ දී, ඉදිකිරීමේ දී හෝ නිෂ්පාදනයේ දී එම කටයුත්ත සඳහා ගනු ලබන ණය මුදලකට අදාළ ණය පිරිවැය පහත කරුණුවලට යටත්ව ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අදාළ වත්කම අපේක්ෂිත කාර්යය සඳහා යොදා ගන්නා තෙක්, එම කාලයට අදාළ ණය පිරිවැය පමණක් එම වත්කමේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය පිරිවැය ප්‍රමාණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 23 ට අනුව තීරණය කෙරේ. ප්‍රාග්ධනිත නොකළ ණය පිරිවැය ඒවා සිදු වූ කාලයට අදාළ වියදමක් ලෙස ගැනෙන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කෙරේ.

### 3.1.1.5 ක්ෂය කිරීම් සහ ක්‍රමක්ෂය කිරීම්

ක්ෂය කිරීම් ගණනය කරනුයේ වත්කමේ පිරිවැය, හෝ පිරිවැය වෙනුවට වියදම් කළ වෙනත් මුදල හා වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම මත පදනම්වය. ක්ෂය කිරීම් එක් එක් වත්කමේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ සිදු කෙරේ. බදු පදනමට ලබා ගත් වත්කමක් අදාළ බදු කාලපරිච්ඡේදය හෝ අදාළ වත්කමේ ඵලදායී ජීව කාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. කල්බදු කාලය අවසානයේ සමාගමට හිමිකාරත්වය අත් වන තත්ත්වය තුළ, කල්බදු දේපළ කල්බදු කාලසීමාව හා ඒවායේ ඵලදායි ජීවකාලය යන දෙකෙන් අඩු කාලයට ක්ෂය කෙරේ. ඉඩම් ක්ෂය නොකෙරේ.

තථ්‍ය හා සංසන්දනාත්මක කාලසීමාවල ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පහත දක්වා ඇත.

| වත්කම් වර්ගය | වසර |
|---|---|
| ගොඩනැගිලි | 40 |
| විදුලි සැපයුම් | 40 |
| සූර්ය බලශක්ති පද්ධති | 10 |
| ළිං | 40 |
| වැට ඉදිකිරීම් | 03 |
| රථවාහන | 05 |
| යන්ත්‍ර | 13 1/3 |
| ලී බඩු හා සවිකිරීම් | 10 |
| උපකරණ | 08 |
| වාරි සම්පාදන | 08 |
| පරිගණක | 05 |
| අලෙවි කුටි (බහලුම්) | 15 |
| ඉඩම් සංවර්ධන | 05 |

2018 වර්ෂය ද ඇතුළත්ව සමාගම විසින් සිදු කළ ක්ෂයකිරීම් පහත දක්වා ඇත. කිසියම් වත්කමක් ක්ෂය කිරීම එය භාවිතයට ගනු ලබන අවස්ථාවේ සිට ඇරඹෙන අතර අදාළ වත්කම විකිණීම සඳහා හඳුනාගත් අවස්ථාවේදී හෝ එම වත්කම භාවිතයට ගැනීම අත් හරින දිනයේ දී අවසන් වේ. එවැනි වත්කමක් ඉවත් කරන අවස්ථාවේ එකී වත්කම ඉවත් කරන පූර්ණ වර්ෂය තුළ ක්ෂය කිරීම් අදාළ කෙරේ.

කෙසේ වුවද, ශ්‍රීලංගිප්‍ර 16 ට අනුව, වත්කමක ක්ෂයකිරීම එය භාවිතයට ගන්නා දින සිට අදාළ වන බැවින් 2019 වර්ෂයේ මිලදී ගත් වත්කම්වල ක්ෂය කිරීම් අවශ්‍ය පරිදි සිදු කර ඇත.

### 3.1.1.6 ඉඩම් සංවර්ධන පිරිවැය

මාර්ග, පාලම් හා පොකුණු ඉදි කිරීම් වැනි ඉඩම් සංවර්ධනය සඳහා සමාගම කළ වියදම් 2018 වර්ෂය වන තුරු ක්ෂය නොකළ ද, එම වර්ෂයේ සිට ඉදිරියට එවැනි පිරිවැය ක්ෂය කර ඇත. 2018 වර්ෂයට පෙර කළ පිරිවැය ඉතිරි ඵලදායි ජීව කාලයට ක්ෂය කර තිබේ.

වත්කමක් අලෙවිය සඳහා තැබෙන අවස්ථාවක වත්කමක ක්ෂය නතර වන අතර උක්ත ක්ෂය ප්‍රතිපත්තියට යටත්ව එය පිළි නොගැනේ. ක්ෂය ක්‍රමය, ඵලදායී ජීව කාලය සහ අඩු වන වටිනාකම් අදාළ පරිදි එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර ගළපා ගැනීම සිදු වේ.

කල්බදු වත්කම් පහත කාලවලට අදාළව සමාන මුදලකින් ක්‍රමක්ෂය කර ඇත.

| වත්කම් වර්ගය | වසර |
|---|---|
| හිස් ඉඩම් | 53 |
| ගොඩනැගිලි | 25 |
| යන්ත්‍ර | 15 |
| මේරූ වගා | 30 |
| ඉඩම් සංවර්ධන පිරිවැය | 30 |

### 3.1.1.7 කල්බදු පදනමට ලබාගත් වත්කම්

මූල්‍ය කල්බදු යටතේ ලබා ගෙන ඇති සමාගමට පසුව පැවරූ වත්කම් සහ කල්බදු වත්කම්වල හිමිකාරීත්වයට අදාළ වන සියළු අවදානම් හා පහසුකම් ඒවා ඍජුව මිලදී ගත් ඒවා ලෙස සැලකෙන අතර ඒවායේ මූල්‍ය වටිනාකමට ප්‍රාග්ධනිත කර ඇත. මූල්‍ය කල්බදු පදනමට ලබා ගත් වත්කම් බදු කාල සීමාව හෝ අදාළ වත්කම්වල ඵලදායී ජීව කාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. බදු හිමිකරුට ගෙවීමට ඇති ප්‍රධාන / ප්‍රාග්ධන අංග බැරකම් / බැදීම් ලෙස දක්වා ඇත.

මූල්‍ය කල්බදු යටතේ තබා ඇති වත්කම් කල්බදු කාල සීමාව අවසානයේ හිමිකාරිත්වය පැවරීම සිදු නොකළහොත් මිස කල්බදු කාල සීමාවේ හෝ සමාන හිමිකාරී වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය යන කාලසීමා අතරින් වඩාත් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

කල්බදු හිමිකරු විසින් කල්බදු කාලය තුළ හිමිකාරිත්වයේ සියළු අවදානම් සහ ප්‍රතිලාභ ඵලදායි අන්දමින් සහ ප්‍රමාණවත් ලෙස රඳවා තබා ගන්නා කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කෙරේ. මෙහෙයුම් කල්බදු යටතේ ගෙවනු ලබන කල්බදු ගෙවීම් (රක්ෂණ සහ නඩත්තුව වැනි සේවාවන් සඳහා වන වියදම් හැර) කල්බදු කාල සීමාව තුළ සරල රේඛීය පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

### 3.1.1.8 මූල්‍යමය නොවන වත්කම්වල අපහායනය

වත්කමක් හානිකරණය විය හැකි බවට ඇඟවීමක් තිබේ ද යන්න පිළිබඳව සමාගම සෑම වාර්තා කරන දිනකම තක්සේරු කරයි. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වූ විට, සමාගම වත්කමේ ආපසු ලබාගත හැකි මුදල පිළිබඳ ඇස්තමේන්තුවක් කරයි.

වත්කමක අයකරගත හැකි මුදල භාවිතයේ පවතින වත්කමක වටිනාකමට වඩා වැඩි අගයක් වන අතර එහි සාධාරණ වටිනාකම විකිණීමට අඩු පිරිවැය වන අතර වත්කම වෙනත් වත්කම්වලින් හෝ වත්කම් සමූහයෙන් බොහෝ දුරට ස්වාධීන වන මුදල් ගලා ඒමක් ජනනය නොකරන්නේ නම් මිස තනි වත්කමක් සඳහා තීරණය වේ. වත්කමක ධාරණ ප්‍රමාණය එහි ආපසු ලබාගත හැකි ප්‍රමාණය ඉක්මවන විට, වත්කම් හානිකරණය වී ඇතැයි සලකනු ලබන අතර එහි ආපසු ලබා ගත හැකි මුදලට ලියා හැර ඇත. භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේදී, මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම පිළිබඳ වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන පෙර බදු වට්ටම් අනුපාත භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබයි. විකිණීම සඳහා සාධාරණ වටිනාකම අඩු පිරිවැය තීරණය කිරීමේදී පවතී නම්, මෑත කාලීන වෙළඳපල ගනුදෙනු සැලකිල්ලට ගනී. එවැනි ගනුදෙනුවක් හඳුනාගත නොහැකි නම්, සුදුසු තක්සේරු ආකෘතියක් භාවිත කරනු ලැබේ.

අඛණ්ඩ ක්‍රියාකාරකම්වල හානිකරණ පාඩුව, හානිකරණය වූ වත්කම්වල ක්‍රියාකාරිත්වයට අනුරූප වන එම වියදම් කාණ්ඩවල විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත. කලින් හඳුනාගත් අලාභහානි අලාභයක් ආපසු හරවනු ලබන්නේ අවසන් හානි පාඩුව හඳුනා ගැනීමෙන් පසුව වත්කම්වල අයකරගත හැකි මුදල තීරණය කිරීමට භාවිතා කරන ඇස්තමේන්තුවල වෙනසක් සිදුවී ඇත්නම් පමණි. එය එසේ නම්, වත්කමේ එහි ආපසු ලබාගත හැකි ප්‍රමාණය දක්වා වැඩි වේ. පෙර වසරවල වත්කම් සඳහා කිසිඳු හානිකරණ පාඩුවක් හඳුනාගෙන නොතිබුනේ නම්, එම වැඩි කළ මුදල, ශුද්ධ ක්ෂය කිරීම් තීරණය කරනු ලබන ධාරණ ප්‍රමාණය "ඉක්මවිය" නොහැකිය. එවැනි ආපසු හැරීමක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

### 3.1.2 ජීව විද්‍යාත්මක වත්කම්

ජීව විද්‍යාත්මක වත්කම් මේරූ සහ නොමේරූ ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් වර්ග කෙරේ. මේරූ ජීව විද්‍යාත්මක වත්කම් යනු අස්වැන්න නෙළාගත හැකි තත්ත්වයට පත් වූ වගා වන අතර නොමේරූ ජීව විද්‍යාත්මක වත්කම් යනු තවමත් අස්වැන්න නෙළාගත හැකි තත්ත්වයට පත් නොවූ වගාවන් ය. ජීව විද්‍යාත්මක වත්කම් ඵල දරන ජීව විද්‍යාත්මක වත්කම් සහ පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් වැඩිදුරටත් වර්ගීකරණය කෙරේ. ඵල දරන ජීව විද්‍යාත්මක වත්කම්වලට විකිණීමට හෝ නෙළීමට අදහස් නොකරන නමුත් එවැනි ජීව විද්‍යාත්මක වත්කම්වලින් කෘෂිකාර්මික නිෂ්පාදන අස්වනු නෙළීම සඳහා වගා කරනු ලබන පොල් සහ රබර් වගා (ගස්) ඇතුළත් වේ. පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ග කරනුයේ තේක්ක, මහෝගනී, හල්මිල්ල, මිල්ල වැනි වාණිජ වටිනාකමක් සහිත දැව ගස් ය.

### 3.1.2.1. ඵල දරන පැළ

ඵල දරන ජීව විද්‍යාත්මක වත්කම් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය කිරීමේ හා අපහායන අලාභ අඩු කිරීමෙන් අනුතුරුව වන අතර, දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව එය සිදු කෙරේ.

වාණිජ අස්වනු නෙළීම දක්වා ඉඩම් සකස් කිරීම, පුනරුත්ථාපනය කිරීම, අළුතින් වගා කිරීම, නැවත වගා කිරීම, බෝග විවිධාංගීකරණය, අතුරු වගා, පොහොර ආදිය සඳහා දරන ලද පිරිවැය, ක්ෂය කිරීම්

සඳහා ප්‍රතිපාදන ලබා නොදෙන නොමේරූ වැවිලි / නොමේරූ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. මෙම නොමේරූ වැවිලි ඍජු වියදම් සහ නොමේරූ වැවිලි සඳහා මූල්‍යකරණය සඳහා භාවිතා කරන දීර්ඝ කාලීන ණය සඳහා පොළී ඇතුළුව පොදු කාර්ය පිරිවැයේ එකතුවක් වශයෙන් දක්වනු ලැබේ.

නොමේරූ තත්ත්වයේ පැවති වගාවක් මේරූ තත්ත්වයට පත් වූ විටක එසේ සිදු වූ වර්ෂය අවසානයේ එම වගාව සඳහා දරා ඇති පිරිවැය මේරූ වගා යටතට මාරු කරනු ලබන අතර ඒවායේ ආර්ථික වශයෙන් ඵලදායි ජීවිත කාලය පුරා පහත දක්වා ඇති පරිදි ක්ෂය කරනු ලබයි.

**වත්කම කල් පිරීමේ කාලය (වර්ෂ) ආර්ථික වශයෙන් ඵලදායි ජීවිත කාලය (වර්ෂ)**

| වර්ගය (බෝගය) | ප්‍රධාන බෝග | අතුරු බෝග | ජීවිත කාලය (වර්ෂ) |
|---|---|---|---|
| පොල් | 10 | නොමැත | 50 |
| රබර් | 06 | නොමැත | 20 |
| කජු | 06 | 08 | 20 |
| කුරුඳු | 06 | 06 | 20 |
| ඩ්‍රැගන් ෆෘට් | 03 | 04 | 20 |
| කොකෝවා | 05 | 06 | 20 |
| දෙහි | 05 | 06 | 20 |
| අඹ | 06 | 08 | 20 |
| ගම්මිරිස් | 06 | 07 | 20 |
| රඹුටන් | 06 | 08 | 20 |
| කෝපි | 07 | 08 | 20 |
| පුවක් | 08 | 10 | 20 |
| අලිගැටපේර | 08 | 10 | 20 |
| දූරියන් | 08 | 10 | 20 |
| පේර | 04 | 06 | 06 |

යම් ඵල දරන ජීව විද්‍යාත්මක වත්කමක සිදුවන ස්ථිර අපහායනයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ සම්පූර්ණයෙන්ම හඳුනා ගන්නා අතර, පාඩුව නිසැකව හඳුනා ගැනීමෙන් අනතුරුව, එය සිදු වූ වර්ෂය තුළ එවැනි වත්කම්වල ශුද්ධ ධාරණ වටිනාකමින් අඩු කරනු ලබයි.

ගස් ඉවත් කිරීම පෙර පිවිසි පෙර නිකුත් පදනම මත සිදු කෙරේ.

### 3.1.2.2. ඵල දරන වගාවල පාළු පැළ සිටුවීමේ පිරිවැය

පාළු සිටුවීමට අදාළව කරන ලද ඉඩම් සංවර්ධන පිරිවැය ප්‍රාග්ධනිත කෙරේ. එය සිදු කරන්නේ මෙයට පෙර තක්සේරු කළ කාර්යසාධන මට්ටමට වඩා පාළු සිටුවීම හේතුවෙන් අදාළ ක්ෂේත්‍රයේ ආර්ථික වශයෙන් ඵලදායි ජීව කාලය වැඩිවීමක් සිදුව ඇති අවස්ථාවකදීය. එසේ ප්‍රාග්ධනීකරණය කරන ලද පාළු සිටුවීමේ පිරිවැය අදාළ පරිණත වගාවේ අයිතීන් තක්සේරු කරන ලද ඉතිරි ආර්ථික වශයෙන් ඵලදායි ජීවිත කාලය හෝ කල් ඉකුත් නොවූ කල්බදු කාලසීමාව යන දෙකෙන් අඩු කාල සීමාව පුරා ක්ෂය කරනු ලැබේ.

ප්‍රාග්ධනීකරණය නොකළ පාළු සිටුවීමේ පිරිවැය එය දරන ලද වර්ෂයේ වියදමක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

### 3.1.2.3. පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්

පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගැනෙන දැව ගස් මූලික හඳුනා ගැනීමේ දී ගණනය කරන අතර එක් එක් වාර්තා කරන කාලසීමාව අවසානයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 අනුව විකිණුම් පිරිවැය අඩු කර සාධාරණ අගයට ගණනය කෙරේ. දැව ගස්වල සාධාරණ වටිනාකම, වර්තමාන දැව මිල ගණන් හා එම දැව ගස් පරිණත තත්ත්වයට පත් වූ විට එම දැව ගස්වලින් අපේක්ෂිත දැව පරිමාව සැලකිල්ලට ගනිමින් වට්ටම කළ මුදල් ප්‍රවාහ ක්‍රමය යොදා ගෙන ගණනය කෙරේ. නොමේරූ ගස්වල පිරිවැය සාධාරණ අගයට ආසන්න අගයක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. මෙම ගණනය කිරීම සුදුසුකම් ලත් ස්වාධීන තක්සේරුකරුවකු විසින් කල් පිරුණු අවස්ථාවේ දී සිදු කෙරේ.

පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් මූලික හඳුනා ගැනීමේ දී හඳුනා ගනු ලබන ලාභ හෝ අලාභ සහ ඉන් පසුව එම වත්කම්වල සාධාරණ අගය වෙනස්වීම හේතු කොට ගෙන ඇති වන්නා වූ ලාභ හෝ අලාභ, එම ලාභ හෝ අලාභ හට ගත්තා වූ කාල පරිච්ඡේදයට අදාළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. මේ හා සම්බන්ධ අනෙකුත් සියළුම උපකල්පන සටහන් අංක 14 හි දක්වා ඇත.

වට්ටම කළ මුදල් ප්‍රවාහ ක්‍රමය / ආකෘතිය (DCF) තුළ අවධානය යොමු කොට ඇති ප්‍රධාන විචල්‍ය

| විචල්‍යය | අදහස් දැක්වීම |
|---|---|
| **තක්සේරු කරන මුදල් වර්ගය** | රු. |
| **දැව ප්‍රමාණය** | උස සහ වට ප්‍රමාණය භෞතිකව තහවුරු කර ගැනීමෙන් හා විවිධ භූගෝලීය ප්‍රදේශ තුළ එක් එක් දැව වර්ගයෙහි වර්ධනය සැලකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සිදු කරයි.<br>මෙහි දී දැව හෙළීමට අදාළ බලපවත්වනු ලබන සියළුම ව්‍යවස්ථාපිත විධිවිධාන සමාගමේ වන සැලැස්ම සමඟ සැලකිල්ලට ගනු ලබයි. |

**ආර්ථික වශයෙන්** සමාගමේ වන වගා සැලැස්ම අනුව **ඵලදායී ජීව කාලය** එක් එක් විශේෂයේ සාමාන්‍ය ආයු කාලය මත පදනම්ව ආර්ථික වශයෙන් ඵලදායි ජීව කාලය ඇස්තමේන්තු කර ඇත.

**විකුණුම් මිල** ශ්‍රී ලංකාවේ පවතින වෙළඳපොළ මිල අනුව ඇස්තමේන්තු කෙරේ. මෙහි දී දැව ගස් විකුණුම් තත්ත්වයට පත් කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු සියි ම අවශ්‍යතා පිළිබඳව සලකා බලයි.

**වට්ටම් අනුපාතිකය** අනාගත මුදල් ප්‍රවාහ පහත වට්ටම් අනුපාත යටතේ වට්ටම් කරනු ලැබේ: දැව ගස් 14%.

### 3.1.2.4 හඳුනා ගැනීම හා ගණනය

සමාගම විසින් ජීව විද්‍යාත්මක වත්කම් හඳුනා ගනු ලබන්නේ, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත හිමි වන බවට කහවුරු වන අවස්ථාවක සහ එම වත්කම් සම්බන්ධ පාලනය සමාගම සතුව පවතින්නේ නම් පමණි. වත්කම්වල සාධාරණ වටිනාකම හෝ පිරිවැය විශ්වසනීයව මැනිය හැකි වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද නියමයට අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 - දේපල පිරියත සහ උපකරණ අනුව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් මනිනු ලබන්නේ පිරිවැය සමුච්චිත ක්ෂය කිරීම් සහ සමුච්චිත හානිකරණ පාඩුවලින් අඩු කිරීමෙනි.

පරිභෝජ්‍ය දැව ගස් මූලික හඳුනාගැනීමේ දී හා එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 ට අනුව, එහි සාධාරණ වටිනාකමෙන් අලෙවි පිරිවැය අඩු කර ගණනය කරනු ලැබේ. මෙම කාල සීමාව තුළ එවැනි ශාකවල ජීව විද්‍යාත්මක පරිවර්තනය මිල කෙරෙහි ඇති බලපෑම නොවැදගත් වන බැවින් පිරිවැය ළපටි පැළවල (වයස අවුරුදු 5 ට අඩු) සාධාරණ වටිනාකමට ආසන්න වටිනාකමක් වශයෙන් සලකනු ලැබේ.

### 3.1.2.5 ධාරක ජීව විද්‍යාත්මක වත්කම්වල වර්ධනය වන නිෂ්පාදන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 ට අනුව, සමාගම විසින් ධාරක ශාක මත වර්ධනය වන කෘෂිකාර්මික නිෂ්පාදන ඒවායේ සාධාරණ වටිනාකමින් අලෙවි පිරිවැය අඩු කර හඳුනා ගැනේ. එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ ලාභ හෝ අලාභ ලෙස පිළිගත් එවැනි කෘෂිකාර්මික නිෂ්පාදනවල සාධාරණ වටිනාකම වෙනස් වීම.

මෙම කාර්යය සඳහා, එක් එක් බෝග කාණ්ඩයේ අස්වනු චක්‍රය මත පදනම්ව අස්වනු නෙළාගත හැකි කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රමාණ තීරණය කරනු ලබන්නේ, පූර්වාසන්න චක්‍රයේ අස්වැන්න නෙළන ලද අවසාන දිනය මත පදනම්ව එක් අස්වනු චක්‍රයකට සීමා කිරීමෙනි. තවද, එම අස්වනු චක්‍රයේ අස්වැන්නෙන් 50% ක් තක්සේරු කිරීම සඳහා සලකා බලනු ලැබේ.

අස්වනු නෙළා ගත හැකි කෘෂිකාර්මික නිෂ්පාදන තක්සේරු කිරීම සඳහා සමාගම පහත සඳහන් මිල සූත්‍ර භාවිතා කරයි.

**රබර්** - රබර් ක්ෂීරයේ මිලෙන් (දුම් ගැසූ දාර රබර් 1 හි වර්තමාන මිලෙන් 95% ක්) කිරි අස්වනු නෙළා ගැනීමේ සහ ප්‍රවාහණය කිරීමේ පිරිවැය අඩු කිරීම.

**පොල්** - පොල් සංවර්ධන අධිකාරිය මගින් නියම කරන ලද වෙන්දේසි මිලෙන් පොල් ගෙඩි ඇහිදීමේ සහ ප්‍රවාහනය කිරීමේ පිරිවැය අඩු කිරීම.

### 3.1.3. මූල්‍ය උපකරණ

**(අ) හඳුනා ගැනීම සහ මූලික ගණනය**

වෙළඳ ලැබීමට නියමිත දෑ ඒවා ඇති වන තත්ත්වය තුළ මූලිකව හඳුනා ගැනේ. වෙනත් සියළුම මූල්‍ය වත්කම් හා මූල්‍යමය බැරකම් මූල්‍ය උපකරණයේ කොන්ත්‍රාත්තුමය විධිවිධානවල සමාගම පාර්ශවකරුවකු වන අවස්ථාවක මූලිකව හඳුනා ගැනේ.

මූල්‍ය වත්කමක් (එය සැලකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව වෙළඳ ලැබිය යුතු මුදල් නම්) හෝ මූල්‍ය වගකීමක් මූලිකව මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමට සහ සාධාරණ වටිනාකමට නොමැති අයිතමයක් සඳහා ලාභය හෝ අලාභය තුළින්, එය අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා ඍජුවම වැය වන ගනුදෙනු පිරිවැයටය. සැලකිය යුතු මූල්‍යකරණ සංරචකයක් නොමැතිව වෙළඳ ලැබිය යුතු මුදල් මූලිකව ගණනය කරනුයේ ගනුදෙනු මිලටය.

**(ආ) වර්ගීකරණය සහ පසුකාලීන ගණනය**

**මූල්‍ය වත්කම් - 2018 ජනවාරි 1 සිට අදාල වන ප්‍රතිපත්තිය**

මූලික හඳුනා ගැනීම තුළ මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂිත පිරිවැය; වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකම FVOCI - හිමිකම් ආයෝජනය එසේ නැතහොත් FVTPL ලෙස වර්ගීකරණය කෙරේ.

ව්‍යාපාරික මොඩලයේ වෙනසින් පසුව, පළමුව දන්වා සිටින දිනයේ දී නැවත වර්ගීකරණය කළ මූල්‍ය වත්කම් කළමනාකරණයේ දී, සමාගම තම ව්‍යාපාරික මොඩලය වෙනස් කර ගන්නා තෙක් මූල්‍ය වත්කම්

ඒවායේ මූලික හඳුනා ගැනීමට අනතුරුව ප්‍රතිවර්ගීකරණය නොකෙරේ.

මූල්‍ය වත්කමක් පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරන විටක හා FVTPL වෙන් නොකරන අවස්ථාවක ක්‍රමක්ෂිත පිරිවැයට ගණනය කෙරේ.

- කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ එකතු කර ගැනීම සඳහා වත්කම් රඳවා ගැනීමේ අරමුනින් ව්‍යාපාරික මොඩලය මත රඳවා ගැනීම, සහ
- හිඟව ඇති ප්‍රධාන මුදලට අදාළ පොළිය හා ගෙවීම අවශ්‍ය වන මුදල් ප්‍රවාහවල සුවිශේෂිත දින පිළිබඳව කොන්ත්‍රාත් වගන්ති තුළ සඳහන් වීම.

පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරන විටක හා FVTPL වෙන් නොකරන අවස්ථාවක ණය ආයෝජන FVOCI ට ගණනය කෙරේ.

- කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ හා විකුණුම් මූල්‍ය වත්කම් යන දෙක මගින් ව්‍යාපාරික මොඩලයේ අරමුණ රදා පැවතීම, සහ
- හිඟව ඇති ප්‍රධාන මුදලට අදාළ පොලිය හා ගෙවීම අවශ්‍ය වන මුදල් ප්‍රවාහවල සුවිශේෂිත දින පිළිබඳව කොන්ත්‍රාත් වගන්ති තුළ සඳහන් වීම.

වෙළඳාම සඳහා තබා නොමැති හිමිකම් ආයෝජනයක් මූලිකව හඳුනා ගැනීමේ දී OCI හි ආයෝජනවල සාධාරණ වටිනාකමේ පසුව ඇති වූ වෙනස්කම් සඳහා සමාගම අනිවාර්යෙන්ම යොමු වේ. මෙම තේරීම ආයෝජන පදනම මත සිදු කෙරේ.

ක්‍රමක්ෂිත පිරිවැයට හෝ FVOCI ගණනය කළ ලෙස වර්ගීකරණය නොකළ සියළු මූල්‍ය වත්කම් ඉහත විස්තර කර දක්වා ඇත. මේ තුළ සියළුම ව්‍යුත්පන්න කළ මූල්‍ය වත්කම් අඩංගු වේ. මූලික හඳුනා ගැනීමේ දී වෙනත් ආකාරයකින් පැන නගින ගිණුම්කරණ නොගැළපීම ඉවත් කිරීම හෝ සැලකිය යුතු ලෙස අඩු කිරීම නම්, ක්‍රමක්ෂය තුළ පිරිවැයකින් හෝ FVOCI හි FVTPI හි මැනිය යුතු අවශ්‍යතා සපුරාලන මූල්‍ය වත්කමක් සමාගම විසින් ආපසු හැරවිය නොහැකි ලෙස නම් කළ හැකිය.

**මූල්‍ය වත්කම් - ව්‍යාපාරික මොඩලයේ තක්සේරුව**

ව්‍යාපාර වත්කම් කළඹ මට්ටමින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ආකෘතියේ පරමාර්ථය සමාගම විසින් තක්සේරු කරනු ලැබේ. ඊට හේතුව මෙය ව්‍යාපාරය කළමනාකරණය කරන ආකාරය සහ කළමනාකරණයට තොරතුරු සපයන ආකාරය මනාව පිළිබිඹු කරයි. සලකා බැලූ තොරතුරුවලට පහත කරුණු ඇතුළත් වේ.

- කළඹ සඳහා ප්‍රකාශිත ප්‍රතිපත්ති සහ අරමුණු සහ එම ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම. කොන්ත්‍රාත් පොලී ආදායමක් ඉපැයීම, විශේෂිත පොලී අනුපාත පැතිකඩක් පවත්වා ගැනීම, මූල්‍ය වත්කම්වල කාලසීමාව අදාළ වගකීම් හෝ අපේක්ෂිත මුදල් ගලා යාමේ කාලසීමාවට ගැළපීම හෝ වත්කම් විකිණීම හරහා මුදල් ප්‍රවාහ සාක්ෂාත් කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ උපායමාර්ගික අවධානය යොමු කරන්නේද යන්න මේවාට ඇතුළත් වේ.
- කළඹෙහි කාර්යසාධනය ඇගයීමට ලක් කර සමාගම් කළමනාකාරීත්වයට වාර්තා කරන ආකාරය;
- ව්‍යාපාර ආකෘතියේ ක්‍රියාකාරීත්වයට බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ පවතින මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද;
- ව්‍යාපාරයේ කළමනාකරුවන්ට වන්දි ගෙවන ආකාරය - උදා: කළමනාකරණය කළ වත්කම්වල සාධාරණ වටිනාකම මත හෝ එකතු කරන ලද ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් මත වන්දි ගෙවීම පදනම් වන්නේද; සහ
- පූර්ව කාලපරිච්ඡේදවල මූල්‍ය වත්කම්වල විකුණුම් සංඛ්‍යාතය, පරිමාව සහ කාලය, එවැනි විකුණුම් සඳහා හේතු සහ අනාගත විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන්.

පිළිනොගැනීම සඳහා සුදුසුකම් නොලබන ගනුදෙනුවලදී මූල්‍ය වත්කම් තෙවන පාර්ශ්ව වෙත පැවරීම, සමාගමේ වත්කම් අඛණ්ඩව පිළිගැනීමට අනුකූලව මේ සම්බන්ධයෙන් විකුණුම් ලෙස නොසැලකේ. වෙළඳාම සඳහා රඳවාගෙන සිටින හෝ කළමනාකරණය කරනු ලබන සහ සාධාරණ වටිනාකමක් මත කාර්යසාධනය ඇගයීමට ලක් කරන මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට (FVTPL) ගණනය කරනු ලැබේ.

**මූල්‍ය වත්කම් - කොන්ත්‍රාත්තුමය මුදල ප්‍රධාන හා පොලී ලෙස තහවුරු කර ගැනීම: 2018 ජනවාරි 1 දින සිට අදාළ වන ප්‍රතිපත්තිය**

මෙම තක්සේරුවේ දී, මූලික පිළිගැනීම පිළිබඳ මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම ලෙස "ප්‍රධානී අර්ථ දක්වා ඇත. පොළිය යන්න මුදල්වල කාල වටිනාකම ලෙස සළකා බැලීම ලෙස අර්ථ ගන්වා ඇති අතර, විශේෂිත කාලසීමාවක් තුළ ඉතිරිව ඇති ප්‍රධාන මුදල හා සම්බන්ධ ණය අවදානම හා පිරිවැය (උදා: ද්‍රවශීලතා අවදානම හා පරිපාලන වියදම්), මෙන්ම ලාභ ප්‍රමාණය සලකා බැලේ. කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ යනු හුදෙක්ම ප්‍රධාන හා පොළී ලෙස තක්සේරු කිරීමේ දී, උපකරණයේ කොන්ත්‍රාත්තුමය වගන්ති

සමාගමේ සැලකිල්ලට ලක් කෙරේ. මේ තුළ කාලය හෝ කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ ප්‍රමාණය වෙනස් කළ හැකි දැයි තක්සේරු කෙරේ.

මෙම තක්සේරුව සිදු කිරීමේ දී සමාගම අවධානයට ලක් කරන කරුණු අතර

- මුදල් ගලන වල ප්‍රමාණය හා කාලය වෙනස් කළ හැකි හදිසි අවස්ථා:
- වෙනස්විය හැකි අනුපාත අංග ඇතුළුව කොන්ත්‍රාත් කූපන් අනුපාත සීරු මාරු කරන වගන්ති:
- අංග පෙර ගෙවුම හා කල් දිගු කිරීම: සහ
- විශේෂිත වත්කම් වලින් මුදල් ප්‍රවාහවලට සමාගමට ඇති හිමිකම සීමා කරන වගන්ති.

කොන්ත්‍රාත්තුව කල්තියා අවසන් කිරීම සඳහා සාධාරණ අමතර වන්දියක් ඇතුළත් විය හැකි, පෙරගෙවුම් මුදල මගින් සැලකිය යුතු ලෙස නොගෙවූ මුල් මුදල සහ මුල් මුදල සඳහා හිඟ පොළිය නියෝජනය කරන්නේ නම්, පෙරගෙවුම් අංගයක් හුදෙක්ම මුල් මුදල සහ පොළී ගෙවීම් නිර්ණායකය සමඟ අනුකූල වේ. අතිරේක වශයෙන්, එහි ගිවිසුම්ගත සමාන මුදලට වට්ටමක් හෝ වාරිකයක් යටතේ ලබා ගන්නා මූල්‍ය වත්කමක් සඳහා, ගිවිසුම්ගත සමාන මුදල සහ උපචිත (නමුත් නොගෙවූ) ගිවිසුම් පොළී (කලින් අවසන් කිරීම සඳහා සාධාරණ අතිරේක වන්දියක්ද ඇතුළත් විය හැකි) සැලකිය යුතු ලෙස නියෝජනය කරන මුදලකට පෙරගෙවුම් අවසර දෙන හෝ අවශ්‍ය වන විශේෂාංගයකි.) මූලික හඳුනාගැනීමේදී පෙරගෙවුම් විශේෂාංගයේ සාධාරණ වටිනාකම නොවැදගත් නම් මෙම නිර්ණායකය සමඟ අනුකූල වන බවට සලකනු ලැබේ.

**මූල්‍ය වත්කම් - පසුකාලීන ගණනය සහ පාඩු හා ලාභ - 2018 ජනවාරි 1 දින සිට අදාළ වන ප්‍රතිපත්තිය**

### FVTPL හි මූල්‍ය වත්කම්

මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයට ගණනය කෙරේ. කිසියම් පොළී හෝ ලාභාංශ ආදායම ඇතුළු ශුද්ධ වාසි හා අවාසි ලාභ හෝ පාඩු තුළ හඳුනා ගෙන ඇත.

**ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම්**

මෙම වත්කම් සක්‍රිය පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂිත පිරිවැයට පසුකාලීනව ගණනය කෙරේ. පළුදු පාඩු මගින් ක්‍රමක්ෂිත පිරිවැය අවම කෙරේ. පොලී ආදායම, විදේශ විනිමය වාසි හා පාඩු සහ පළුදුවීම් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ. හඳුනා නොගැනීමේ වාසි හෝ අවාසි ලාභ හෝ පාඩු තුළ හඳුනා ගැනේ.

### FVOCI හි ණය ආයෝජන

මෙම වත්කම් පසුව සාධාරණ වටිනාකමට මනිනු ලැබේ. සක්‍රිය පොලී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලබන පොලී ආදායම, විදේශ විනිමය ලාභ සහ අලාභ හා හානිය ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. අනෙකුත් ශුද්ධ ලාභ සහ අලාභ OCI හි හඳුනා ගෙන ඇත. හඳුනා ගැනීමේ දී, OCI හි එකතු වී ඇති වාසි සහ අලාභ ලාභ හෝ අලාභ ලෙස නැවත වර්ගීකරණය කෙරේ.

### FVOCI හි සමකොටස් ආයෝජන

මෙම වත්කම් පසුව සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ. ලාභාංශ පැහැදිලිවම ආයෝජන පිරිවැයෙන් කොටසක් අයකර ගැනීමක් නියෝජනය නොකරන්නේ නම් ලාභාංශ ලාභයේ හෝ අලාභයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. අනෙකුත් ශුද්ධ ලාභ සහ අලාභ OCI හි හඳුනා ගෙන ඇති අතර ඒවා කිසි විටෙකත් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකෙරේ.

**මූල්‍ය වත්කම් - 2018 ජනවාරි 1 දිනට පෙර පැවති ප්‍රතිපත්තිය**

සමාගම තම මූල්‍ය වත්කම් පහත දැක්වෙන වර්ග වලින් එකකට වර්ගීකරණය කර ඇත.

- ණය හා ලැබීමට නියමිත දෑ
- කල් පිරීමට තබා ඇති
- අලෙවියට තබා ඇති හා
- FVTPL දී, සහ මෙම වර්ගය තුල
- අලෙවියට තබා ඇත
- ව්‍යුත්පන්න හෙජින් උපකරණ
- FVTPL දී පත් කරන ලද

**මූල්‍ය වත්කම් - පසුකාලීන ගණනය හා වාසි අවාසි: 2018 ජනවාරි 1ට පෙර අදාළ වූ ප්‍රතිපත්තිය**

### FVTPL හි මූල්‍ය වත්කම්

සාධාරණ වටිනාකමකින් මනිනු ලබන අතර, ඕනෑම පොලී හෝ ලාභාංශ ආදායමක් ඇතුළුව එහි වෙනස්කම්, ලාභ හෝ අලාභ ලෙස හඳුනාගෙන ඇත.

**කල් පිරෙන මූල්‍ය වත්කම්**

ඵලදායි පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය කළ පිරිවැයට ගණනය කරනු ලැබේ.

**ණය සහ ලැබිය යුතු දේ**

ඵලදායි පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය කළ පිරිවැයට ගණනය කරනු ලැබේ.

**අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම්**

පළුදු පාඩු, පොලී ආදායම සහ ණය උපකරණ වල විදේශ මුදල් වෙනස්කම් හැර ගණනය කළ සාධාරණ වටිනාකම හා එහි වෙනස්කම් OCI හි පිළිගෙන සාධාරණ අගය සංචිතයේ රාශිභූත කර ඇත. මෙම වත්කම පිළි නොගන්නා අවස්ථාවක, සමකොටස් වල රාශිභූත වී ඇති වාසි හෝ අවාසි ලාභ හෝ පාඩු බවට ප්‍රතිවර්ගීකරණය කර ඇත.

**මූල්‍ය බැරකම් - වර්ගීකරණය, පසුකාලීන ගණනය සහ වාසි හා අවාසි**

මූල්‍ය බැරකම් ක්‍රමක්ෂිත පිරිවැයට හෝ FVTPL ට ගණනය කළ සේ වර්ග කර ඇත. මූල්‍ය බැරකමක් අලෙවිය සඳහා තබා ඇති ලෙස, මූලික පිළිගැනීමේ දී වර්ග කර නැත්නම් FVTPL ලෙස වර්ග කර ඇත. මූල්‍ය වත්කම් FVTPL හිදී සාධාරණ වටිනාකමට ගණනය කර ඇති අතර පොලී වියදම ඇතුළුව ශුද්ධ වාසි හා පාඩු ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගෙන ඇත. වෙනත් මූල්‍ය බැරකම් සක්‍රිය පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂිත පිරිවැයට පසුකාලීනව ගණනය කර ඇත. පොලී වියදම හා විදේශ විනිමය වාසි හෝ අවාසි ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගෙන ඇත. පිළිනොගැනීම නිසා වන වාසි හෝ අවාසි ද ලාභ හෝ පාඩු තුළ දක්වා ඇත.

**(ඇ) පිළිනොගැනීම**

**මූල්‍ය වත්කම්**

මූල්‍ය වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත් වූ විට හෝ මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයේ සියළු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සැලකිය යුතු ගනුදෙනුවක දී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලබාගැනීමේ අයිතිය සමාගම විසින් මාරු කරනු ලැබේ. මාරු කරන ලද හෝ සමාගම විසින් හිමිකාරිත්වයේ සියළු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙසස මාරු නොකරන හෝ රඳවා නොගන්නා අතර එය මූල්‍ය වත්කම් පාලනය නොකරයි.

සමාගම ගනුදෙනුවලට එළැඹෙමින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වත්කම් මාරු කරනවා වුවද මාරු කළ වත්කම් වල අවදානම් හා ප්‍රතිඵල සියල්ල සමස්තය ලෙස හෝ කොටසක් ලෙස රඳවා ගනී. මෙම තත්ත්වයන් තුළ මාරු කළ වත්කම් හඳුනා නොගැනේ.

**මූල්‍ය බැඳීම්**

ගිවිසුම්ගත බැඳීම් නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට සමාගම මූල්‍ය වගකීමක් හඳුනා ගනී. සමාගම විසින් එහි කොන්දේසි වෙනස් කරන විට සහ නවීකරණය කරන ලද වගකීම්වල මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ලෙස වෙනස්වන විට මූල්‍ය වගකීමක් අවලංගු කරයි. එම අවස්ථාවේ දී නවීකරණය කරන ලද නියමයන් මත පදනම් වූ නව මූල්‍ය වගකීමක් සාධාරණ වටිනාකමකින් හඳුනා ගැනේ.

මූල්‍ය බැරකමක් පිළිනොගන්නා අවස්ථාවක දී අවසන් ධාරණ අගය හා ගෙවූ මුදල (මාරු කළ මුදල් නොවන වත්කම් හෝ බැරකම් ඇතුළුව) අතර වෙනස ලාභ හෝ පාඩු වල හඳුනා ගැනේ.

**හිලව් කිරීම**

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කර මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශය දක්වා ඇත. දින වකවානු සහිතව එහි මුදල් පියවන සමාගමට දැනට ඇති නෛතික හිමිකමත් ශුද්ධ පදනම මත එම මුදල් පියවීමට අපේක්ෂා කිරීමත් හෝ වත්කම බේරා බැරකම එකවර ගෙවීමට ඇති හැකියාව එමගින් දක්වයි.

**පළුදු ප්‍රතිපත්තිය : 2018 ජනවාරි 1 දින සිට අදාළ වන - ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්**

**මූල්‍යමය උපකරණ හා කොන්ත්‍රාත් වත්කම්**

වෙළඳ ලැබීමට නියමිත දෑ වලට අදාළ ලාභ ප්‍රතිපාදන සර්වකාලීන අපේක්ෂිත ණය පාඩුව (ECL) මුදලට නිතරම ගණනය කෙරේ.

මූල්‍ය වත්කමක ණය අවදානම ඇස්තමේන්තු කිරීමේ දී හා මූලික හඳුනා ගැනීමේ සිට සැලකිය යුතු ලෙස වැඩි වී ඇති විටක අදාළ වන පරිදි සාධාරණ හා උපකාරී තොරතුරු අදාළ වන බවට හා අනවශ්‍ය වියදමක් හෝ වෑයමක් නොදරා ලබාගත හැකි බවට සමාගම සලකයි. මේ තුළ සමාගමේ ඓතිහාසික අත්දැකීම මත පදනම් වූ ණය තක්සේරුව හා ඉදිරි තොරතුරු ඇතුළත් ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු හා විමර්ශන යන දෙකම අඩංගු වේ.

මූල්‍ය වත්කමක ඇති ණය අවදානම දින 365කට වැඩියෙන් කල් ගතව ඇති අවස්ථාවක මූල්‍ය වත්කමක ඇති ණය අවදානම වැඩි වී ඇති බව සමාගම සලකයි.

පහත අවස්ථාවල දී මූල්‍ය වත්කම හිඟව ඇති බවට සමාගම විසින් සලකනු ලබයි.

- සමාගම වෙතම ණය බැඳීම පූර්ණව ගෙවීමට ණයගැතියාට නොහැකි වන අවස්ථාවක, ඇපය ලබා ගැනීම (තබා ඇති විටක) වැනි ක්‍රියාමාර්ග වලට සමාගම යොමු නොවීමඃ නැතහොත්
- මූල්‍ය වත්කම දින 180කට වඩා වැඩි කලක් ගතව ඇති විටක

යාවජීව අපේක්ෂිත ණය පාඩුව යනු මූල්‍ය උපකරණයක අපේක්ෂිත ආයු කාලය පුරා සිදු විය හැකි ආපසු නොගෙවීමේ සිදුවීම් වලින් හට ගන්නා අපේක්ෂිත ණය පාඩුව ය.

මාස 12 අපේක්ෂිත ණය පාඩුව යනු විය හැකි හිඟ ඇති වන තත්ත්වයන් තුලින් දන්වා සිටින දිනට පසුව මාස 12ක් තුළ ඇති වන අපේක්ෂිත ණය පාඩුවේ කොටසකි.

අපේක්ෂිත ණය පාඩුව ඇත්මේන්තු කිරීමේ දී සළකා බැලෙන උපරිම කාලසීමාව වන්නේ ණය අවදානමට සමාගම ලක්වන උපරිම කොන්ත්‍රාත්තුමය කාල සීමාවයි.

**අපේක්ෂිත ණය පාඩුව ගනනය කිරීම**

අපේක්ෂිත ණය පාඩු යනු ණය පාඩු වල ලාභදායිත්වය බර තැබූ ඇස්තමේන්තුවකි. ණය පාඩු සියළු මුදල් හිඟවල තථ්‍ය වටිනාකමට ගණනය කෙරේ. (උදා: සමාගම ලබා ගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ හා කොන්ත්‍රාත්වලට අදාළ මුදල් ප්‍රවාහ අතර වෙනස).

මූල්‍ය වත්කමේ සක්‍රිය පොලී අනුපාතයට අපේක්ෂිත ණය පාඩුව වට්ටම් කෙරේ.

**ණය පළුදු වූ මූල්‍ය වත්කම්**

එක් එක් දන්වා සිටින ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම් සමාගම තක්සේරු කිරීමට හා FVOCI හි ණය ඇප ණය පළුදු වීමට කටයුතු කෙරේ. සිදු වූ මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලන කෙරෙහි හානිකර බලපෑමක් ඇති වන සිදුවීම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් සිදු වන විටක මූල්‍ය වත්කමක් ණය පළුදු බවට පත් වේ.

පහත දැක්වෙන නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළුව මූල්‍ය වත්කමක ණය පළුදුවීම් සාක්ෂි:

- ණයගැතියා හෝ නිකුත්කරන්නා ගේ ප්‍රධාන මූල්‍ය ගැටළුව
- ගෙවීම් පැහැර හැරීමක් වැනි කොන්ත්‍රාත්තු උල්ලංඝනය කිරීමක් නැතහොත් දින 180ට අධික හිඟ මුදලක්
- සමාගම විසින් එය බලාපොරොත්තු නොවන කොන්දේසි මත ණයක් හෝ අත්තිකාරමක් ප්‍රතිව්‍යුහගත කිරීම
- ණයහිමියා බංකොලොත් බවට පත්වීම හෝ වෙනත් මූල්‍ය අපහසුතාවයකට පත්වීමේ හැකියාව: එසේ නැතහොත්
- මූල්‍ය අපහසුතා නිසා සක්‍රිය වෙළඳපොල නොමැතිවීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අපේක්ෂිත ණය පාඩුව සඳහා ප්‍රතිපාදන සැලසීම

මූල්‍ය වත්කම සඳහා වූ පාඩු දීමනා ක්‍රමක්ෂිත පිරිවැයට ගණනය කෙරෙන අතර වත්කම් වල ධාරණ අගයෙන් අඩු කෙරේ.

**ලියා හැරීම**

